# වාර්ෂික වාර්තාව 2013

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

# 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සංයුතිය සහ කාර්ය මණ්ඩලය

**කොමිෂන් සභාව**

ලලිත් වීරතුංග මහතා
*සභාපති*

අනූෂ පැල්පිට මහතා
*සාමාජික*

එස්. එස්. සහබන්දු මහතා
*සාමාජික*

ප්‍රසන්න ද සිල්වා මහතා
*සාමාජික*

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්ය මණ්ඩලය**

අනූෂ පැල්පිට මහතා
*අධ්‍යක්ෂ ජනරාල්*

**කොමිෂන් සභා කාර්යාලය**

ආර්.එස්. ගුණරත්න මහත්මිය
*කොමිෂන් සභාවේ වැඩබලන ලේකම්*

**පාලන, ආයතනික කටයුතු සහ මූල්‍ය ආර්ථික සහ නීති කටයුතු**

යූ.එච්.සී. ප්‍රියන්ත මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,*
*පාලන, ආයතන කටයුතු සහ මූල්‍ය*
*වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,*
*ආර්ථික සහ නීති කටයුතු*

**පාලන සහ ආයතනික කටයුතු අංශය**

ඊ.එල්.කේ.දිසානායක මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

ඩබ්.එල්.ඒ.කේ.ඒ. ගුණතිලක මහතා
*සහකාර අධ්‍යක්ෂ*

**මූල්‍යය අංශය**

එම්.කේ.ජයන්ත මහතා
*අධ්‍යක්ෂ*

ආර්.පී. අබයදීර මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

ඒ.එස්. හපුආරච්චි මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

**අනුකූලතා අංශය**

ආර්.එම්.ටී.කේ.පී.ලිවේරා මහත්මිය
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

එච්.පී .එච්.එම්. පතිරණ මහත්මිය
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

**තරංගකාරීත්ව අංශය**

එච්.ඩබ්.කේ. ඉන්ද්‍රජිත් මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

නිශාන්ත පළිහවඩන මහතා
*නියෝජ්‍ය අධ්‍යක්ෂ*

ශ්‍රීයානි මාවැල්ලගේ මහත්මිය
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

**නීති අංශය**

පී.සී.පී. මොරගොඩ මහත්මිය
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

ආර්.එස්. ගුණරත්න මහත්මිය
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

එල්.එස්.පී.රුද්‍රිගු මහත්මිය
*සහකාර අධ්‍යක්‍ෂ*

අයි.එන්.මැතිව් මහතා
*සහකාර අධ්‍යක්‍ෂ*

**වර්ණාවලි කළමනාකරණ අංශය**

එච්.පී. කරුණාරත්න මහතා
*අධ්‍යක්‍ෂ*

එල් ගනේෂ්මූර්ති මහතා
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

ඊ.එන්.පී.කේ රත්නපාල මහතා
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

එම්.සී.එම් ෆාරුක් මහතා
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

ජේ.ඒ.එස්.ගුණානන්ද මහතා
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය
*සහකාර අධ්‍යක්‍ෂ*

එම්.පී.ගුණසිංහ මහතා
*සහකාර අධ්‍යක්‍ෂ*

**ජාල අංශය**

ආර්.පී.එච්.කේ. රණතුංග මහතා
*අධ්‍යක්‍ෂ*

කේ.එස්.එම්. විශාකා මෙනවිය
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

අයි.එම්. ජවුසි මහතා
*සහකාර අධ්‍යක්‍ෂ*

එස්.ඊ. වාකීෂ්ධ මහතා
*සහකාර අධ්‍යක්‍ෂ*

**ප්‍රතිපත්ති ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය**

එම්.කේ. ජයසේකර මහතා
*අධ්‍යක්‍ෂ*

ආර්.එම්.ජේ.කේ.බී. රත්නායක මහතා
*නියෝජ්‍ය අධ්‍යක්‍ෂ*

**ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය**

ඩබ්.ඩී. ද අල්විස්
*අධ්‍යක්‍ෂ*

**අභ්‍යන්තර විගණන අංශය**

යූ.ඒ. සමරතුංග මහත්මිය
*ප්‍රධාන අභ්‍යන්තර විගණක*

# පටුන

1 පරිච්ඡේදය
9 විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විමසුමක්

2 පරිච්ඡේදය
17 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ආරම්භය, දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ සහ වගකීම්

3 පරිච්ඡේදය
23 වර්ණාවලි කළමනාකරණ අංශය

4 පරිච්ඡේදය
29 ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය

5 පරිච්ඡේදය
38 ජාල අංශය

6 පරිච්ඡේදය
42 විශේෂ ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය

7 පරිච්ඡේදය
45 ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය

8 පරිච්ඡේදය
47 තරඟකාරිත්ව අංශය

9 පරිච්ඡේදය
52 අනුකූලතා අංශය

10 පරිච්ඡේදය
56 නීති අංශය

11 පරිච්ඡේදය
58 පාලන සහ ආයතනික කටයුතු අංශය

12 පරිච්ඡේදය
75 අභ්‍යන්තර විගණන අංශය

13 පරිච්ඡේදය
77 මූල්‍යය අංශය

# වගුව


වගුව1.1 2013 දෙසැම්බර් දක්වා බලපත්‍රලාභී විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන් 9

වගුව 1.2 ග්‍රාහක සංඛ්‍යාව, වාර්ෂික වර්ධන අනුපාතය සහ දුරකථන ව්‍යාප්ත අනුපාතය 2000-2013 10

වගුව 1.3 ඇමතුම් කාලය 2011-2013 (මිනිත්තු මිලියන) 13

වගුව 1.4 අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහක වර්ධනය 2004-2013 14

වගුව 1.5 දුරකථන සහ විදුලි සංදේශ ජාල සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන (තාවකාලික) 15

වගුව 3.1 නිකුත් කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව 2012 -2013 25

වගුව 3.2 සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2012 -2013 25

වගුව 3.3 ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන 2012 -2013 25

වගුව 3.4 හඳුනාගත් නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග සංඛ්‍යාව 2012 -2013 26

වගුව 3.5 නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 2012 -2013 26

වගුව 4.1 දායක මුදල් ගෙවීම 2013 36

වගුව 5.1 ජාල අංශය පිළිබඳ සංඛ්‍යාලේඛන 2012-2013 39

වගුව 5.2 වෙන් කරන ලද කෙටි සංකේත අංක 2013 41

වගුව 8.1 දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන 2012 -2013 49

වගුව 8.2 ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම 2012 -2013 49

වගුව 8.3 ස්ථාවර සහ ජංගම දුරකථන කර්මාන්තයේශුද්ධ ලාභය / පාඩුව 2012 -2013 50

වගුව 11.1 ශ්‍රී.ලං.වි.සං.නි. කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණවලට සහභාගිවීම 62

වගුව 11.2 සඟරා සඳහා දායක මුදල් 2013 72

වගුව 11.3 පුස්තකාලය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ/වැඩමුළු 2013 73

වගුව 12.1 අභ්‍යන්තර විගණන වාර්තා 2013 76

වගුව 13.1 කොමිෂන් සභාවේ ආදායම 2012 -2013 78

වගුව 13.2 විදුලි සංදේශ බදු (රු'000) 2012-2013 79

වගුව 13.3 ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (රු'000) 2012-2013 79

# ප්‍රස්ථාර


ප්‍රස්ථාරය 1.1
11 ග්‍රාහක වර්ධනය 2002 -2013

ප්‍රස්ථාරය 1.2
12 වාර්ෂික ග්‍රාහක වර්ධන අනුපාතය 2000 -2013

ප්‍රස්ථාරය 1.3
12 දුරකථන ව්‍යාප්ත අනුපාතය 2000 -2013

ප්‍රස්ථාරය 1.4
14 අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහක වර්ධන අනුපාතය 2010-2013

ප්‍රස්ථාරය 8.1
50 සමස්ථ ආදායම සඳහා දායකවීමේ ප්‍රතිශතය 2012-2013

ප්‍රස්ථාරය 8.2
51 දුරකථන ක්‍රියාකාර සමාගම්වල ශුද්ධ ලාභය/පාඩුව 2012-2013

ප්‍රස්ථාරය 9.1
54 පාරිභෝගික පැමිණිළි නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය

# කෙටි යෙදුම් ලැයිස්තුව

**ACAD** - *Administration & Corporate Affairs Division*
*-පාලන සහ ආයතනික කටයුතු අංශය*

**AD** - *Active Directory*
*-ක්‍රියාකාරී නාමාවලිය/සහකාර අධ්‍යක්ෂ*

**ADSL** - *Asymmetric Digital Subscriber Line*
*-අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන*

**AGM** - *Annual General Meeting*
*-වාර්ෂික මහා සභා රැස්වීම*

**APT** - *Asia Pacific Telecommunity*
*-ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව*

**BOI** - *Board of Investment*
*-ආයෝජන මණ්ඩලය*

**CAPIC** - *Cabinet Appointed Project Implementation Committee*
*-අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටුව*

**CDMA** - *Code Division Multiple Access*
*-සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ*

**CEIEC** - *China National Electronic Imports and Exports Corporation*
*-චීනයේ ජාතික ඉලෙක්ට්‍රොනික් ආනයන සහ අපනයන සංස්ථාව*

**CID** - *Criminal Investigation Department*
*-අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව*

**CMA** - *Certified Management Accountant*
*-සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී*

**CMC** - *Colombo Municipal Council*
*-කොළඹ මහනගර සභාව*

**CTO** - *Commonwealth Telecommunication Organization*
*-පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය*

**DG** - *Director General*
*-අධ්‍යක්ෂ ජනරාල්*

**DMS** - *Department of Management Services*
*-කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව*

**DPM** - *Data Protection Manager*
*-දත්ත ආරක්ෂණ කළමනාකරු*

**ECL** - *Environment Conservation Levy*
*-පාරිසරික ආරක්ෂණ බද්ද*

**EDGE** - *Enhanced Data rates for Global Evolution*
*-ගෝලීය විකාශනය සඳහා වැඩිදියුණු කළ දත්ත අනුපාතය*

**FDI** - *Foreign Direct Investment*
*-විදේශීය සෘජු ආයෝජන*

**FTTH** - *Fibre to the Home*
*-ගෘහස්ථ තන්තු සම්බන්ධතා*

**GDP** - *Gross Domestic Product*
*-දළ දේශීය නිශ්පාදිතය*

**GHz** - *Giga Hertz*
*-ගිගා හර්ට්ස්*

**4 GLTE** - *4th Generation Long-Term Evolution*
*-4වන පරම්පරාවේ දිගු කාලීන විකාශනය*

**GMDSS** - *Global Maritime Distress Safety System*
*-ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්ෂණ පද්ධතිය*

**GPRS** - *General Packet Radio Service*
*-පොදු පැකට් ගුවන් විදුලි සේවා*

**HRC** - *Human Rights Commission*
*-මානව හිමිකම් කොමිෂන් සභාව*

**HRD** - *Human Resources Development*
*-මානව සම්පත් සංවර්ධන*

**HSPA** - *High-Speed Packet Access*
*-අධිවේගී පැකට් ප්‍රවේශ*

**ICT** - *Information and Telecommunications Technology*
*-තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය*

**ICTA** - *Information and Communication Technology Agency*
*-තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය*

**IMO** - *International Maritime Organization*
*-ජාත්‍යන්තර සමුද්‍රීය සංගමය*

**ISDB** - *Integrated Services Digital Broadcasting*
*-අනුකලන සේවා ඩිජිටල් විකාශන*

**ISDP-T** - *Integrated Services Digital Broadcast – Terrestrial*
*-අනුකලන සේවා ඩිජිටල් විකාශන-භෞමික*

**ITO** - *International Telecommunications Operator*
*-ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්*

**ITU** - *International Telecommunications Union*
*-ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය*

**JICA** - *Japanese International Cooperation Agency*
*-ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය*

**KIV** - *Korean IT Volunteers*
*-කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා*

**MoE** - *Ministry of Education*
*-අධ්‍යාපන අමාත්‍යාංශය*

**MSL** - *Mobile & fixed Subscribers Levy*
*-ජංගම සහ ස්ථාවර ග්‍රාහක බද්ද*

**NBI** - *National Broadband Initiative*
*-ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය*

**NIA** - *National Information Society Agency*
*-ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය*

**NIBM** - *National Institute of Business management*
*-ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය*

**NSF** - *National Science Foundation*
*-ජාතික විද්‍යා පදනම*

**PAYE** - *Pay As You Earn*
*-උපයන විට ගෙවීම*

**PC** - *Personal Computers/ Procurement Committee*
*-පෞද්ගලික පරිගණක/ප්‍රසම්පාදන කමිටුව*

**PCU** - *Project Consultancy Committee*
*-ව්‍යාපෘති උපදේශන කමිටුව*

**PIR & LAD** - *Policy International Relations & Licence Administration Division*
*-ප්‍රතිපත්ති ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය*

**PSTN** - *Public Switching Telephone Network*
*-පොදු ස්විචීකරණ දුරකථන ජාල*

**QoS** - *Quality of Service*
*-සේවා තත්ත්ව*

**REPO** - *(A Repurchase Agreement)*
*-ප්‍රතිගැනුම් ගිවිසුම*

**RF** - *Radio Frequency*
*-ගුවන් වීදුලි සංඛ්‍යාත*

**RTTE** - *Radio and Telecommunications Terminal Equipment*
*-ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ*

**SAARC** - *South Asian Association for Regional Co-operation*
*-කලාපීය සහයෝගීත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය*

**SAFIR** - *South Asian Forum for Infrastructure Regulation*
*-යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව*

**SATRC** - *South Asian Telecommunication Regulators' Council*
*-දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමය*

**SCCM** - *System Center Configuration Manager*
*-පද්ධති කේන්ද්‍රීය ආකෘති කළමනාකරු*

**SEARCC** - *The South East Asia Regional Computer Confederation*
*-අග්නිදිග ආසියානු කලාපීය පරිගණක සංසදය*

**SLT** - *Sri Lanka Telecom*
*-ශ්‍රී ලංකා ටෙලිකොම්*

**TDB** - *Telecommunication Development Bureau*
*-විදුලි සංදේශ සංවර්ධන කාර්යාංශය*

**TDC** - *Telecommunications Development Charge*
*-විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව*

**TEC** - *Technical Evaluation Committee*
*-තාක්ෂණික ඇගයීම් කමිටුව*

**UCSC** - *University of Colombo School of Computing*
*-කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක පාසැල*

**UMTS** - *Universal Mobile Telecommunications System*
*-විශ්වීය ජංගම විදුලි සංදේශ පද්ධති*

**UK** - *United Kingdom*
*-එක්සත් රාජධානිය*

**UNHCR** - *United Nations High Commissioner for Refugees*
*-එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය*

**USTTI** - *United States Telecommunications Training Institute*
*-ඇමරිකා එක්සත් ජනපද විදුලි සංදේශ පුහුණු ආයතනය*

**VAT** - *Value Added Tax*
*-එකතු කළ අගය මත බදු*

**VDSL** - *Very-high-bit-rate Digital Subscriber Line*
*-අධි උච්ච සංඛ්‍යාංක ග්‍රාහක රැහැන*

**WCIT** - *World Conference on International Telecommunications*
*-ජාත්‍යන්තර විදුලි සංදේශනය පිළිබඳ ලෝක සමුළුව*

**WiMAX** - *Worldwide Interoperability for Microwave Access*
*-ක්ෂුද්‍ර තරංග ප්‍රවේශ පිළිබඳ ලෝක ව්‍යාප්ත අන්තර් මෙහෙයුම්*

**WTISD** - *World Telecommunication and Information Society*
*-ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය*

**WTSA** - *World Telecommunication Standardization Assembly*
*-ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ සමුළුව*

පරිච්ඡේදය

1

# විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විමසුමක්

විදුලි සංදේශ ක්ෂේත්‍රය මෑත කාලීනව රටේ සංවර්ධන ක්‍රියාවලියේදී ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙම විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීමෙහිලා 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ස්ථාපනය කර ඇති අතර වර්තමානයේදී ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමයි. 1.1 වගුවේ දැක්වෙන පරිදි 2013 වර්ෂය අවසාන වන විට බලපත්‍රලාභී විදුලි සංදේශ පද්ධති ක්‍රියාකාර සමාගම් සංඛ්‍යාව 43 ක් පැවතුණි.

**බලපත්‍රලාභී විදුලි සංදේශ පද්ධති ක්‍රියාකාර සමාගම් -2013** (1.1 වගුව)

| සේවාවේ වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා | 3 |
| සෙලියුලර් ජංගම දුරකථන සේවා | 5 |
| දත්ත සන්නිවේදන (පහසුකම් පාදක කරගත්) සේවා | 6 |
| දත්ත සන්නිවේදන (පහසුකම් පාදක කර නොගත්) සහ අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් | 9 |
| දිගු දුර ජංගම ගුවන් විදුලි සේවා | 1 |
| බද්දට ගත් පරිපථ සැපයුම්කරුවන් | 1 |
| බලපත්‍රලාභී පේජෝන් සේවා සැපයුම්කරුවන් | 1 |
| බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන් | 10 |
| සෘජු ගෘහස්ථ චනද්‍රිකා විකාශන සේවා | 3 |
| කේබල් රූපවාහිනී විබෙදුම් ජාල සේවා | 4 |
| එකතුව | 43 |

ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා සැපයුම්කරුවන්ගේ තාක්‍ෂණයේ ක්‍ෂුද්‍ර තරංග ප්‍රවේශ පිළිබඳ ලෝක ව්‍යාප්ත අන්තර් මෙහෙයුම් : WiMAX – (Worldwide Interoperability for Microvawave Access), අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන (ADSL- Asymmetric Digital Subscriber Line) , අධි උච්ච සංඛ්‍යාංක ග්‍රාහක රැහැන 2 (VDSL2 – Very - high – bit- rate Digital Subscriber Line 2) සහ ගෘහස්ථ තන්තු සම්බන්ධතා (FTTH-Fiber –to-the- Home) අන්තර්ගත වේ. ජංගම තාක්‍ෂණයේ අන්තර්ගත වන්නේ 4වන පරම්පරාවේ දිගු කාලීන විකාශනය (4GLTE-4th Generation Long Term Evolution) , පොදු පැකට්ටු ගුවන් විදුලි සේවය (GPRS- General Packet Radio Service) , ගෝලීය විකාශනය සඳහා වැඩිදියුණු කළ දත්ත අනුපාතය (EDGE- Enhanced Data rates for Global Evolution), විශ්වීය ජංගම විදුලි සංදේශ පද්ධති (Universal Mobile Telecommunications System), අධිවේගී පැකට්ටු ප්‍රවේශ (HSPA-High Speed Packet Access) සහ අධිවේගී පැකට්ටු ප්‍රවේශ+(විකාශනයවූ අධිවේගී පැකට්ටු ප්‍රවේශ) (HSPA+(Evolved High Speed Packet Access) වලිනි ග්‍රාහකයන් සංඛ්‍යාවේ වෙනස්වීම, ග්‍රාහකයන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය සහ දුරකථන ඝනත්ව අනුපාතය 1.2. වගුවේ දක්වා ඇත.

2013 වර්ෂය අවසාන වන විට සාපේක්‍ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයන් මිලියන 2.7 ක් වන අතර සෙලියුලර් ග්‍රාහකයන් සංඛ්‍යාව මිලියන 20.3 කි. 2000-2013 කාලපරිච්ඡේදය තුළ ග්‍රාහකයන්ගේ අදාල වාර්ෂික වර්ධන අනුපාතය සහ දුරකථන ඝනත්ව අනුපාතය 1.2. වගුවේ දැක්වේ.

**2000-2013 ග්‍රාහකයන් සංඛ්‍යාව, ග්‍රාහකයන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය සහ දුරකථන ඝනත්ව අනුපාතය** (1.2 වගුව)

| වර්ෂය | ග්‍රාහක වර්ගය | | | වාර්ෂික වර්ධන අනුපාතය (%) | | | දුරකථන ඝනත්ව අනුපාතය (%) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ථාවර | ජංගම | ස්ථාවර සහ ජංගම | ස්ථාවර | ජංගම | ස්ථාවර සහ ජංගම | ස්ථාවර | ජංගම | ස්ථාවර සහ ජංගම |
| 2000 | 767,411 | 430,202 | 1,197,613 | 14.7 | 67.6 | 29.4 | 4.0 | 2.3 | 6.3 |
| 2001 | 827,195 | 667,662 | 1,494,857 | 7.8 | 55.2 | 24.8 | 4.4 | 5.6 | 8.0 |
| 2002 | 883,108 | 931,403 | 1,814,511 | 6.8 | 39.5 | 21.4 | 4.6 | 4.7 | 9.5 |
| 2003 | 939,013 | 1,393,403 | 2,332,416 | 6.3 | 49.6 | 28.5 | 4.9 | 7.2 | 12.1 |
| 2004 | 991,239 | 2,211,158 | 3,202,397 | 5.6 | 58.7 | 37.3 | 5.1 | 11.4 | 16.5 |
| 2005 | 1,243,994 | 3,361,775 | 4,605,769 | 25.5 | 52.0 | 43.8 | 6.3 | 17.1 | 23.4 |
| 2006 | 1,884,076 | 5,412,496 | 7,296,572 | 51.5 | 61.0 | 58.4 | 9.5 | 27.3 | 36.7 |
| 2007 | 2,742,059 | 7,983,489 | 10,725,548 | 45.5 | 47.5 | 47.0 | 13.7 | 39.8 | 53.5 |
| 2008 | 3,446,411 | 11,082,454 | 14,528,865 | 25.7 | 38.8 | 35.5 | 17.0 | 54.8 | 71.9 |
| 2009 | 3,435,958 | 14,264,442 | 17,700,400 | -0.3 | 28.7 | 21.8 | 16.8 | 69.0 | 86.6 |
| 2010 | 3,534,575 | 17,267,407 | 20,801,982 | 2.9 | 21.1 | 17.5 | 17.1 | 83.6 | 100.7 |
| 2011 | 3,608,932 | 18,319,447 | 21,928,379 | 2.1 | 6.1 | 5.4 | 17.3 | 87.8 | 105.1 |
| 2012 | 3,449,391 | 20,234,070 | 23,683,461 | -4.4 | 10.5 | 8.0 | 17.0 | 99.5 | 116.5 |
| 2013 | 2,706,787 | 20,315,150 | 23,021,937 | -21.5 | 0.4 | -2.8 | 13.2 | 99.2 | 112.4 |

*සටහන : සක්‍රීය ග්‍රාහකයන්ගේ නිර්වචනය 2013 ජනවාරි මාසයේදී සංශෝධනය කර ඇති*

2002 වර්ෂයේ  සිට ඉදිරි සෑම වර්ෂයකදීම ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව ස්ථාවර දුරකථන ග්‍රාහක සංඛ්‍යාවට වඩා වැඩිවී ඇත. ස්ථාවර දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 2008 වර්ෂයේදී වර්ධනයක් පෙන්නුම් කරන අතර පිළිවෙළින් 2009-2012 සහ 2013 වර්ෂවලදී දුරකථන ග්‍රාහක සංඛ්‍යාව හීන වී ඇත. 2013 වර්ෂයේදී ස්ථාවර දුරකථන සංඛ්‍යාව පැහැදිලි ලෙස හීන වී ඇත.

ජංගම දුරකථන සම්බන්ධයෙන්, 2000 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ ගොස් ඇත. ඇත්ත වශයෙන්ම මීට පෙර කාලපරිච්ඡේදය තුළ ජංගම දුරකථන ග්‍රාහකයන්ගේ ඝාතීය වර්ධනයක් (Exponential Growth) පෙන්නුම් කර ඇත. 2013 වර්ෂයට පෙර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ස්ථාවර රැහැන් රහිත සම්බන්ධතාවල සහ ජංගම සම්බන්ධතාවල අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සක්‍රීය ග්‍රාහකයන්ගේ වර්ගීකරණයට අදාළ නිර්නායකයන් සංශෝධනය කර ඇති බව සටහන් කළ යුතුය.

ස්ථාවර සහ දුරකථන ග්‍රාහක සංඛ්‍යාවේ වර්ධනය 1.1 සටහනේ ප්‍රස්ථාර ගත කර ඇත.

**ග්‍රාහක වර්ධනය 2000-2013** (1.1 ප්‍රස්ථාරය)




2000 - 2013 කාලපරිච්ඡේදය තුළ ග්‍රාහක වාර්ෂික වර්ධන අනුපාතය සලකා බැලීමේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය සඳහා පෙරදී ඉහළ දායකත්වයක් දක්වන ලද ස්ථාවර දුරකථනවලට වඩා ජංගම දුරකථන වර්ධන අනුපාතය නිරතුරුවම ඉහළ මට්ටමක පවත්නා බව පෙනී යනු ඇත. කෙසේවුවද මෑත කාලීනව වාර්ෂික ග්‍රාහක වර්ධන අනුපාතය හීනවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කර ඇත. 2000 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ සාමාන්‍යය වාර්ෂික ග්‍රාහක වර්ධන අනුපාතයේ ප්‍රවනතාවය 1.2 ප්‍රස්ථාරයේ පැහැදිලිව ප්‍රස්ථාර ගත කර ඇත. ග්‍රාහක වර්ධන අනුපාතය හීනවීමේ ප්‍රවනතාව ඉකුත් කාලපරිච්ඡේදය තුළ අඛණ්ඩව ශීඝ්‍ර වශයෙන් වර්ධනයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන හඬ සේවා සඳහා පවත්නා ඉල්ලුම සන්තෘප්ත ලක්ෂයකට ළඟාවීම මේ පිළිබඳ සංඥාවක් වනු ඇත.

එමෙන්ම මෙම ඉල්ලුම අඩුවීම හඬ සේවා අභිබවා වෙනත් අගය එකතු කළ සේවාවන් භාවිතා කිරීම කෙරෙහි පවත්නා කැමැත්ත පෙන්නුම් කරයි. දුරකථන ඝනත්ව අනුපාතය වෙනස්වීම (පුද්ගලයන් 100 කට ඇති දුරකථන සංඛ්‍යාව) 1.3. ප්‍රස්ථාරයේ දැක්වේ. 2000 වර්ෂයේදී හැර ජංගම දුරකථන ඝනත්ව අනුපාතය ස්ථාවර දුරකථනවලට වඩා අඛණ්ඩව ඉහළ ගොස් ඇත. නිර්නායකයන් සංශෝධනය නිසා ඇති වූ ප්‍රධාන බලපෑම ලෙස 2013 වර්ෂය තුළ ජංගම දුරකථන

සම්බන්ධතා ප්‍රමාණය පහළ යාමට හේතු වු නමුත් 2010 වර්ෂය වන විට රටේ ස්ථාවර හෝ ජංගම දුරකථන හිමි පුද්ගලයන්ගේ සාමාන්‍යය අනුව සියයට සියය දක්වා වැඩිවූ සංයුක්ත දුරකථන ඝනත්ව අනුපාතය (ස්ථාවර සහ ජංගම දුරකථන ඇතුළත්ව) 2010 වර්ෂයේ ආරම්භයේ සිට සියළුම ශ්‍රී ලාංකිකයන් සතු ජංගම දුරකථනයක සාමාන්‍ය මත, 2013 වර්ෂය අවසාන වන විට ජංගම දුරකථන ඝනත්ව අනුපාතය සියයට 99.2 ක් වේ. ස්ථාවර සහ ජංගම දුරකථනවලට අමතරව පොදු මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා රට පුරා පොදු දුරකථන කුටි රැසක් ස්ථාපනය කර ඇති අතර 2013 වර්ෂය අවසාන වන විට ස්ථාපනය කර ඇති එවැනි දුරකථන කුටි සංඛ්‍යාව 6870 කි.

**ග්‍රහකයන්ගේ වාර්ෂික වර්ධන අනුපාතය 2000-2013** (1.2 ප්‍රස්ථාරය)




**දුරකථන ව්‍යාප්ත අනුපාතය 2000-2013** (1.3 ප්‍රස්ථාරය)



වාචික සන්නිවේදනය සඳහා ජනගහනය විසින් දුරකථන භාවිතා කරන ප්‍රමාණයේ දර්ශකයක් වශයෙන් රටේ ඇමතුම් කාලය සැලකිය හැකිය. 2011-2013 කාලපරිච්ඡේදය තුළ ලැබෙන ඇමතුම් සහ පිටතට යැවෙන ඇමතුම් සඳහා ඇමතුම් කාලය පිළිබඳ අගයන් (ආසන්න වශයෙන් බිලියනයට වටයා ඇත) 1.3 වගුවේ දක්වා ඇත.

**2011-2013 ඇමතුම් කාලය (මිලියන මිනිත්තුව)** (1.3 වගුව)

| වර්ෂය | ලැබෙන ඇමතුම් | | | පිටතට යැවෙන ඇමතුම් | | | ලැබෙන ඇමතුම් සහ පිටතට යැවෙන ඇමතුම් |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | ජාත්‍යන්තර | දේශීය සහ ජාත්‍යන්තර | දේශීය | ජාත්‍යන්තර | දේශීය සහ ජාත්‍යන්තර | |
| 2011 | 37,684 | 1,978 | 39,662 | 37,249 | 694 | 37,943 | 77605 |
| 2012 | 41,579 | 2022 | 43,601 | 41,425 | 710 | 42,135 | 85736 |
| 2013 | 41,635 | 1,937 | 43,572 | 41,044 | 688 | 41,732 | 85304 |

දේශීය ඇමතුම්වල ඇමතුම් කාලය ජාත්‍යන්තර ඇමතුම්වල ඇමතුම් කාලයට වඩා ඉතා වැඩි බව 1.3 වගුවෙන් පැහැදිලි වේ. 2011 වර්ෂයේදී මුළු වාර්ෂික ලැබෙන දේශීය ඇමතුම් සහ පිටතට යැවෙන ජාත්‍යන්තර ඇමතුම්වල කාලය සාපේක්ෂ වශයෙන් මිලියන හතලිස් දහසක් වූ අතර 2012 සහ 2013 වර්ෂවලදී මිනිත්තු මිලියන හතලිස් හතර දහසක් වී ඇත. පිටතට යැවෙන ඇමතුම් සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී අදාළ සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් මිනිත්තු මිලියන හැත්තෑ අට දහසක් වූ අතර 2012 සහ 2013 වර්ෂවලදී එය අසූපන් දහසට වැඩි වී ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර වර්ධනයත් සමඟ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් සංඛ්‍යාව වර්ධනය වී ඇත. 2013 වර්ෂයේදී මුළු අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් සංඛ්‍යාව සියයට 59 කින් වර්ධනය වූ අතර අන්තර්ජාල ඝනත්වය (පුද්ගලයන් 100 ඇති අන්තර්ජාල සම්බන්ධතා ප්‍රමාණය) වැඩිවීම සියයට 10.6 විය. මෙය ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා වලට අනුගතව ජංගම අන්තර්ජාල සම්බන්ධතා ශීඝ්‍රයෙන් වර්ධනය කිරීමට සුවිශාල වශයෙන් සහාය විය. නිසි දත්ත පැකේජයක් රහිතව ජංගම දුරකථන ඔස්සේ අන්තර්ජාලයට සම්බන්ධ වන තැනැත්තන් මීට ඇතුළත් නොවන බැවින් ඉහත තක්සේරු කරන ලද ප්‍රමාණයට වඩා සත්‍ය අන්තර්ජාල ඝනත්වය සහ අන්තර්ජාලයට ප්‍රවේශ වන සංඛ්‍යාව බෙහෙවින් ඉහළ මට්ටමක් ගනී. වැඩිදුරටත් ඉහත ඇස්තමේන්තුගත දත්තවල සේවා ස්ථාන නැණසල මධ්‍යස්ථාන, පෞද්ගලික අන්තර්ජාල සේවා සපයන මධ්‍යස්ථාන මෙන්ම ගෘහස්ථ ස්ථාවර දුරකථන අන්තර්ජාල සම්බන්ධතා වැනි පොදු ප්‍රවේශ ස්ථාන විවිධවූ පරිහරණය කරන්නන්ට ප්‍රවේශ විය හැකි බවට නොසලකා තනි සම්බන්ධතාවයක් වශයෙන් සලකා බලා ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාලේඛන වලට අනුව 2013 වර්ෂයේදී අන්තර්ජාල ඝනත්වය 21.9 කි. අන්තර්ජාල ඝනත්වයේ වර්ධනය මගින් රට පුරා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා රජය මෙන්ම පෞද්ගලික අංශය විසින් දක්වන දායකත්වය පෙන්නුම් කරයි. වැඩිදුරටත් රටේ අන්තර්ජාල පරිහරණය කරන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2013 ජනවාරි මාසයේ සිට රජය විසින් අන්තර්ජාල සේවා මත බදු සියයට 20 සිට සියයට 10 දක්වා අඩු කර ඇත. අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් 1.4 වගුවේ දක්වා ඇත. මෙම 1.4 වගුවේ පෙනී යන පරිදි 2011 වර්ෂය වන විට ජංගම අධිවේගී අන්තර්ජාල සේවා භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව ස්ථාවර ග්‍රාහකයන් ඉක්මවා ඇත. ජංගම අධිවේගී අන්තර්ජාල සේවා සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන්ගේ වර්ධන අනුපාතය ස්ථාවර අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහක සංඛ්‍යාවට වඩා බෙහෙවින් වැඩි වී

ඇත. 2010 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහක වර්ධන අනුපාතය 1.4 වගුවේ ප්‍රස්ථාර ගත කර ඇත.

**2004-2013 අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ග්‍රාහකයන්ගේ වර්ධනය** (1.4 වගුව)

| වර්ෂය | ග්‍රාහක සංඛ්‍යාව | | | වර්ධන අනුපාතය | | |
|---|---|---|---|---|---|---|
| | ස්ථාවර | ජංගම අධිවේගී අන්තර්ජාල | ස්ථාවර සහ ජංගම අධිවේගී අන්තර්ජාල | ස්ථාවර | ජංගම අධිවේගී අන්තර්ජාල | ස්ථාවර සහ ජංගම අධිවේගී අන්තර්ජාල |
| 2004 | 93,444 | - | 93,444 | 9.3 | - | 9.3 |
| 2005 | 115,000 | - | 115,000 | 23.1 | | 23.1 |
| 2006 | 130,000 | - | 130,000 | 13.0 | | 13.0 |
| 2007 | 202,348 | - | 202,348 | 55.7 | | 55.7 |
| 2008 | 234,000 | - | 234,000 | 15.6 | | 15.6 |
| 2009 | 249,756 | 91,359 | 341,115 | 6.7 | | 45.8 |
| 2010 | 302,000 | 200,000 | 502,000 | 20.9 | 118.9 | 47.2 |
| 2011 | 359,000 | 485,000 | 844,000 | 18.9 | 142.5 | 68.1 |
| 2012 | 423,194 | 942,461 | 1,365,655 | 17.9 | 94.3 | 61.8 |
| 2013 | 507,845 | 1,664,003 | 2,171,848 | 20.0 | 76.6 | 59.0 |

**දුරකථන ව්‍යාප්ත අනුපාතය 2010-2013** (1.4 ප්‍රස්ථාරය)




ජංගම සහ ස්ථාවර ක්‍රියාකරුවන් විසින් තෙවන වර්ධනාත්මක සේවා (3G) සිව්වන වර්ධනාත්මක සේවා (4G) සහ ස්ථාවර අන්තර්ජාල සේවා ආවරණයේ ශීඝ්‍ර ව්‍යාප්තිය සලකා බලමින් අන්තර්ජාල ඝනත්වය වර්ධනයවීමේ ගම්‍යතාවය එළැඹෙන වර්ෂ වලදී අඛණ්ඩව සිදුවෙතැයි අපේක්ෂා කෙරේ.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශයේ (ICT) ප්‍රගමනයට සහ ප්‍රමුඛතාවය සාක්ෂාත් කර ගැනීමට වැදගත් වේ. ලෝක ආර්ථික සංසදය විසින් (WEF) සම්පාදනය කරන ලද ජාල අනුකූලතා දර්ශකය (NRI) අනුව 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාව 71 වන ස්ථානයේ පසුවූ අතර 2013 වර්ෂයේදී එය වැඩිදියුණුවී 69 වන ස්ථානයේ ශ්‍රේණිගතවී ඇත.

විදුලි සංදේශ අංශය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ අඛණ්ඩ වර්ධනය ජනතාවගේ දැනුම් මට්ටම ඉහළ නැංවීම තුළින් විදුලි සංදේශ සේවා ලබා ගැනීමේ පරතරය අවම කිරීමට බෙහෙවින් දායක වේ. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) වැනි ආයතන විසින් පවත්වන ලද වැඩසටහන්වලට අමතරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගීත්වය ඇතිව ක්‍රියාත්මක කරන පාසල සම්බන්ධීකරණය මගින් ප්‍රජාවට තොරතුරු සන්නිවේදන තාක්ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය සහ ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය මෙහි අවසානය කරා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇත.

දශක තුනකට ආසන්න කාලයක් පැවති යුධමය වාතාවරණය නිම වීමෙන් පසුව සාමය ප්‍රතිශ්ඨාපනය වීමත් සමඟ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ඉතා ශීඝ්‍ර වර්ධනයක් ඇති විය. 2009 වර්ෂයේ මැයි මාසයේදී වාර්ගික අරගලය අවසන්වීම නිසා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සිය ජාල ව්‍යාප්ත කිරීම සහ වැඩිදියුණු කිරීම කර ඇත. 2013 වර්ෂයේදී රට පුරා ව්‍යාප්ත සමස්ථ විදුලි සංදේශ කුලුණු සංඛ්‍යාව 6364 කි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2013 වර්ෂයේදී කොළඹ නගරයේ බහු කාර්යය විදුලි සංදේශ කුලුණක් ඉදිකිරීම ආරම්භ කර ඇත.

විදුලි සංදේශ අංශය රට තුළ විදේශීය සෘජු ආයෝජන (FDI) පිළිබඳ මූලික ඉලක්කය අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. මෙය 1.4 වගුවේ දක්වා ඇති අතර ලැබුණු මුළු විදේශීය සෘජු ආයෝජන වලින් විදුලි සංදේශ අංශය විසින් අන්තර්ග්‍රහණය කරන ලද විදේශීය සෘජු ආයෝජන 2012 සහ 2013 වර්ෂවලදී පිළිවෙලින් සියයට 18 සහ සියයට 26 ක් විය. යටිතල පහසුකම් සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන සම්බන්ධයෙන් මෙම අංශය විසින් අන්තර්ග්‍රහණය කරන ලද වටිනාකම 2012 වර්ෂයේදී සියයට 41 වන අතර 2013 වර්ෂයේදී එය සියයට 46 දක්වා වැඩි වී ඇත.

**දුරකථන සහ විදුලි සංදේශ ජාල සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන (තාවකාලික)** (1.5 වගුව)

| විෂයය | වර්ෂය | |
|---|---|---|
| | **2012** | **2013** |
| දුරකථන සහ විදුලි සංදේශ ජාල සඳහා විදේශීය සෘජු ආයෝජන | 242.080 | 359.765 |
| යටිතල පහසුකම් සහ වෙනත් සේවා සඳහා විදේශීය සෘජු ආයෝජන | 596.595 | 786.825 |
| යටිතල පහසුකම් සඳහා ලැබුණු විදේශීය සෘජු ආයෝජන ප්‍රතිශතය අනුව විදුලි සංදේශ අංශය සඳහා විදේශීය සෘජු ආයෝජන | 40.58 | 45.72 |
| ලැබුණු මුළු වාර්ෂික විදේශීය සෘජු ආයෝජන | 1,338.155 | 1,391.405 |
| ලැබුණු මුළු විදේශීය සෘජු ආයෝජනවල ප්‍රතිශතයක් ලෙස විදුලි සංදේශ අංශය සඳහා විදේශීය සෘජු ආයෝජන | 18.09 | 25.86 |

*(ඇමරිකානු ඩොලර් මිලියන)*

විදුලි සංදේශ අංශය ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංවර්ධනයෙහිලා සුවිශේෂී කාර්‍ය භාරයක් ඉටු කර ඇත. මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ සේවා කර්මාන්තයේ වර්ධනයේ වැඩි කොටසක් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීමට යොදා ගත හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ දත්ත වලට අනුව 2012 වර්ෂයේදී සියයට 7.9 ක්වූ තැපැල් සහ විදුලි සංදේශ අංශයේ වර්ධනය සංසන්දනය කිරීමේදී 2013 වර්ෂයේදී එය සියයට 11.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2013 වර්ෂයේදී දළ ජාතික නිශ්පාදිතය (GDP- Gross National Product) සඳහා මෙම අංශ දෙකේම දායකත්වය සියයට 2.0 ක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෑත කාලයේදී විදුලි සංදේශ කර්මාන්තය මගින් රැස් කරන ලද ගාස්තු සහ බදු මුදල් මගින් මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදල සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. 2012 සහ 2013 වර්ෂ වලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය කළ මුදල් පිළිවෙළින් බිලියන 37.5 සහ බිලියන 35.1 ක් විය.

ශ්‍රී ලංකාවට සිය නව්‍යතාවයෙන් සපිරි විදුලි සංදේශ කර්මාන්තය පිළිබඳව සතුටු විය හැකි අතර එය ඇතැම්විට සමහර සංවර්ධිත රටවල් හා සමානවීමකි. විදුලි සංදේශ සහ ඒ ආශ්‍රිත අංශවල ප්‍රවර්ධනය රටේ ආර්ථික වර්ධනයට සහ මුළුමනින්ම ජනගහනයේ සියළුම ජන කොටස්වල ජීවනෝපාය, ජීවන රටාව සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමට හේතු වනු ඇත.

පරිච්ඡේදය
2

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො.ස.)

## ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

### 2.1. ආරම්භය

ප්‍රධාන ප්‍රඥප්තිය වූ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම පිණිස නීතිගත කරන ලද 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම වාර්තාවේ පනත, යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

### 2.2. කොමිෂන් සභාව සහ කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාව වර්තමානයේදී කොමිෂන් සභා සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ. අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකුද වේ. සෙසු සාමාජිකයන් දෙදෙනා කොමිෂන් සභාවේ විධායක නොවන සාමාජිකයන් වන අතර පිළිවෙළින් නීති, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

2013 වර්ෂයේදී කොමිෂන් සභාව රැස්වීම් කීපයක් පවත්වා ඇති අතර කොමිෂන් සභාවේ නියාමන විෂයයන්, කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය, පරිපාලනමය කරුණු සහ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් සත්කාරකත්වය දක්වන ජාත්‍යන්තර නියාමන සම්මන්ත්‍රණ වෙනුවෙන් සත්කාරකත්වය දැක්වීම ඇතුළු පුළුල් කරුණු පරාසයක් සාකච්ඡාවට ගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය තීරණ ගැනීම / අනුමැතිය ලබා දීම සිදු කර ඇත.

## 2.3. දර්ශනය

විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණු වෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.

## 2.4. මෙහෙවර

කුසලතාවෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳපළෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගතහැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබා දීමට වගබලා ගැනීම.

### 2.4.1. මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගුකාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරිත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියාකිරීම තුළින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහල සන්නිවේදන තාක්‍ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

## 2.5.අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්‍ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

**2.5.1.** ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්‍යක්‍ෂමව සැපයීමට වගබලා ගැනීම.

**2.5.2.** සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

**2.5.3.** අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්කරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්‍ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**2.5.4.** විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරත තැනැත්තන් අතර ඵලදායි තරඟකාරිත්වයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

**2.5.5.** අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

**2.5.6.** අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්‍යක්‍ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

**2.5.7.** විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳව පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

**2.5.8.** ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම.

**2.5.9.**ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

## 2.6. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ නියාමන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීම සහ වැඩිවන තරඟකාරී වෙළඳපලේ අභියෝගවලට ප්‍රතිචාරීව විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්‍යක්ෂමව සහ ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට සහාය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම පහත දැක්වේ.

**2.6.1.** පනතේ විධිවිධාන සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි බලාත්මක කිරීම.

**2.6.2.** බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර සාධාරණ සහ තිරසාර තරඟකාරිත්වයක් පවත්වා ගැනීමට දිරිගැන්වීම.
දුරකථන ක්‍රියාකාර සමාගම් මහජන යහපත සහ අරමුණු සපුරන බව නිශ්චය කිරීම සඳහා තරඟකාරිත්වය පිරික්සීම.
ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇතිකිරීමට වගබලා ගැනීම.
විවෘත ප්‍රවේශය, අවහිරතා නැතිකිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් සහිත පොදු නීති රාමුවක් සකස් කිරීම.

**2.6.3.** මිල
දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකි බව යනාදිය සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.

**2.6.4.** පාරිභෝගික ආරක්ෂාව
මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිළි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී මහජන සහභාගීත්වය සහ පොදුවේ සාකච්ඡා කිරීම දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.

**2.6.5.** සමාජ නියාමනය
i. විශ්වීය ප්‍රවේශය / සේවා
ii. විශ්වීය ප්‍රවේශ /සේවා ග්‍රාමීය ප්‍රජාවට වැඩිහිටි ජනතාවට සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ලබාදීමට වග බලා ගැනීම.
iii. හදිසි අවස්ථාවන්ට සූදානමින් සිටීම.
iv. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.

**2.6.6.** අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම

i. වර්ණාවලි කළමණාකරනය

ii. අංකනය

iii. නීත්‍යානුකූල අවසරය ලබාදීම

iv. අවකාශ කොටස්

v. අන්තර්සම්බන්ධතාවය

vi. ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථානවලට ප්‍රවේශ වීම

vii. ප්‍රධාන ජාතික ජාලවලට ප්‍රවේශවීම

**2.6.7.** ගුණාත්මක විදුලි සංදේශ සේවා

පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලන සාධාරණ හා දරාගත හැකි පරිදි විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.

**2.6.8.** යහපාලනය ප්‍රවර්ධනය කිරීම

ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිලිපදිමින් කාලෝචිත තීරණ ලබා දීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වගබලා ගැනීම.

**2.6.9.** සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වගබලා ගැනීම.

**2.6.10.** සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.

**2.6.11.** ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාළ ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්‍ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීම.

## 2.7. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්‍ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්‍යයන් ඉටු කරයි.

**2.7.1.** බලපත්‍ර සඳහා අයදුම්කිරීමේ පරිපාටිය සහ බලපත්‍ර නිකුත් කිරීම

**2.7.1.1.** පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය

පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

**2.7.1.2.** පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චිකිරීම සඳහා බලපත්‍රය

විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.

**2.7.1.3.** පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර
පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

**2.7.2.** අයක්‍රම නියාමනය කිරීම

**2.7.2.1.** පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අය ක්‍රම හෝ අය ක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

**2.7.2.2.** පනතේ 5 (ඕ) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/ නිශ්චය කිරීම.

**2.7.3.** විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුළත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.

**2.7.4.** ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම.

**2.7.5.** පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන /පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.
පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවය පිළිබඳව විදුලි සංදේශ සේවයේ දායකයකු හෝ මහජනයා අතුරෙන් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍ය යයි කොමිෂන් සභාව සළකන විමර්ශනයක් කොමිෂන් සභාව පැවැත්විය හැකි අතර කාරණයට අදාළ අවස්ථාගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය.

පනතේ 9 (2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතුවූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍ය යයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම්වලට නියම කළ හැකි අතර අදාළ පරිදි මූල්‍ය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

**2.7.6.** විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරිගැන්වීම.

**2.7.7.** විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / ජාත්‍යන්තර සහ විදේශීය ආයතනවල කටයුතුවලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.

**2.7.8.** කොමිෂන් සභාව විසින් නියෝග උපදෙස් හා තීරණ නිකුත් කිරීම සහ එහිදී විනිවිද පෙනෙන ක්‍රියාවලියක් අනුගමනය කිරීම. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළුවලට සහභාගිවීමේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට පාරිභෝගිකයන්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබාදීම.

**2.7.9.** විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්‍ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

ඉහත සඳහන් කාර්‍යයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශ / ඒකක මගින් ඉටු කරන ලදී. 2013 වසරේ කොමිෂන් සභාවේ විවිධ අංශ / ඒකකවල කාර්යයන් සහ ඒවායේ කාර්යසාධනය මතු දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම / ක්‍රියාකාරකම් කිසියම් අංශයක් / ඒකකයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම / ක්‍රියාකාරකම් අදාළ අංශය / ඒකකය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශ /ඒකකවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# වර්ණාවලි කළමනාකරණ අංශය

පරිච්ඡේදය

3

## සමාලෝචනය

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය විදුලි සංදේශනය, විකාශනය, ආරක්ෂක කටයුතු සහ විද්‍යාත්මක පර්යේෂණ සහ මීට අමතරව සමාජ සේවා, නීති බලාත්මක කිරීම, අධ්‍යාපනය, සෞඛ්‍යය ආරක්ෂාව, ප්‍රවාහනය වැනි සෙසු සමාජ ආර්ථික ක්‍රියාකාරකම්හී සෘජුවම භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රටේ ඉහළ ආර්ථිකමය වටිනාකමකින් යුත් ප්‍රධාන ස්භාවික සම්පතක් වේ.

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම වෙනත් ගුවන් විදුලි පද්ධති වලට අවහිරතාවයන් ඇතිකිරීමෙන් තොරව ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සහ සේවා කාර්‍යක්‍ෂමව ක්‍රියාකරවීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය පරිපාලනමය සහ තාක්‍ෂණික පටිපාටිවල සුසංයෝගයකි. ගුවන් විදුලි සංඛ්‍යාතවල කාර්‍යක්‍ෂමතාවය උපරිම කිරීම සහ බාධාවන් අවම කිරීම ගුවන් විදුලි සංඛ්‍යාත කළමනාකරණ අංශයේ අරමුණ වේ.

ගුවන් විදුලි සංඛ්‍යාත කළමනාකරණ අංශය ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්‍යක්‍ෂමව පරිපාලනය කිරීමෙහිලා වගකියනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ වගකීම් ඉටු කිරීමෙහිලා වර්ණාවලි කළමනාකරණ අංශය විසින් 2011 වර්ෂයේදී සිදු කළ කාර්යයන් පහත දැක්වේ.

### 3.1. කාර්යයන්

- ජාත්‍යන්තර ගුවන් විදුලි රීති සහ ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව සංඛ්‍යාත පරාස වෙන් කිරීම.
- සාධාරණ, අපක්‍ෂපාතී සහ විනිවිද පෙනෙන පටිපාටියක් අනුව සංඛ්‍යාත වෙන් කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතය සැලසුම් කිරීම, නියාමනය කිරීම සහ පරිපාලනය කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සහ රටට අයත් චන්ද්‍රිකා කක්ෂ භාවිතා කිරීම පාලනය කරන රීති, තාක්‍ෂණික පරාමිතීන් සහ ප්‍රමිති ස්ථාපනය කිරීම.
- ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා තාක්‍ෂණික ප්‍රමිති නියම කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය රටේ සමාජීය ආර්ථිකමය ඉලක්කවලට අදාළ වැදගත්කම මත විවිධ සේවා සඳහා ප්‍රමාණවත් පරිදි සැපයීම පිණිස කළමනාකරණය කිරීම.
- සෙසු පරිහරණය කරන්නන් සඳහා අවම බාධාවන් සහතික කිරීම පිණිස ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම නියාමනය කිරීමේ අරමුණින් පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම.
- ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) සඳහා මාදිලි අනුමැතිය ලබා දීම.
- ගුවන් විදුලි සන්නිවේදන මධ්‍යස්ථාන බලපත්‍රයේ නියම කරන ලද තාක්‍ෂණික ප්‍රමිති සහ පරාමිතීන්ට අනුකූලව සිය මෙහෙයුම් සිදු කරන බව තහවුරු කිරීම පිණිස බලපත්‍රයට අනුකූලව විමර්ශන පැවැත්වීම.

- දේශීය සහ ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම පිළිබඳ සහයෝගීත්වය පවත්වා ගැනීම.
- එළැඹෙන තාක්‍ෂණයන්ට සහ නව සේවාවන්ට පහසුකම් සැපයීම පිණිස නව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි අවකාශ සැපයීම සඳහා පැරණි ගුවන් විදුලි සන්නිවේදන සේවා ක්‍රමානුකූලව ඉවත් කර ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නැවත වෙන් කිරීම.
- අවහිරතාවයන් රහිත අවසරලත් විමෝචනයන් භාවිතා කිරීම සහ අනුකූලතාවය පරීක්‍ෂා කිරීම සහ අවහිරතාවයන්වල මූලාරම්භය අනාවරණය කර ගැනීම සහ හඳුනා ගැනීම මෙන්ම ඒවා නිරාකරණය කිරීම.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු රැස් කිරීම.
- ආධුනික ගුවන් විදුලි සහ ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්‍ෂණ පද්ධතිය (GMDSS) පිළිබඳ විභාග පැවැත්වීම.

විදුලි සංදේශ පනතේ 22 වැනි වගන්තිය ප්‍රකාරව (2.7.1.2. බලන්න) ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් භාවිතා කරන කිසියම් තැනැත්තෙකුට ඒ සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් තිබිය යුතුවේ. අන්‍යාකාරයකින් නිශ්චිත සඳහනක් තිබෙන අවස්ථාවක හැර බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුව ගාස්තුවක් ගෙවීමෙන් පසු බලපත්‍රය නිකුත් කරනු ලැබේ. බලපත්‍රය සමඟ බලපත්‍ර කොන්දේසි නිකුත් කරනු ලැබේ. කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් විය හැකිය. කිසියම් කොන්දේසියක් කඩ කරනු ලැබූ අවස්ථාවක උපකරණය මුද්‍රා තැබීමට සහ බලපත්‍රය අවලංගු කිරීමට ශ්‍රී.ල.වි.ස.නි. කොමිෂන් සභාවට බලය තිබේ.

සේවා වර්ගය අනුව විවිධ පරාස සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය බෙදා වෙන් කරනු ලැබේ. ගුවන් විදුලි තරංගවල ගති ලක්‍ෂණ, උපකරණ හා යෙදුම් ක්‍රමලේඛවල තාක්ෂණික පරාමිතීන් අනුව සේවාවන් එකිනෙකට වෙනස් වේ. එබැවින් වර්ණාවලි කළමනාකරණ අංශයේ කාර්යයන් සේවා කාණ්ඩ කිහිපයකට බෙදා වෙන් කර ඇත.

ඕනෑම ගුවන් විදුලි සංඛ්‍යාත උපකරණයක් ආනයනය කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි. කොමිෂන් සභාවේ අවසරය (නිෂ්කාශනය) ලබා ගත යුතුවේ. නිෂ්කාශන ලිපිය නිකුත් කිරීමට පෙර උපකරණය නියමිත ප්‍රමිතීන්ට අනුකූල වන බවට හා උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි. කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සංඛ්‍යාතයක් තිබෙන බවට වර්ණාවලි කළමනාකරණ අංශය වග බලා ගනී. මෙමගින් නීතිවිරෝධී සංඛ්‍යාත භාවිතය හා වර්ණාවලිය භාවිතා කරන බලපත්‍ර ලාභීන්ට සිදුවන ගුවන් විදුලි අවහිරතා අවම කෙරේ.

කෙසේ වෙතත් සිය සම්ප්‍රේෂණවලට අවහිරතා ඇතිවන අවස්ථාවලදී භාවිතා කරන්නන්ගෙන් වර්ණාවලි කළමනාකරණ අංශය වෙත පැමිණිලි ලැබේ. අවහිරතාවල මූලය හඳුනා ගැනීමට සහ අදාළ වන විසඳුම් සඳහා ක්‍රියාමාර්ග ගැනීමට ක්‍රම සකස් කර තිබේ.

### 3.2. කාර්යසාධනය

2013 වසර තුළ නිකුත් කරන ලද සංඛ්‍යාත හා බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම අවහිරතා පැමිණිලි සහ වර්ණාවලි කළමනාකරණ අංශය විසින් හඳුනාගනු ලැබූ අනවසර භාවිතා කරන්නන් පිළිබඳව සංඛ්‍යාලේඛන පහත දැක්වේ. එමෙන්ම 2012 වර්ෂයේ දත්ත සන්සන්දනය කිරීමේ පහසුකම් සැපයීම පිණිස අදාළ වගු අන්තර්ගත වේ.

### 3.2.1. සංඛ්‍යාත වෙන් කිරීම

**නිකුත් කරනු ලැබූ මුළු සංඛ්‍යාත සංඛ්‍යාව 2011 -2012** (3.1. වගුව)

| සේවා වර්ගය | සංඛ්‍යාත සංඛ්‍යාව | |
|---|---|---|
| | 2012 | 2013 |
| ස්ථාවර සේවාව | 4810 | 4342 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 103 | 02 |
| සෙලියුලර් ජංගම දුරකථන සේවාව | 0 | 01 slot (LTE) |
| දත්ත සහ ගුවන් විදුලි දුරවේදනය | 33 | 04 / 03 |
| ගුවන් සහ සමුද්‍ර සේවා<br>*i.* සමුද්‍ර ජංගම සේවා<br>*ii.* ගුවන් ජංගම සේවා | <br>16<br>02 | <br>03<br>02 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 17 | 24 |

### 3.2.2. සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම

**සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2012-2013** (3.2. වගුව)

| සේවා වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව | |
|---|---|---|
| | 2012 | 2013 |
| ස්ථාවර සේවාව | 59 | 36 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 43 | 25 |
| සෙලියුලර් ජංගම දුරකථන සේවාව | 5 | 5 |
| ට්‍රන්කින් / පේජින් / සිටිසන් බෑන්ඩ් | 9 | 10 |
| දත්ත සහ ගුවන් විදුලි දුරවේදනය | 38 | 10 /11 |
| ගුවන් හා සමුද්‍ර සේවාව<br>*i.* ගුවන් යානා මධ්‍යස්ථාන<br>*ii.* නැව් මධ්‍යස්ථාන<br>*iii.* සමුද්‍ර ජංගම<br>*iv.* ගුවන් ගමන් ජංගම | <br>75<br>73<br>45<br>03 | <br>80<br>79<br>101<br>02 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 208 | 189 |
| චන්ද්‍රිකා බලපත්‍රය (නව බලපත්‍ර බලපත්‍ර අළුත් කිරීම) | 21 | 18 |
| ආධුනික ගුවන් විදුලි | | 11 |

### 3.2.3. ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන

**ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන 2012 -2013** 3.3. වගුව

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | 2012 | 2013 | 2012 | 2013 |
| රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය | 12 | 05 | 12 | 05 |
| වෙනත් සේවාවන් | 68 | 34 | 68 | 34 |

### 3.2.4. සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන්නන් හඳුනාගැනීම

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන අය හඳුනා ගැනීම සඳහා විශේෂ සංඛ්‍යාත පිරික්සුම් උපකරණ භාවිතා කරනු ලැබේ. මේ කාර්යය සඳහා නිර්මාණය කරන ලද විශේෂ රථවල මෙම උපකරණ සවිකර තිබේ. 2013 වර්ෂයේදී හඳුනාගන්නා ලද සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන්නන් සංඛ්‍යාව 3.4. වගුවේ දැක්වේ.

**හඳුනාගත් සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග 2012-2013** (3.4. වගුව)

| වර්ගය | හඳුනාගත් නීති භාවිතා විරෝධී කරන්නන් සංඛ්‍යාව | | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| | 2012 | 2013 | |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 03 | 01 | සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැළැක්වීමට පියවර ගන්නා ලදී |
| වෙනත් සේවාවන් | 02 | 0 | |

### 3.2.5. රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම

**නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 2012 -2013** (3.5.වගුව)

| සේවා වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව | |
|---|---|---|
| | 2012 | 2013 |
| සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවාව | 1075 | 985 |
| විකාශන සේවාව (රූපවාහිනී හා ගුවන් විදුලි) | 179 | 441 |
| සෙලියුලර් ජංගම සේවාව | | |
| *i.* වෙළඳ බලපත්‍ර | 5381 | 4039 |
| *ii.* ජංගම ක්‍රියාකරුවන් | 1321 | 1090 |
| *iii.* ට්‍රන්කින් / පේජින් /සිටිසන් බෑන්ඩ් | 27 | 24 |
| *iv.* පෞද්ගලික ජංගම ගුවන් විදුලි | 663 | 564 |
| ගුවන් සහ සමුද්‍රිය සේවා | | |
| *i.* ගුවන් මධ්‍යස්ථානය | 23 | 28 |
| *ii.*නැව් මධ්‍යස්ථානය | 31 | 10 |
| *iii.* සමුද්‍රිය ජංගම | 147 | 105 |
| *iv.* ගුවන් ජංගම | 27 | 12 |
| *v.* ගුවන් ගමන් හැසිරවීම | 02 | 03 |
| *vi.* විවිධ (ගෝලීය ස්ථානීය පද්ධතිය,)* | 95 | 250 |
| දත්ත සේවාව | 368 | 108 / 07 |
| චන්ද්‍රිකා සේවාව | 893 | 1100 |
| ආධුනික ගුවන් විදුලි සේවාව | 28 | 15 |
| අඩු බලැති උපකරණ | 661 | 800 |

### 3.2.6. සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම සහ විමර්ශනය

- පිරික්සුම් අංශය විසින් විදුලි සංදේශ උපකරණ නිසි පරිදි පරිහරණය නොකිරීම නිසා ඇතිවන බාධාවන් ඉවත් කිරීම සඳහා විමර්ශන කටයුතු සිදු කරයි. මෙම විමර්ශන ජංගම පිරික්සුම් වාහන සහ පිරික්සුම් මධ්‍යස්ථාන භාවිතා කරමින් සිදු කරනු ලැබේ. කොළඹ, කදිරාන, මහනුවර, යක්කල, කටුබැද්ද සහ බණ්ඩාරගම ප්‍රදේශවල මෙහෙයුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. 2013 වර්ෂයේදී මෙම අංශය වෙත අවහිරතා පිළිබඳ පැමිණිලි හතළිහක් (40) ලැබී ඇති අතර ඒ අතරින් පැමිණිලි තිස් හතක් (37) සඳහා විසඳුම් ලබා දී ඇත.






*වාහනය තුළ ඇති පිරික්සුම් උපාංග සහ උපකරණ සවිකර ඇති ආකාරය*

- පිරික්සුම් තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන්

2013 වර්ෂයේදී පහත සඳහන් ප්‍රදර්ශනයන්හිදී පිරික්සුම් වාහන ප්‍රදර්ශනයට තබා ඇති අතර ඉදිරිපත් කිරීම් කරන ලදී.

- දම්සි - නාත්තන්ඩිය
- දැයට කිරුළ- අම්පාර
- ජාත්‍යන්තර පාසල - කොළඹ 05
- ඉන්ෆොටෙක් 2013 - කොළඹ 01
- ආරක්ෂක පාසල - කොළඹ 04
- නාවික සහ සමුද්‍රීය විද්‍යායතනය- ත්‍රිකුණාමලය

මෙම වැඩසටහන් විශේෂයෙන් ශිෂ්‍යයන්ට මෙන්ම සෙසු ජනතාවට ගුවන් විදුලි සන්නිවේදනය සහ පිරික්සුම් තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප අවබෝධ කර ගැනීමට බෙහෙවින් උපකාරී වේ.





*ජංගම පිරික්සුම් වාහන සහ ප්‍රදර්ශන භූමියේ උපකරණ (ඇන්ටනා) සවිකර ඇති ආකාරය*

### 3.3. තාක්ෂණ ප්‍රවර්ධනයන්

අධිවේගී දත්ත ප්‍රවේශ සඳහා පවත්නා ඉල්ලුමේ අඛණ්ඩ වර්ධනය සහ තාක්ෂණයේ වැඩිදියුණුවීම සමඟ පවත්නා පරතරය සම්පූර්ණ කිරීම පිණිස බලැති තාක්ෂණයක් වශයෙන් අභ්‍යන්තර පරිණාම තාක්ෂණය හඳුනාගැණිනි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දිගුකාලීන පරිණාම තාක්ෂණයන් සඳහා ගෙගාහර්ට්ස් 1.8 සහ ගෙගාහර්ට්ස් 2.3 සංඛ්‍යාත පරාස භාවිතා කිරීම පිණිස ස්ථාවර විදුලි සංදේශ ක්‍රියාකාර සමාගමක් සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගමක් සඳහා නව සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කර ඇත.

### 3.4. ශ්‍රී ලංකාවේ ඇනලොග් රූපවාහිනී ඩිජිටල් රූපවාහිනී දක්වා මාරුවීම

ශ්‍රී ලංකාවේ ඇනලොග් රූපවාහිනී ඩිජිටල් භෞමික රූපවාහිනී බවට මාරුකිරීමේ නිර්නායකයන් සකස් කිරීමට මුල පුරන ලද්දේ වර්ණාවලි කළමනාකරණ අංශය විසිනි.

ලෝකයේ බොහෝ රටවල් මෙන්ම විශේෂයෙන්ම අපගේ කලාපයේ රටවල් විසින් පිලිගත් වැඩිදියුණු කළ ඩිජිටල් විකාශන සේවා -භෞමික (Integrated Services Digital Broadcast – Terrestrial) සේවා ප්‍රමිති ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණ සම්ප්‍රේෂණයන් ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනයේ සහාය මත සිදු කෙරේ. අමාත්‍ය මණ්ඩලය විසින් ඩිජිටල් රූපවාහිනී විකාශන සඳහා ශ්‍රී ලංකාවේ පිලිගන්නා වැඩිදියුණු කළ ඩිජිටල් විකාශන සේවා -භෞමික (Integrated Services Digital Broadcast – Terrestrial) සේවා ප්‍රමිති සඳහා, 2014 වර්ෂය ආරම්භයේදී අනුමැතිය ලබා දීමට අපේක්ෂා කරයි.

පරිච්ඡේදය

4

# ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය

**සමාලෝචනය**

මෙම අංශය මීට පෙර ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශය සහ බලපත්‍ර පරිපාලන අංශය යනුවෙන් අංශ දෙකක් වශයෙන් පැවතිණි. පසුව මෙම අංශ දෙක ඒකාබද්ධ කර ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන (PIR&LAD) වශයෙන් නව අංශය ස්ථාපනය කරන ලදී. කෙසේවුවද මෙම ඒකාබද්ධ කිරීමෙන් පසුව මෙම අංශ දෙකේ කාර්‍යභාරයන් අඩු වැඩි වශයෙන් මෙම නව අංශය විසින් ඉටු කරයි.

ජාතික නියාමන නියෝජිතායතනය වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කරන අතර මෙම ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය විදුලි සංදේශ පනත ප්‍රකාරව විවිධ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙහිලා කොමිෂන් සභාවට සහාය වේ. විදුලි සංදේශනය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන් පිළිබඳ නව තාක්ෂණයන් භාවිතා කිරීම සහ සංවර්ධනය කිරීමෙහිලා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් අරමුණක් වන අතර ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය මෙම අරමුණ සාක්ෂාත් කිරීම පිණිස විශ්ව විද්‍යාල සම්බන්ධ කර ගනිමින් අදාළ පර්යේෂණ අධ්‍යයන සැලසුම් කිරීම සහ සංවිධානය කිරීමේ නිරත වේ. එමෙන්ම මෙම අංශය විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජිකයන් සහ පාර්ශවකරුවන්ගේ සහයෝගීත්වයෙන් පුළුල් පරාසයකින් යුතුව විදුලි සංදේශ අංශයේ සංවර්ධන ව්‍යාපෘති සිදු කරනු ලැබේ. එමෙන්ම එමගින් ව්‍යාපෘති සැලසුම් තුළින් ජාත්‍යන්තර වශයෙන් ප්‍රශස්ත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිණිස සහාය ලබා දෙයි. බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම සහ සංශෝධනය කිරීමේ කාර්යයන් මෙම අළුතින් ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය යටතේ සිදු කරයි.

මෙම අංශයේ කාර්‍යයන් සහ කාර්යසාධනය පහත දැක්වේ.

## 4.1. කාර්යයන්

- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීම.
- විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහයෝගීත්වය ඇතිව පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම.
- ව්‍යාපෘති.
- විවිධ ජාත්‍යන්තර සංවිධානවලදී කොමිෂන් සභාවේ සහභාගීත්වය සම්බන්ධීකරණය කිරීම. (නිදඃ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - (ITU) ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) කලාපීය සහයෝගීත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය (SAARC)

- ජාත්‍යන්තර සංවිධාන වලින් කොමිෂන් සභාව වෙත ලැබෙන තොරතුරු බෙදාහැරීම.
- ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන ජාත්‍යන්තර සංවිධානවලට අවශ්‍ය කරන පරිදි ශ්‍රී ලංකාව තුළ හා කොමිෂන් සභාව තුළ ඒකරාශීවන තොරතුරු සම්බන්ධීකරණය කිරීම.
- ජාත්‍යන්තර සංවිධානවලට අවශ්‍ය තොරතුරු සැපයීම.
- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව නව බලපත්‍ර නිකුත් කිරීම, බලපත්‍ර අළුත් කිරීම සහ බලපත්‍ර සංශෝධනය කිරීමට අදාල කටයුතු කළමනාකරණය කිරීම.
- තාක්ෂණික, ආර්ථික, නීති සහ පාරිභෝගික අංශ සම්බන්ධීකරණය මගින් ආයෝජකයන්ගේ ව්‍යාපාරික සැලසුම් ඇතුළු බලපත්‍ර කාර්යයන් තක්සේරු කිරීම.

### 4.2. කාර්ය සාධනය

#### 4.2.1. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 5 (ම) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් අතර එක් කාර්යයක් වන්නේ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ පර්යේෂන ආයතනවල විදුලි සංදේශ කටයුතු ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ක්‍රියාකරුවන්ගේ සහයෝගයෙන් හෝ අන්‍යාකාරයෙන් ප්‍රවර්ධනය කිරීම වේ.

1. සංඥා භාෂා අර්ථ වින්‍යාසකය (Sign Language Interpreter-SLI)- ඉන්ජිනේරු පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය




2. කුඩා පරිමාණ ගුවන් විදුලි සංඛ්‍යාත (RF) රැස් කිරීමේ ඒකකය නිර්මාණය කිරීම - ඉන්ජිනේරු පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය



මෙම පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතින අතර 2014 වර්ෂයේදී අවසන් වාර්තාව නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.
ගෙගාහර්ට්ස් 8 දක්වා සූක්ෂ්ම තරංග මැනීම සඳහා අඩු පිරිවැය මැනුම් සැලැස්මක් සංවර්ධනය කිරීම - පේරාදෙනිය විශ්ව විද්‍යාලය

### 4.2.2. විශේෂ අවශ්‍යතා සහිත / අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය-ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව e-NABLE ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා සැලසුම් කළ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධන වැඩසටහන 2012 වර්ෂයේදී පවත්වන ලදී.

මෙම වැඩසටහන යටතේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් සැපයීම පිණිස ත්‍රිකුණාමලය, මඩකලපුව, අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, කල්මුණේ, කොළඹ සහ කෑගල්ල දිස්ත්‍රික්කවල විශේෂ පාසල්, පාසල් විශේෂ අධ්‍යාපන ඒකක සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හැටක් පමණ තෝරා ගැණිනි. මෙම වැඩසටහන රජයේ විශේෂ ව්‍යාපෘතියක් වන දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පවත්වන ලදී. මෙම මධ්‍යස්ථාන සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරයි.

එමෙන්ම බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල සහයෝගීත්වය ඇතිව සහනදායී අන්තර්ජාල අයකුම පැකේජයක් හඳුන්වාදී ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) විශේෂ ඉල්ලීමකට අනුව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා පහත සඳහන් අනුග්‍රහයන් ලබා දී ඇත.

- ඩේසි ලංකා පදනමේ සහාය ඇතිව අන්ධ තැනැත්තන් සඳහා සිංහල භාෂකය මෘදුකාංගය වැඩිදියුණු කිරීම සහ ඒවා ශ්‍රී ලංකාවේ අන්ධ පාසල් සහ මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීම.
- ඩක්ස්බරි බ්‍රේල් පරිවර්තන මෘදුකාංග අනුවාදය 11'ISR4- (Duxbury Braille Translations Software version 11.ISR4 - බලපත්‍රලාභී පිටපත අන්ධ ශිෂ්‍යයන් සහිත පාසල් අටක් සහ විශ්ව විද්‍යාල දෙකක් සඳහා ලබා දී ඇත.
- පුත්තලම/සහිරා ප්‍රාථමික පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකය සඳහා FM ශ්‍රවණ පද්ධතිය ලබා දෙන ලදී.
- ඉලෙක්ට්‍රොනික් බ්‍රේල් යතුරුලියනය (Electronic Braille Writer-Mountbatten MB Plus Electronic Braille System) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා සම්පත් මධ්‍යස්ථානයට ලබාදීම.

මෙම e-NABLE ව්‍යාපෘතිය යටතේ පිනසේන පුහුණු සහ පුනරුත්ථාපන භාරයේ සහයෝගීත්වය ඇතිව විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් පාසල්, මධ්‍යස්ථාන සහ ආයතන සඳහා නොමිලේ පහත සඳහන් මෘදුකාංග ලබාදීම.

i. බ්‍රේල් ඉංග්‍රීසි -සිංහල ශබ්ද කෝෂය (මෙම ශබ්ද කෝෂය බ්‍රේල් සටහන් පරීක්ෂා කිරීමට සහාය වේ.)
ii. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂා සඳහා පරිවර්තන මෘදුකාංග (දෘශ්‍යාබාධිත තැනැත්තන් සඳහා පාඨ බ්‍රේල් කිරීම)
iii. ඉංග්‍රීසි සිංහල භාෂාවලට බ්‍රේල් කිරීම සහ කථන ආබාධිත ශිෂ්‍යයන් සඳහා ගණිත මෘදුකාංග ලබාදීම.



*විශේෂ අධ්‍යාපන ඒකක සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් ලබාදීම*



*බිහිරි ශිෂ්‍ය අධ්‍යාපනය සඳහා FM ශ්‍රව්‍ය පද්ධතිය*



*ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා සහිත සම්පත් මධ්‍යස්ථානය සඳහා ඉලෙක්ට්‍රොනික් බ්‍රේල් යතුරුලියන ලබාදීම*

### 4.2.3. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහයෝගීත්වයෙන් පාසල සම්බන්ධීකරණය මගින් ප්‍රජාවට තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මත කරන පාසල සම්බන්ධීකරණය මගින් ප්‍රජාවට තොරතුරු තාක්‍ෂණය ලබාදීමේ ව්‍යාපෘතිය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) විදුලි සංදේශ සංවර්ධන කාර්යාංශය (BDT) විසින් ලොව පුරා පාසල්වල අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමෙහිලා සැලසුම් කරන ලද පුරෝගාමී වැඩසටහනකි. මෙහි අරමුණ වන්නේ පාසල් තොරතුරු සහ සන්නිවේදන තොරතුරු තාක්‍ෂණ ප්‍රජා මධ්‍යස්ථානයක් වශයෙන් ග්‍රාමීය ආන්තික නාගරික සහ හුදෙකලා ප්‍රදේශ වලට සේවය සැලසීමට වග බලා ගැනීමයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් වැඩි දියුණු කරන ලද පාසල් සම්බන්ධීකරණ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභ සලසන එක් රටක් වශයෙන් ශ්‍රී ලංකාව තෝරා ගන්නා ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරයි. අධ්‍යාපන අමාත්‍යාංශය (MOU) මෙම ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වේ.

මෙය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), අධ්‍යාපන අමාත්‍යාංශය (MOE), ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ නියෝජිතායතනය (ICTA), සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් (UNHCR) කොළඹ කාර්යාලය, සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) පෞද්ගලික සමාගම, සීමාසහිත මොබිටෙල් පෞද්ගලික සමාගම, සීමාසහිත ඩයලොග් ඇක්සියාටා පෞද්ගලික සමාගම, සීමාසහිත ලංකා බෙල් පෞද්ගලික සමාගම, මෙට්‍රොපොලිටන් පරිගණක සමාගම, ඩේසි ලංකා පදනම සහ ජිනසේන පුහුණු සහ පුනරුත්ථාපන භාරය ඇතුළු රාජ්‍යය- පෞද්ගලික-මහජන සහභාගීත්ව

ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මගින් දෙමව්පියන් ගුරුවරුන් සහ අවට ප්‍රජාව සඳහා ප්‍රතිලාභ ලැබේ. මීට අමතරව, මෙලෙස වැඩිදුරටත් සමාජ- ආර්ථික සංවර්ධනයෙහිලා දායක කර ගැනීම පිණිස කාන්තාවන්, විශේෂ අවධානයට ලක් නොවුන ජනතාව, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්, ග්‍රාමීය, දුෂ්කර සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල ජීවත්වන්නවුන් වැනි ආන්තික සහ  අවදානමට ලක්වූ කණ්ඩායම් මෙමගින් සවිබල ගැන්විය හැකිය.

සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි ප්‍රාථමික හෝ ද්විතියික පාසල් පරිගණක විද්‍යාගාර ස්ථාපනය කිරීමෙහිලා තෝරා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ අන්තර්ජාල සම්බන්ධතාවය ලබාදීම සහ විද්‍යුත් රැහැන් ඇදීම, උපකරණ නඩත්තු කිරීමේ පහසුකම් ලබාදීම, පාරිභෝගික භාණ්ඩ සැපයීම වැනි උපකරණ ලබාදීම, දෘඩාංග සහ මෘදුකාංග පිළිබඳව ගුරු පුහුණුව ලබාදීම ඇතුළු ආධාර පාසල් 33 ක් සඳහා ලබාදී ඇත.

තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයේ අඩු දියුණුවක් සහිත ප්‍රදේශවල පිහිටා ඇති පාසල් 33 ශිෂ්‍යයන් 8560 පමණ මෙම ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ සැලසෙන අතර මෙයින් පාසල් අටක විශේෂ අවශ්‍යතා සහිත දරුවන් අධ්‍යාපනය ලබයි. තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයන් භාවිතා කිරීම විශේෂයෙන්ම Linux මෙහෙයුම් පද්ධතිය පිළිබඳව ගුරුවරුන් පුහුණු කර ඇත. මෙම සියළුම පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් සපයා ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පාසල්වල පරිගණක විද්‍යාගාරවලට අවශ්‍ය දෘඩාංග සහ මෘදුකාංග සඳහා අරමුදල් සපයා ඇත. දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් සහනදායී මිලගණන් මත අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා සපයන අතර මෙම පහසුකම් පවත්වාගෙනයාම සහ නඩත්තු කිරීම මෙම පාසල්වල වගකීම වේ. 2013 දෙසැම්බර් 05 දින අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මෙම ව්‍යාපෘතිය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම වටරැක කනිෂ්ට විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය විවෘත කිරීමේදී ජනාධිපති ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලේකම් ලලිත් වීරතුංග මහතා ප්‍රකාශ කළේ "මෙම පාසල සහ ග්‍රාමීය ප්‍රජාව කේන්ද්‍රකරගත් තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ව්‍යාපෘතිය ග්‍රාමීය අංශය සඳහා ප්‍රතිලාභ සලසන බවත් අනාගතයේදී මෙම පාසල් රටේ ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශ වලට තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ දැනුම ව්‍යාප්ත කිරීමෙහිලා ප්‍රධාන කාර්‍යභාරයක් ඉටු කරන බවයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා සහ ශාන්තිකර කලාපයේ අධ්‍යක්‍ෂ ආචාර්ය ඉයුන් ජු කිම් ප්‍රකාශ කළේ මෙය ග්‍රාමීය සහ දුෂ්කර ප්‍රදේශවල තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ප්‍රවේශය කරා යොමු කරවන සුවිශේෂී අවස්ථාවක් සලසන ඵලදායී ව්‍යාපෘතියක් බවත් එමගින් හුදෙක් ගුරුවරුන්ට ශිෂ්‍යයන්ට පමණක් නොව එකී ප්‍රදේශවල ජීවත්වන සෙසු ප්‍රජාවටද ප්‍රතිලාභ සැලසෙන බවයි. මෙවැනි රාජ්‍ය - පෞද්ගලික - මහජන සහභාගීත්වය තුළින් පාසල පාදක ප්‍රජා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කරන බවත් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා ඩිජිටල් අවස්ථා සැලසීමෙහි උපකාර කරන ආකර්ශණීය, දරාගතහැකි, සියළු අන්තර්ගතයන් සහිත, තුලනාත්මක සහ තිරසාර පියවර ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කළ අතර මෙම ව්‍යාපෘතිය සාර්ථක කිරීමෙහිලා දායකත්වය දක්වන සියළුම පාර්ශවයන්ට සිය ස්තූතිය ප්‍රකාශ කළේය.





*හෝමාගම වටරැක කනිටු විදුහලේ පරිගණක විද්‍යාගාරය විවෘත කිරීම*

### 4.2.4. "හරිතමය අනාගතය : පාරිසරික තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතිකරණ පරතරය අවම කිරීම" පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒකාබද්ධ වැඩමුළුව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් ශ්‍රී ලංකාවේ, කොළඹ, සිනමන් ලේක්සයිඩ් හෝටලයේදී ඔක්තෝම්බර් 3-4 දක්වා පවත්වන ලද "හරිතමය අනාගතය : පාරිසරික තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතිකරණ පරතරය අවම කිරීම" පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒකාබද්ධ වැඩමුළුව සඳහා සත්කාරකත්වය දක්වන ලදී.

මෙම වැඩමුළුවේ ප්‍රථම දින තුළ තිරසාරභාවය අඩු කාබන් ආර්ථිකය පාරිසරික තිරසාරභාවය ඇති කිරීම මෙන්ම ප්‍රශස්ත තිරසාර නගර වැඩිදියුණු කිරීම පිණිස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය විසින් ලබාදෙන ප්‍රධාන දායකත්වය පිළිබඳ කරුණු ආවරණය කර ඇත. එමෙන්ම එහිදී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීමෙහිලා පවත්නා සමාජ, ආර්ථික සහ පාරිසරික අවස්ථා විමසා බලා ඇත. එමෙන්ම මෙම වැඩමුළු වාරවලදී නගරවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන්ගේ පාරිසරික බලපෑම තක්සේරු කිරීම සඳහා ITU- T ක්‍රමවේද ඉදිරිපත් කරනු ලැබීය.

වැඩමුළුවේ දෙවන දිනය හරිත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රමිති ජාතික මට්ටමින් ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද සහ රටවල් වලට එමගින් ලැබෙන ප්‍රතිලාභ මොනවාද යන්න විමසා බලන තාක්ෂණික වාරයකට සීමා විය. ITU – T අධ්‍යයන කණ්ඩායම 5 - "පරිසරය සහ කාලගුණය විසින් වැඩිදියුණු කරන ලද ප්‍රධාන හරිත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රමිති (ITU-T නිර්දේශ) ඉදිරිපත් කරනු ලැබේ. වැඩමුළුවේ ප්‍රතිඵලයක් වශයෙන් ITU-T ප්‍රමිති භාවිතා කරමින් හරිත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ප්‍රවර්ධනය නිසැක කිරීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා දෙකකි.

i. ශ්‍රී ලංකාවේ e-waste ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම

ii. ශ්‍රී ලාංකීය ප්‍රමිතිකරණ හරිතමය දත්ත මධ්‍යස්ථාන පාලන සංග්‍රහය වැඩිදියුණු කිරීම

එමෙන්ම මෙම වැඩමුළුව තුළින් දේශීය විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට සිය අත්දැකීම් සෙසු පාර්ශවයන් සමඟ හුවමාරු කර ගැනීමට අගනා අවස්ථාවක් සැලසී ඇත.




*ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සභාපති සභාව අමතමින්*



*වැඩමුළුව සඳහා සහභාගිවූවන්*

### 4.2.5. ශ්‍රී ලංකා කොරියා තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන

ජාතික තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය (NIA) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ(TRCSL) ඒකාබද්ධ වැඩසටහන යටතේ 2013 ජූලි මාසය තුළ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ e-NABLE ව්‍යාපෘතිය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දෙක සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පුහුණුව සැපයීම පිණිස 2013 ජූලි 01 වන දින කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා දායකයන්ගෙන් (KIV) සමන්විත කණ්ඩායම් දෙකක් ශ්‍රී ලංකාවට පැමිණෙන ලදී. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත

තැනැත්තන්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ දැනුම සහ නිපුණතාවය වැඩිදියුණු කිරීම පිණිස ලෝක හිතමිතුරන්, කොරියානු විද්‍යා, තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ අමාත්‍යාංශය සහ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ (NIA) සහයෝගීත්වය ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරනු ලැබේ.



කොරියානු ස්වේච්ඡා කණ්ඩායම පිළිගනිමින්




වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - වත්තේගම




වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය- අගුණකොළපැලැස්ස

### 4.2.6. ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD)

2013 වර්ෂයේදී විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ තේමාව වූයේ "තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයන් සහ මාර්ග සුරක්‍ෂිතතාව ඉහළ නැංවීම" යන්නයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සැමරීම පිණිස 2013 මැයි 17 දින පෙ.ව. 8.30 සිට ප.ව. 12.30 දක්වා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ බිම්මහල් ශ්‍රවණාගාරයේදී "තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයන් සහ මාර්ග සුරක්‍ෂිතතාව ඉහළ නැංවීම" පිළිබඳ සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී.

- තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය සහ මාර්ග සුරක්‍ෂිතතාව ඉහළ නැංවීම : මහාචාර්ය සමන් බණ්ඩාර මොරටුව විශ්ව විද්‍යාලය
- මාර්ගගත මාර්ග සුරක්‍ෂිතතාවය පිළිබඳ අධ්‍යයනය: සාමාන්‍යාධිකාරි, අළෙවි ව්‍යවසාය අංශය ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලික සමාගම
- තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය සහ මාර්ග සුරක්‍ෂිතතාවය : ප්‍රධාන තාක්‍ෂණ නිලධාරී ශ්‍රී ලංකා එයාර්ටෙල්
- තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයන් සහ මාර්ග සුරක්‍ෂිතතාවය ඉහළ නැංවීම කළමනාකරු නිෂ්පාදන සංවර්ධන, සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් පණිවුඩයක් නිකුත් කරන ලදී. ඔහුගේ පණිවුඩයේ ප්‍රකාශ කර ඇත්තේ "ජීවිත හානි තුවාල හා පීඩාවට හේතු වන අනතුරු වැලැක්වීමේදී ඇති වැදගත්කම නිසා මෙන්ම යහපත් සමාජ සංවර්ධනයට දායක වන ප්‍රවාහන කළමනාකරණයට උපයෝගී කර ගත හැකි නව ප්‍රවණතාවයන් හේතුවෙන් ප්‍රවාහන ආරක්ෂාව කෙරෙහි වත්මන් ලෝකය බෙහෙවින් සැලකිලිමත් වන බවයි"





*ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සමරමින්*

### 4.2.7. දායකත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU),ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO), වැනි ජාත්‍යන්තර සංවිධාන ගණනාවක් වෙනුවෙන් ශ්‍රී ලංකා රජය නියෝජනය කරයි. සාමාජිකත්වය ආරක්ෂා කිරීම සඳහා දායක මුදල් වාර්ෂික පදනමක් මත ගෙවනු ලැබේ. සමාලෝචන වර්ෂය තුළ 4.1 වගුවේ දක්වා ඇති පරිදි සාපේක්ෂ වශයෙන් රුපියල් මිලියන 28 ආයතන සඳහා දායක මුදල් වශයෙන් ගෙවා ඇති අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදාළ ආයතනවල සාමාජිකයකු වශයෙන් අදාළ ක්‍රියාකාරකම්වලදී ඵලදායි ලෙස සහභාගී වී ඇත.

**දායක මුදල් ගෙවීම** (4.1. වගුව)

| ආයතනය | දායක මුදල - ශ්‍රී ලංකා රුපියල් |
|---|---|
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය | 21,578,591.10 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය | 1,751,459.00 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) | 4,029,980.68 |
| යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව (SAFIR) | 400,743.00 |
| **එකතුව** | **27,760,773.78** |

### 4.2.8. විදේශ නියෝජිතයන් පැමිණීම සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශවල සහයෝගීත්වය ඇතිව ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය විසින් විදුලි සංදේශනය ආශ්‍රිත කටයුතු, අධ්‍යයන චාරිකා, ව්‍යාපෘති වැඩසටහන්, පුහුණු වැඩසටහන්, වැඩමුළු යනාදියට සහභාගීවීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ නියෝජිතයන් සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලැබේ.

### 4.2.9 බලපත්‍රය නිකුත් කිරීම, අළුත් කිරීම සහ සංශෝධනය කිරීම

දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් නව බලපත්‍ර ලබා ගැනීම, බලපත්‍ර සංශෝධනය කිරීම හෝ අළුත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කළ විට මෙම අංශය විසින් එම ඉල්ලීම් පිළිබඳව අවධානය යොමු කර කොමිෂන් සභාව වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කරයි. පුවත්පත් නිවේදන මගින් එම ඉල්ලීම්වලට අදාළ කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමටත් මහජනතාවගේ සැලකිරීම් / විරෝධතා ලබා ගැනීමටත් ක්‍රියා කරනු ලැබේ. මෙම කරුණු

සැලකිරීම් / විරෝධතා සලකා බැලීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා ගැනීම පිණිස එම නිර්දේශ අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරයි.

### 4.2.9.1. නව බලපත්‍ර නිකුත් කිරීම

2013 වර්ෂය තුළ පහත සඳහන් දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා නව බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

i. සීමාසහිත ආස්ක් කේබල් විෂන් (පෞද්ගලික) සමාගම

ii. සීමාසහිත සුප්‍රීම්සැට් (පෞද්ගලික) සමාගම

iii. ඩිෂ් ටීවී ලංකා (පෞද්ගලික) සමාගම

### 4.2.9.2. බලපත්‍ර අළුත් කිරීම

2013 වර්ෂය තුළ පහත සඳහන් ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල බලපත්‍ර අළුත් කරන ලදී.

i. සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම

ii. සීමාසහිත ඩයලොග් ඇක්සියාටා (පෞද්ගලික) සමාගම

iii සීමාසහිත හච්සන් ටෙලිකොමියුනිකේෂන්ස් ලංකා (පෞද්ගලික) සමාගම

### 4.2.9.3. බලපත්‍ර සංශෝධනය කිරීම

ස්ථාවර, ජංගම දත්ත සන්නිවේදන, අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්, කේබල් රූපවාහිනී, සහ චන්ද්‍රිකා රූපවාහිනී සේවා බලපත්‍රවල සංශෝධන රැසක් සිදු කරන ලදී.

### 4.2.9.4. බලපත්‍ර අවලංගු කිරීම

පහත සඳහන් බලපත්‍රය අවලංගු කර ඇත.
සීමාසහිත සැට්නෙට් (පෞද්ගලික) සමාගම

පරිච්ඡේදය

5

# ජාල අංශය

## සමාලෝචනය

ජාල අංශය විසින් විදුලි සංදේශ සේවා සම්බන්ධ අංක භාවිතය මෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවාවල අංකන රාමුව දක්වන විදුලි සංදේශ අංකන සැලැස්ම කළමනාකරණය කිරීම සඳහා වගකියනු ලැබේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ නව අංකන විකාශනයන් සැලසුම් කිරීම මෙන්ම පවත්නා අංකන සම්පත් කළමනාකරණය කිරීම සඳහා වගකියනු ලැබේ.

තඹ හෝ ප්‍රකාශ තන්තු ජාල, මුහුදු පතුලේ කේබල් මධ්‍යස්ථාන, විදුලි සංදේශ ඇන්ටෙනා කුලුනු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ජාල අංශය විසින් සිදු කරනු ලැබේ. විදුලි සංදේශනය පිළිබඳ ජාතික නියාමන අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එවැනි වැඩිදියුණු කිරීම් සඳහා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීමේදී විවිධ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීමෙහිලා වග කියන අතර ජාල අංශය මෙම ක්‍රියාකාරකම්වලදී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කර ඇත. මෙම කාර්යයේදී පාරිසරික බලපෑම්, සෞඛ්‍යය, ආරක්ෂාව සහ ආරක්ෂණය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් මහජන යහපත මෙන්ම විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය පවත්වාගෙන යාම පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

ජාල අංශය විසින් විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ වගකීම් ඉටු කරමින් පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

### 5.1. කාර්යයන්

- ජාතික අංකන සැලැස්ම සහ කෙටි සංකේත අංක කළමනාකරණය කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා සංඥා ඒකක සංකේත සැලසුම් කිරීම සහ පරිපාලනය කිරීම.
- නව විදුලි සංදේශ සේවා හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට සිය යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැලසීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ උපදෙස් සහ නිර්දේශවලට අනුකූලව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ තාක්ෂණික ප්‍රමිතිවල අනුකූලතාවය නිසැක කිරීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් ආයතනික / ස්වාධීනව ඉදිරිපත් කරන ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම සහ එම වාර්තා නිර්දේශ කිරීම.
- ජාල අංශය හා සම්බන්ධ ජාල උපකරණ සහ පර්යන්ත සඳහා මාදිලි අනුමැතිය ලබාදීම සහ රේගුව මගින් භාණ්ඩ නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) සඳහා සහභාගිවීම සහ

විදුලි සංදේශනය ආශ්‍රිත තාක්ෂණික යෙදවුම් සැපයීම.

- වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ අයදුම්පත් ක්‍රියාවලිය සිදු කිරීම සහ වෙළඳ බලපත්‍ර පරිපාලනය කළමනාකරණය කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ මහජන ආරක්ෂක නීති හා නියෝග සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව / පොලිස් විමර්ශනවලට සහාය වීම.

### 5.2. කාර්යසාධනය

2013 වසර තුළදී ජාල අංශය විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම, ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා නිෂ්කාශන වාර්තා නිකුත් කිරීම, පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, විදුලි සංදේශ යටිතල ව්‍යුහයන් සංවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සකස් කිරීම සහ මහජනතාව දැනුවත් කිරීම වැනි අංශය වෙත පැවරුනු නියාමන කාර්යයන් ඉටු කරන ලදී.

ජාල අංශය විසින් ඉටුකරනු ලැබූ කාර්යයන්ට අදාළ සංඛ්‍යාලේඛන 5.1 වගුවේ දැක්වේ.

### 5.2.1. වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ 21 (1) වගන්තිය යටතේ විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම, විකිණීම, අළුත්වැඩියා කිරීම සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කරන අතර 2013 වසරේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 763 කී

**ජාල අංශය පිළිබඳ සංඛ්‍යාලේඛන 2012-2013** (5.1. වගුව)

| විස්තරය | 2012 | 2013 |
|---|---|---|
| නිකුත් කරන ලද මුළු වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව | 810 | 763 |
| ඉදි කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව | 5897 | 6364 |
| කුලුනු පිළිබඳව ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 178 | 181 |
| පවත්වන ලද මුළු විමර්ශන සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිතව) | 65 | 32 |
| කුලුනු ඉදිකිරීම සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව | - | 03 |
| පවත්වන ලද මුළු මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 16 | 16 |
| ප්‍රදානය කරනු ලැබූ මුළු නව මාදිලි අනුමැතීන් සංඛ්‍යාව | 72 | 43 |
| මුළු ආනයන නිෂ්කාශනය නිකුත් කරනු ලැබූ සංඛ්‍යාව | 3526 | 3640 |
| මුළු තනි පුද්ගල නිෂ්කාශන සංඛ්‍යාව | 177 | 45 |
| නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව | 32 | 40 |

### 5.2.2. විදුලි සංදේශ කුලුනු ඉදි කිරීම

2013 වසරේදී ඉදි කරන ලද නව විදුලි සංදේශ කුලුනු 467 ඇතුලත්ව විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 6364 ක් වූ අතර එය 2013 වසරේදී ඉදිකරන ලද මුළු කුලුනු සංඛ්‍යාව හා සන්සන්දනය කිරීමේදී සියයට 50 ක අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියළුම දුරකථන ක්‍රියාකාර සමාගම් කුලුනු යටිතල පහසුකම් ප්‍රශස්ත ආකාරයෙන් හවුලේ පරිහරණය කිරීමෙහිලා දිරිගැන්වීමයි.

විදුලි සංදේශ කුලුනු සඳහා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියේදී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ඉදිකිරීමේ අවසර පත්‍රය ලබා ගැනීමේදී විවිධ පළාත් පාලන ආයතන විසින් ආවස්ථික ආකාරයෙන් විවිධ ගාස්තු අය කරන අතර එම ගාස්තු ඉතා ඉහළ අගයක් ගනී. පළාත් පාලන ආයතනවලින් අනුමැතිය ලබා ගැනිමේදී පවත්නා අසීමිත ප්‍රමාදය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාදකිරීමෙහිලා හේතුවේ.

### 5.2.3. කොකාවිල් බහුකාර්යය කුලුන සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය

2013 වර්ෂයේදී කොකාවිල් බහුකාර්යය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ පහසුකම් අතිරේක පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන් (PSTN – Public Switching Telephone Network) හතර දෙනෙකු විසින් පරිහරණය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එම සමාගම් වලට විශේෂයෙන් උතුරු පළාතේ සේවා ආවරණය ව්‍යාප්ත කිරීමට හැකි විය.

### 5.2.4. යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ පැමිණිලි

විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම ඉහල යාමත් සමඟ කුලුනු ඉදිකිරීමට විරුද්ධ පැමිණිලි සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. විවිධ හේතු නිසා කුලුනු ඉදි කිරීමට විරුද්ධව මහජනතාවගෙන් පැමිණිලි ලැබී ඇති අතර 2013 වසරේදී ජාල අංශය විසින් මෙම කාරණය පිළිබඳව විමර්ශන 32 ක් පවත්වා ඇත. 2013 වසරේදී විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත අධිකරණ නඩු සංඛ්‍යාව තුනකි (03). 2013 වසරේදී කුලුනු ආශ්‍රිත මහජන පැමිණිලි නවයක් (09) පමණ සමථයකට පත් කර ඇත.

### 5.2.5. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

2013 වර්ෂයේදී ජාල අංශය විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමැති වෘත්තිකයන්ගේ සහාය ඇතිව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් පවත්වා ඇත. මෙම වැඩසටහන් පැවැත්වීමේ අරමුණ වූයේ විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමයි.

### 5.2.6. මාදිලි අනුමැතිය සහ ආනයන නිෂ්කාශනය නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ 5(q) නියමයන් ප්‍රකාරව, පර්යන්ත උපකරණ සඳහා කොමිෂන් සභාවේ මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. ඒ අනුව, දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, පෞද්ගලික ස්වයංක්‍රීය ශාඛා හුවමාරුව (PABXS - Private Automated Branch Exchange), මෝඩම් යන්ත්‍ර, රැහැන් රහිත දුරකථන සහ වෙනත් පාරිභෝගික පරිශ්‍ර උපකරණ බලපත්‍රලාභී ජාලයකට සම්බන්ධ කිරීම පිණිස මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. 2013 වසරේදී කොමිෂන් සභාව විසින් උපකරණ හතලිස් තුනක් (43) ක් සඳහා නව මාදිලි අනුමැතිය ලබා දී ඇත.

### 5.2.7. කෙටි සංකේත අංක වෙන් කිරීම

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් ඔවුන්ගේ සේවා මහජනතාව වෙත පහසුවෙන් ප්‍රවේශ කිරීම පිණිස කෙටි සංකේත අංක වෙන් කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම් ලැබුණු විට ජාල අංශය අදාල ආයතනවලින් ව්‍යාපෘති යෝජනා ලබා ගන්නා අතර සීමිත සම්පතක් වෙන් කිරීමේදී උපරිම අවධානයක් ලබා දිය යුතු බැවින් යෝජනාව විස්තරාත්මකව අධ්‍යයනය කරයි. අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් ජාල අංශය කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි. 2013 වසරේදී වෙන් කරන ලද සංඛ්‍යාංක තුනේ සහ සංඛ්‍යාංක හතරේ නව කෙටි සංකේත අංක සංඛ්‍යාව පිළිවෙළින් එකක් (01) සහ හතක් (07) වේ.

### 5.2.8. ඇන්ටෙනා ආකෘති ඉදිකිරීම සහ ඇන්ටෙනා ආකෘති ඉදිකිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ නිර්නායකයන් සංවර්ධනය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීම අයුතු ලෙස සීමා නොකරමින් මහජන යහපත සහ පරිසරය ආරක්ෂා කිරීමේ අදහසින් මෙම කාර්යය සිදු කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඇන්ටෙනා ආකෘති සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සහ ඇන්ටෙනා ආකෘති ඉදිකිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්නායකයන් කෙටුම්පත් කිරීම පිණිස තාක්ෂණික උපදේශක කමිටුවක් පත් කරන ලදී. කොමිෂන් සභාව විසින් මෙම ප්‍රතිපත්තිමය නිර්නායකයන් අනුමත කර ඇති අතර අදාළ පාර්ශවයන් විසින් මෙම නිර්නායකයන් පිළිපදින බැවින් කුලුනු ඉදිකිරීම සහ ඒවායේ නඩත්තුව පිළිබඳ ගැටළු අවම කිරීමට අපේක්ෂිතය.

**2013 වර්ෂයේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක** (වගුව 5.2)

| ආයතනය | කෙටි සංකේත |
|---|---|
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය | 117 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 1918 |
| සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක් හවුස්) | 1949 |
| ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | 1962 |
| ශ්‍රී ලංකා ජාතික රෝහල | 1959 |
| ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය | 1938 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 1996 |
| තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය | 1966 |

### 5.2.9. නීත්‍යානුකූල නොවන වෙළෙන්දන් විමර්ශනය කිරීම

මීට පෙර සඳහන් කර ඇති පරිදි විදුලි සංදේශ උපකරණ විකිණීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නීත්‍යානුකූලව අලෙවි කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම බලාත්මක කිරීම / දිරිගැන්වීම පිණිස ශ්‍රී ලංකා පොලීසියේ සහයෝගය ඇතිව නීත්‍යානුකූල නොවන වෙළෙන්දන් විමර්ශනය කිරීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ජාල අංශය මගින් සිදු කෙරේ.

### 5.2.10. නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පවත්වාගෙන යන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීම

විදුලි සංදේශ පනතේ 22 (අ) (1) වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කළ බලපත්‍රයක අධිකාරිත්වය යටතේ හැර කිසිම පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය. 2013 වසරේදී ජාල අංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නීත්‍යානුකූල නොවන කේබල් රූපවාහිනී සේවා පාලනය කිරීම දීප ව්‍යාප්තව සිදු කර ඇත.

පරිච්ඡේදය

# 6 ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය

**සමාලෝචනය**

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනයත් සමඟ තිරසාරව සහ ඵලදායීව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනයට අභිමුඛ පහසුකම් සැපයීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සහ ආශ්‍රිත පර්යේෂණ ක්‍රියාකාරකම් රැසක් සැලසුම් කර ඇත. ඒ අනුව කොමිෂන් සභාව 2013 වර්ෂයේදී ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය නමින් වෙනම අංශයක් ස්ථාපනය කරන ලදී. මේ වන විට ව්‍යාපෘති සහ පර්යේෂණ අංශයට කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය සහ නෙළුම් කුලුන සාප්පු සංකීර්ණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කළමනාකරණය කිරීම පැවරී ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ විට සහ නියම කරන කල්හී ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ වෙනත් ව්‍යාපෘති කටයුතු සඳහා සහාය ලබා දේ. කොළඹ නෙළුම් කුලුන ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට සිදු කරන සුවිශාල අද්විතීය ව්‍යාපෘතියක් වන අතර එහි ඉදිකිරීමේ කටයුතුවල ප්‍රශස්ත සහ අඛණ්ඩවූ ප්‍රගතිය සහතික කිරීම පිණිස ක්ෂේත්‍රයේ සියළුම තීරණාත්මක ගැටළු නිරාකරණය කිරීම පිණිස ව්‍යාපෘති උපදේශකයන් සහ කොන්ත්‍රාත්කරුවන් සමඟ සමීපව කටයුතු කිරීම ඉතා වැදගත් වේ. එමෙන්ම මෙම අංශය විසින් වාර්තාවූ තීරණාත්මක ගැටළු සාකච්ඡා කිරීම සහ නියෝග නිකුත් කරන විට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටුව (CAPIC) සමඟ සමීපව ක්‍රියා කරන අතර ව්‍යාපෘතිය සම්පූර්ණ කරන කාලය වන විට පවත්නා කුලුනේ මූලික සැලසුම් සඳහා අවශ්‍ය නවීකරණයන් සම්බන්ධයෙන් තීරණ ගනු ලැබේ. මෙම අංශය ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්වලට අනුකූලව සෙසු රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. මෙම අංශය නෙළුම් කුලුන වැඩ භූමියේ වැඩබිම් කාර්යාලයක ස්ථාපනය කර ඇති අතර විශේෂඥ දැනුමැති ඉංජිනේරුවන් කණ්ඩායමක් විසින් ව්‍යාපෘති ප්‍රගතිය පරීක්ෂාකාරීව නිරීක්ෂණය කරයි. එමෙන්ම එය සේවාදායකයන්, උපදේශකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර මනා කාර්යය පරිසරයක් පවත්වාගෙනයාම සඳහා ව්‍යාපෘති වැඩබිම් කාර්යාල කළමනාකරණය කිරීමෙහිලා ක්‍රියාකාරීව සහාය ලබාදේ. මෙම අංශයේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයන් සේවා දායකයන්ගේ යහපත උදෙසා සතිපතා ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඇත. මේ වන විට වැඩබිම් ඉංජිනේරුවරු දෙදෙනෙකු ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ නිලධාරීන් තිදෙනෙකු සහිතව මෙම අංශයේ කාර්යයන් සිදු කෙරේ. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටුවේ (CAPIC) උපදෙස් සහ විධිවිධාන ප්‍රකාරව ව්‍යාපෘතිය ආරම්භයේ සිට අවසානය දක්වා සාර්ථකව නිම කිරීම තුළින් ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂ - ව්‍යාපෘති වෙත පැවරේ. මෙම අංශය මගින් සිදු කරන ප්‍රධාන කාර්‍යයන් පහත දැක්වේ.

## 6.1. කාර්යයන්

1. ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ ආනයනය කිරීම, ව්‍යාපෘති අනුමත කිරීම යනාදීය පිළිබඳ තාක්ෂණික සහ මූල්‍ය කරුණු අනුමත කිරීමෙහිලා වගකියන කොන්ත්‍රාත්කරු, මහා භාණ්ඩාගාරය, රේගුව සහ වෙනත් විවිධවූ රාජ්‍ය සහ පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම.
2. ව්‍යාපෘති උපදේශන ඒකකය (PCU) සහ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් අතර පවත්වන සියළුම තාක්ෂණික රැස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව නියෝජනය කිරීම සහ තාක්ෂණික කරුණු පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්, සහ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව සඳහා නිර්දේශ ලබාදීම.

3. ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ව්‍යාපෘති වාර්තා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය සියළුම සහයෝගය ලබාදීම.
4. කොන්ත්‍රාත් කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් ව්‍යාපෘති උපදේශන ඒකකයට සහයෝගය ලබාදීම සහ ව්‍යාපෘති විචල්‍යයන් සහ වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වෙත නිර්දේශ ලබාදීම.
5. අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටුව සම්බන්ධීකරණය කිරීම සහ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ඔවුන්ට දැනුම්දීම.
6. ව්‍යාපෘතිය භාරගැනීමේ අදියර තුළ සේවාදායකයා වෙනුවෙන් භාරගැනීමේ බලධාරියකු ලෙස ක්‍රියා කිරීම.

## 6.2. කාර්යසාධනය

2013 වර්ෂය තුළ මෙම අංශයේ කාර්යසාධනය පහත සඳහන් පරිදි සාරාංශ ගත කර ඇත.

1. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කමිටු (CAPIC) රැස්වීම් 13 සංවිධානය කර තිබීම.
2. මොරටුව විශ්ව විද්‍යාලය සමඟ උපදේශන ගිවිසුමකට අත්සන් තැබීම.
3. ව්‍යාපෘතිය සඳහා ව්‍යවස්ථාපිත අනුමැතිය ලබා ගැනීම.
4. කොළඹ නෙළුම් කුලුනේ කුලුනු ග්‍රාහකය සහ ටැංකි කටයුතු සම්පූර්ණ කිරීම.
5. ඉදිකිරීම් භූමියට ආරක්ෂාව සැලසීම සහ භූමියේ මායිම් සහතික කරන මායිම් ලකුණු කිරීම.
6. වැඩබිමේ උපයෝගී සේවා සකස් කිරීම.
7. වැඩබිම් කාර්යාලය ස්ථාපනය කිරීම.
8. ගිනි සේවා දෙපාර්තමේන්තුව මගින් ඉදිකිරීමේ අදියර සඳහා අනුමැතිය සහ නිර්දේශ ලබා ගැනීම.
9. කොළඹ නගර සභාව (CMC) මගින් ඉදිකිරීමේ බලපත්‍රය/ සංවර්ධන බලපත්‍රය ලබා ගැනීම.
10. අවශ්‍ය ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
11. කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ණය පියවීම පිළිබඳ ලියකියවිලි සකස් කිරීම සහ ලේඛනගත කිරීම.
12. ණය සඳහා රාජ්‍ය ඇප ලබා ගැනීම.
13. මහ බැංකුව සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින් අත්තිකාරම් ගෙවීමේ ඇප ආකෘති පත්‍රය සඳහා අනුමැතිය ලබා ගැනීම.
14. ණය මුදල් ගෙවීම සම්පාදනය කිරීම.
15. වීසා (VISA) ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම.
16. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ රේගු දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය ඇතිව භාණ්ඩ ආනයනය කිරීමේ අවසරය ලබාදීම විධිමත් කිරීම.
17. වැඩබිමේ කාර්ය මණ්ඩලය සහ පුහුණුවන්නන් සඳහා රක්ෂණ ප්‍රතිපත්ති ලබා ගැනීම පිණිස උපදෙස් ලබා දීම සහ අවධානය යොමු කිරීම.

## 6.3 ව්‍යාපෘති ප්‍රගතිය (කොළඹ නෙළුම් කුලුන)

ව්‍යුහාත්මක ඉදිකිරීමේ කාර්යයන්ගෙන් සියයට තිහක ප්‍රතිශතයක් සහ සැලසුම් කටයුතු වලින් සියයට අනූවක ප්‍රතිශතයක් 2013 වර්ෂයේදී අවසන් කර ඇත. චීන ජාතික ඉලෙක්ට්‍රොනික්ස් ආනයන හා අපනයන සංස්ථාව (CEIEC) විසින් කුලුනු ආධාරක පියස්සේ තහඩුව මීටර් 15 මට්ටමක් අදියර දෙකක් යටතේ සම්පූර්ණ කර ඇති අතර 2014 ජනවාරි මස 15 දින වන විට තහඩුව සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. අත්තිවාරමේ (මුහුදු මට්ටමින් මීටර් 5.0 පහළ) සිට කුලුනු ආධාරක පියස්ස මුදුන (මුහුදු මට්ටමින් මීටර් 15.0 ඉහළ) දක්වා ඉදිකිරීමේ කටයුතු 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අවසන් කරන ලදී.



*කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීමෙන් අනතුරුව එය දර්ශනය වන ආකාරය*





*ඉදිකිරීමේ ප්‍රගතිය*

පරිච්ඡේදය
7

# අධිවේගී අන්තර්ජාල සේවා (Broadband) පිරික්සුම් ඒකකය

ශ්‍රී ලංකාවේ අධිවේගී අන්තර්ජාල සේවා සංවර්ධනය කිරීමෙහිලා මගපෙන්වීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය (National Broadband Initiative – NBI) ආරම්භ කර ඇත. ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතියේ කාර්යයන් සෘජුවම විදුලි සංදේශ නියාමන ආයතනය යටතේ සිදු කෙරෙන අතර එය රටේ කඩිනම් අධිවේගී අන්තර්ජාල සේවා සංවර්ධනයේ ප්‍රධාන මධ්‍යස්ථානය වනු ඇත.

ක්‍රමෝපායශීලී ක්‍රියාවලියක් මගින් රටේ අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රවර්ධනය කිරීමට අමතරව, මෙම ව්‍යාපෘතිය මගින් අධිවේගී අන්තර්ජාල සේවා වර්ධනය කිරීමට සෘජුවම සම්බන්ධ ක්ෂේත්‍රයන් පමණක් නොව නවීන ආර්ථිකයන්හි බොහෝ කාර්යයන් සඳහා භාවිතා කරන නිශ්චිත ක්ෂේත්‍රයන් අධීක්ෂණය කරනු ඇත. අධිවේගී අන්තර්ජාල සේවාවල සේවා තත්ත්ව මැනීම තුළින් අවසන් පරිහරණය කරන්නාට සපයන සේවා මට්ටම වැඩිදියුණු කිරීමට සේවා සැපයුම්කාර සමාගම්වලට සහාය වෙමින් ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. තවත් ගන්නා ලද වැදගත් පියවරක් වන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය මගින් දිවයිනේ පරිගණක විද්‍යාගාර සම්බන්ධ කිරීම පිණිස පාසල්වලට අධිවේගී අන්තර්ජාල සේවා සැපයීමෙහිලා



*අධිවේගී අන්තර්ජාල සේවා සහිත පාසල් පරිගණක විද්‍යාගාරයක්*

නොබෝදා අධ්‍යාපන අමාත්‍යාංශය (MOE) සහ සේවා සැපයුම්කාර සමාගම් සමඟ එක්ව කටයුතු කිරීමට අත්වැල් බැඳගැනීමයි.

අධ්‍යාපන අමාත්‍යාංශය/ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව් අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය තත්පරයට මෙගාබයිට්ස් 100 දක්වා වේගය ඉලක්ක කර ගනිමින් පිරිවැය ඵලදායී නවීන අධිවේගී අන්තර්ජාල සේවා සපයනු ඇත. මෙය 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද SchoolNet නමින් හඳුන්වන, දැනට පවත්නා අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාලය තවදුරටත් ව්‍යාප්ත කිරීමකි. එහි මුල් පියවර තුළ SchoolNet II යටතේ පාසල් 4000 ආවරණය වන අතර 2020 වර්ෂය වන විට සියළුම පාසල් පරිගණක විද්‍යාගාර ආවරණය කිරීමට අපේක්ෂිතය.

ප්‍රධාන පෙළේ පාසල්වල පරිගණක විද්‍යාගාර ආවරණය කරමින් කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ මේ සම්බන්ධයෙන් නියමු ව්‍යාපෘතියක් දැනටමත් ආරම්භ කර ඇත. මෙම පරිගණක විද්‍යාගාර සඳහා එක් පරිගණක විද්‍යාගාරයකට තත්පරයට මෙගාබයිට්ස් 40 දක්වා සාමාන්‍යය වේගයක් සහිත හතරවන වර්ධනාත්මක පරිණාම සම්බන්ධතාවයන් (4G LTE connections) සපයා ඇත.

**ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය මගින් ප්‍රථම වරට හඳුන්වා දෙන ලද අධිවේගී අන්තර්ජාල පහසුකම් සහිත අංගසම්පූර්ණ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පන්ති කාමරය**

අධ්‍යාපන අමාත්‍යාංශය/අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතියේ ඒකාබද්ධ ප්‍රයත්නය ප්‍රකාරව හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකාවේ ප්‍රථම අංගසම්පූර්ණ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පන්ති කාමරය සඳහා අධිවේගී අන්තර්ජාල සම්බන්ධතා සපයා ඇත. මෙම පංති කාමරය අන්තර්ජාල කටයුතු සඳහා යොදා ගන්නා නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ බහුමාධ්‍යය උපකරණවලින් සමන්විත වේ. රටේ සියළුම දරුවන් සඳහා ප්‍රශස්ත ලෙස අධ්‍යාපනය ලබා දෙන බව සහතික කරමින් දරුවන් සඳහා මාර්ගගත අධ්‍යාපනය ලබා දිය හැකිය. අංගසම්පූර්ණ පංති කාමරය තුළ අන්තර්ජාලය භාවිතා කරමින් පාඩම් කටයුතු සිදු කරන අතර අධිවේගී සහ පුළුල් කළාප අන්තර්ජාල සම්බන්ධතා ලබාදීම අවශ්‍ය කෙරේ. මෙම අවශ්‍යතාවය සපුරාලීම පිණිස පහළ දිසාවන්හී තත්පරයට මෙගාබයිට්ස් 30 ඉක්මවායන අධිවේගී 4G LTE සම්බන්ධතාවයන් දෙකක් පාසල්වලට සපයා ඇත.

**අධිවේගී අන්තර්ජාල සේවාවල වේගය මැනීම සඳහා උපකරණ වැඩිදියුණු කිරීම**

අධිවේගී අන්තර්ජාල සේවා හතරවන වර්ධනාත්මක දිගු කාලීන පරිණාමයේ (4G LTE) සිට ගෘහස්ථ ෆයිබර් තන්තු (FTTH- Fiber to the home) දක්වා තාක්ෂණ ආකෘති ගණනාවකට වැඩි දියුණු කර ඇති බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය මාර්ගගත වෙබ් අඩවි පාදක අන්තර්ජාල වේග පරීක්ෂණ උපකරණය නව විශේෂාංග එකතු කරමින් වැඩිදියුණු කර ඇත.

ගෘහස්ථ ෆයිබර් තන්තු (FTTH- Fiber to the home) සහ හතරවන වර්ධනාත්මක දිගු කාලීන පරිණාම (4G LTE) සේවා වැනි අධිවේගී අන්තර්ජාල සේවා පරීක්ෂා කිරීමට සහාය කර ගැනීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නෙදර්ලන්තය සහ සිංගප්පූරුව යන රටවල පරීක්ෂණ සර්වර සම්බන්ධ කර ඇත. මෙම නව සැලැස්ම තුළින් යුරෝපයේ සර්වරයකට පමණක් නොව ආසියාවේ සර්වරයකට සම්බන්ධවෙමින් සිය අධිවේගී සම්බන්ධතාවල සේවා තත්ත්ව (QoS) තක්සේරු කිරීමට අන්තර්ජාල ග්‍රාහකයන්ට අවස්ථාව සැලසේ.

# තරඟකාරිත්ව අංශය

පරිච්ඡේදය

8

**සමාලෝචනය**

පනතේ විධිවිධාන ප්‍රකාරව රටේ ජනතාව සඳහා සාධාරණ, දරාගතහැකි, සහ ගුණාත්මක විදුලි සංදේශ සේවා නිසැක කිරීම ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ වගකීම වේ. මෙම කාර්‍යය සඳහා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, අයකුම නියාමනය කිරීම, අන්තර් සම්බන්ධතා සේවා පිරික්සීම, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, සහනාධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් ඌන සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා ප්‍රදේශ සඳහා විදුලි සංදේශ ජාල ව්‍යාප්ත කිරීම පිණිස විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල අවධානය යොමු කරලීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය කරන අතර මෙම කාර්‍යයන් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ තරඟකාරිත්ව අංශය විසින් සිදු කරනු ලැබේ. එමෙන්ම මෙම අංශය විසින් වරිපණම්, අයබදු, සහ සෙස් ගාස්තු අය කිරීම පිරික්සීම සහ විශ්ලේෂණාත්මක කාර්‍යයන් සඳහා දත්ත රැස් කිරීම මෙන්ම මහබැංකුව, මහා භාණ්ඩාගාරය, සහ වෙනත් අදාළ දේශීය සහ ජාත්‍යන්තර ආයතන සඳහා විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාදීම සිදු කරයි.

තරඟකාරිත්ව අංශයේ කාර්‍යයන් සහ කාර්‍යය සාධනය පහත දැක්වේ.

## 8.1. කාර්‍යයන්

- පිරිවැය පාදක අයකුම නියාමනය තුළින් පිරිවැය අධ්‍යයනය සහිත අයකුම විශ්ලේෂණය සිදු කිරීම සහ කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නව අයකුම යෝජනා පරීක්ෂා කිරීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍යය සහ මෙහෙයුම් කාර්‍යය සාධනය විශ්ලේෂණය කිරීම තුළින් ආංශික කාර්‍යය සාධනය පිරික්සීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ආර්ථික විශ්ලේෂණය සිදු කිරීම.
- කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා අන්තර් සම්බන්ධතා සහ අන්තර් මෙහෙයුම් අන්තර් සම්බන්ධීය විධිවිධාන පිළිබඳව වාණිජමය කොන්දේසි ක්‍රියාත්මක කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් මගින් කාලානුරූපව විගණනය කරන ලද මූල්‍යය ප්‍රකාශන එක්රැස් කිරීමට වග බලා ගැනීම.
- ග්‍රාමීය ප්‍රදේශවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සහ වැඩසටහන් කොමිෂන් සභාවට නිර්දේශ කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ සංඛ්‍යාන තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තය මගින් රජයට ලැබිය යුතු රජයේ වරිපණම්/බදු (විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු) සහ සෙස් බදු එකතු කිරීම අධීක්ෂණය කිරීම.

## 8.2. කාර්‍යය සාධනය

### 8.2.1. අයකුම නියාමනය කිරීම

විදුලි සංදේශ පනතේ 5(ඔ) වගන්තිය ප්‍රකාරව අයකුම සැලැස්ම අනුමත කිරීමේ බලතල කොමිෂන් සභාව සතුවේ. එබැවින්, බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් වෙළඳපළට අයකුම සැලැස්ම ඉදිරිපත් කිරීමට පෙර අයකුම සඳහා කොමිෂන් සභාව මගින් අනුමැතිය ලබාගැනීම

අවශ්‍ය කෙරේ. ඒ අනුව, දුරකථන ක්‍රියාකාර සමාගම් කලින් කල සිය අපේක්ෂිත නිශ්පාදන සහ සේවා සඳහා අයකුම යෝජනා ඉදිරිපත් කරයි. රජයේ ප්‍රතිපත්ති, නීති, නිර්නායකයන් සහ රීති සලකා බලමින් විශේෂ අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් මෙම අයකුම සැලසුම් අනුමත කරයි. දිගු කාලීන පාදක අයකුම අනුමැතිය සහ ප්‍රවර්ධන පාදක අයකුම අනුමැතිය නමින් අයකුම අනුමත කිරීමේ පටිපාටි වර්ග දෙකකි.

(අ) කොමිෂන් සභාවේ තීරණයක් මත අයකුම සංශෝධනයක් හෝ අවසන් කිරීමක් කරන තෙක් දිගු කාලීන අයකුම අනුමැතිය බලපවත්වන බැවින් එය ස්ථිර අයකුම අනුමැතිය යනුවෙන් හඳුන්වනු ලැබේ. දුරකථන ක්‍රියාකාර සමාගමකට අයකුම සංශෝධනය කිරීමට අවශ්‍යනම් හෝ තාවකාලිකව අනුමත කරන ලද අයකුම සැලැස්ම තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍යනම් හෝ දිගු කාලපරිච්ඡේදයක් සඳහා අයකුම සැලැස්ම ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව හැඟෙන්නේනම් මෙම ප්‍රභේදය යටතේ අයකුම සැලැස්ම ඉදිරිපත් කළ හැකිය.

(ආ) දෙවන අනුමැති ප්‍රභේදය ප්‍රවර්ධන පාදක අයකුම අනුමැතිය ලෙස නම් කර ඇති නමුත් සැබැවින්ම එයින් ප්‍රවර්ධනය යන්න අදහස් නොවේ. තරඟකාරිත්වය නිසා දුරකථන ක්‍රියාකාර සමාගම්වලට සෙසු තරඟකරුවන්ගේ අයකුම පිළිබඳව කඩිනමින් ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ. වැඩිදුරටත්, පාරිභෝගිකයන්ගේ හැසිරීමේ අවිනිශ්චිතතාවය නිසා දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් වෙළඳපළ පරීක්ෂා කිරීම අවශ්‍ය විය හැකිය. එවැනි අවස්ථාවලදී, දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ප්‍රවර්ධන පාදක අයකුම යෝජනා ඉදිරිපත් කරන අතර මාස තුනක උපරිම කාලපරිච්ඡේදයක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය තාවකාලිකව ලබා දෙනු ලැබේ. දුරකථන ක්‍රියාකාර සමාගම් වලට මෙම අයකුම සැලැස්ම තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය නම් ඔවුන්ට දිගු කාලීන පාදක අයකුම අනුමැතිය සඳහා අයදුම් කළ හැකිය.

2013 වර්ෂයේදී ඉහත ප්‍රභේද දෙක යටතේ අනුමත කරන ලද මුළු අයකුම සංඛ්‍යාව 161 ක් වන අතර එය දිගු කාලීන පාදක අයකුම අනුමැතීන් 25 සහ ප්‍රවර්ධන පාදක අයකුම අනුමැතීන් 136 සමන්විත වේ. 2013 වර්ෂයේදී හඬ ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවා සඳහා පාදස්ථ මිල කිසිම සංශෝධනයකින් තොරව අඛණ්ඩව පවතී.

ශ්‍රී ලංකාව ලෝකයේ ලාභදායි හඬ සේවා සහ අධිවේගී අන්තර්ජාල අයකුම පවත්නා රටකි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රකාශනයේ "තොරතුරු සමාජය 2013 තක්සේරු කිරීම" ප්‍රකාරව ශ්‍රී ලංකාව මිල දරාගතහැකි බව පිළිබඳ කාරණය සාර්ථකව සාකච්ජා කර ඇත. ජංගම දුරකථන ඇමතුම් ගාස්තු පිළිබඳව අවධානය යොමු කිරීමේදී 2013 වර්ෂයේදී අප ලෝකයේ සෙසු රටවල් අතර 14 වන ස්ථානයේ පසුවූ අතර ශ්‍රී ලංකාවට වඩා අඩු දුරකථන ඇමතුම් ගාස්තු සහිත රටවල් 13 ක් පමණ පවතී. ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා අයකුම පිළිබඳව සලකා බැලීමේදී අප ආසියා ශාන්තිකර කලාපයේ 9 වන ස්ථානයේ පසුවේ. මිල දරාගත හැකි බව ග්‍රාහක දුරකථන ව්‍යාප්තිය පිළිබඳව බලපාන එක් සාධකයකි. එබැවින් ලෝකයේ සෙසු බොහෝ රටවල් හා සන්සන්දනය කිරීමේදී ශ්‍රී ලංකාව ප්‍රශස්ත ස්ථානයක පසුවේ.

### 8.2.2. මෙහෙයුම් සහ මූල්‍යය කාර්යසාධනය

#### 8.2.2.1. මෙහෙයුම් කාර්යසාධනය

2013 වර්ෂය අවසාන වන විට, සමස්ථ ග්‍රාහක සංඛ්‍යාව (ස්ථාවර සහ ජංගම දුරකථන) මිලියන 23 ක් වූ අතර 2012 වර්ෂයට සාපේක්ෂ වශයෙන් එය සියයට 2.8 දක්වා අඩුවීමකි. 2012 සහ 2013 වර්ෂවලදී ස්ථාවර දුරකථන ග්‍රාහක සංඛ්‍යාව පිළිවෙළින් 3,449,391 සහ 2,706,787 වූ අතර මෙම කාලපරිච්ඡේදය තුළ සියයට 21.5 දක්වා සැලකිය යුතු අඩුවීමකි. එය සන්සන්දනය කිරීමේදී, ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව 2012 වර්ෂයේදී 20,234,070 සිට 2013 වර්ෂයේදී 20,315,150 දක්වා කාලපරිච්ඡේදය තුළ සියයට 0.4 සුළු වර්ධනයක් පෙන්නුම් කරයි.

#### 8.2.2.2. මූල්‍යය කාර්යසාධනය

**1) ආයෝජන**

දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන පිළිබඳ තොරතුරු 8.1. වගුවේ දැක්වේ. ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන 2012 වර්ෂයේදී

රුපියල් මිලියන 20,638 සිට 2013 වර්ෂයේදී රුපියල් මිලියන 15141 දක්වා සියයට 26.6 අඩුවූ අතර එම කාලපරිච්ඡේදය තුළ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන සියයට 47.8 දක්වා වර්ධනය වී ඇත. ජංගම දුරකථන ක්ෂේත්‍රය 2012 වර්ෂයේදී මෙන්ම 2013 වර්ෂයේදී වැඩි ආයෝජන කෙරෙහි නැඹුරු වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ජංගම දුරකථන ක්ෂේත්‍රය පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇති බව විද්‍යාමාන කරමින් සමස්ථ ආයෝජනවල ප්‍රතිශතයක් වශයෙන් ජංගම දුරකථන ක්ෂේත්‍රයේ ආයෝජන 2012 වර්ෂයේදී සියයට 59.1 සිට 2013 වර්ෂයේදී සියයට 74.4 දක්වා වර්ධනය වී ඇත.

**දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන** (8.1. වගුව)

| දුරකථන ක්‍රියාකාර සමාගම | ආයෝජන (රු. මිලියන) | |
|---|---|---|
| | 2012 | 2013 |
| ස්ථාවර දුරකථන | 20,638 | 15,141 |
| ජංගම දුරකථන | 29,808 | 44,047 |
| ස්ථාවර සහ ජංගම දුරකථන | 50,446 | 59,188 |

*සටහන: ආයෝජනවල දේපළ, පිරියත සහ උපකරණ අන්තර්ගත වේ*

## II) ආදායම

2012 සහ 2013 වර්ෂ සඳහා ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම 8.2. වගුවේ දැක්වේ.

**ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආදායම 2012- 2013** (8.2. වගුව)

| දුරකථන ක්‍රියාකාර සමාගම | ආදායම (රු. මිලියන) | |
|---|---|---|
| | 2012 | 2013 |
| ස්ථාවර දුරකථන | 43,403 | 46,318 |
| ජංගම දුරකථන | 101,702 | 111,583 |
| ස්ථාවර සහ ජංගම දුරකථන | 145,105 | 157,901 |

2012 සිට 2013 දක්වා ස්ථාවර දුරකථන ක්ෂේත්‍රයේ ආදායම සියයට 6.7 වැඩි වී ඇති අතර එම කාලපරිච්ඡේදය තුළ ජංගම දුරකථන ආදායම සියයට 9.7 වැඩිවී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ මෙම අංශ දෙකේම සමස්ථ ආදායම සියයට 8.7 වැඩි වී ඇත. 2012 වර්ෂයේදී ස්ථාවර දුරකථන සහ ජංගම දුරකථනවල මුළු ආදායම සඳහා දායකත්වය පිළිවෙළින් සියයට 29.9 සහ සියයට 70.1 වී ඇත. 2013 වර්ෂය සඳහා අනුරූප සංඛ්‍යා පිළිවෙළින් සියයට 29.3 සහ 70.7 වැඩි වී ඇත (8.1 වගුව) එබැවින් ජංගම දුරකථන ක්ෂේත්‍රයේ පසුගිය වර්ෂ දෙක තුළ මුළු ආදායම සියයට 70 වඩා වැඩි දායකත්වයක් පෙන්නුම් කර ඇත.

**මුළු ආදායම සඳහා දායකත්ව ප්‍රතිශතය 2012-2013** (ප්‍රස්ථාරය 8.1)




## iii) විදුලි සංදේශ කර්මාන්තයේ ශුද්ධ ලාභය/ පාඩුව

2012 සහ 2013 වර්ෂවල දී ස්ථාවර සහ ජංගම දුරකතන අංශයේ ශුද්ධ ලාභය/පාඩුව පිළිබඳ වෙනස්කම් 8.3 වගුවේ දැක්වේ.

**ස්ථාවර සහ ජංගම විදුලි සංදේශ කර්මාන්තයේ ශුද්ධ ලාභය/පාඩුව 2012-2013** (8.3. වගුව)

| දුරකථන ක්‍රියාකාර සමාගම | ශුද්ධ ලාභය/පාඩුව (රු.මිලියන) | |
|---|---|---|
| | 2012 | 2013 |
| ස්ථාවර දුරකථන | 3,304 | 2,962 |
| ජංගම දුරකථන | (1,970) | (143) |
| ස්ථාවර සහ ජංගම දුරකථන | 1,334 | 2,819 |

2012 වර්ෂයේදී ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල ශුද්ධ ලාභය රුපියල් මිලියන 3,304 ක් වූ අතර 2013 වර්ෂයේදී එය රුපියල් මිලියන 2,962 දක්වා සියයට 10.4 ප්‍රතිශතයකින් අඩු විය. ජංගම දුරකථන සම්බන්ධයෙන් ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් 2012 මෙන්ම 2013 වර්ෂවලදී පාඩු ලබා ගෙන ඇත. කෙසේවුවද, 2012 සිට 2013 දක්වා පාඩුවේ අඩුවීමක් දක්වා ඇත. 2012 සිට 2013 දක්වා ජංගම දුරකථන කර්මාන්තයේ පාඩුව සියයට 93 ඉහළ හීනවීමක් පෙන්නුම් කර ඇති අතර ඒ අනුව 2012 සහ 2013 වර්ෂවලදී පාඩුව පිළිවෙලින් රුපියල් මිලියන 1,970 සහ රුපියල් මිලියන 143 විය. 2012 වර්ෂයේදී මෙම අංශ දෙකේ ශුද්ධ ලාභය රුපියල් බිලියන 1.3 වූ අතර 2013 වර්ෂයේදී එය රුපියල් බිලියන 2.8 ශුද්ධ ලාභයක් දක්වා වර්ධනය විය. ශුද්ධ ලාභය / පාඩුව පිළිබඳ වෙනස්වීම් 8.2 ප්‍රස්ථාරයේ දක්වා ඇත.

**දුරකතන ක්‍රියාකාර සමාගම්වල ශුද්ධ ලාභය/පාඩුව 2012-2013** *(ප්‍රස්ථාරය 8.2)*




## vi) දියුණු සහ නොදියුණු ප්‍රදේශවල ජාල ව්‍යාප්ත කිරීම සඳහා අරමුදල් යෙදවීම

සියළුම ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් ශ්‍රී ලංකාව තුළ අවසන් කරන සියළුම ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු (ITO බදු) ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වෙත ගෙවනු ලබයි. මෙම බදුවල නිශ්චිත ප්‍රතිශතය දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වෙත සෘජුවම ගෙවනු ලබන විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවක් වශයෙන් සලකනු ලැබේ. කොමිෂන් සභාව විසින් නිශ්චය කරන පරිදි දියුණු සහ නොදියුණු ප්‍රදේශවල විදුලි සංදේශ ජාල සංවර්ධනය කිරීම සඳහා වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ වාර්තාගත විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන් 2/3 සඳහා හිමිකම් කීමට විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලට අවසර ලැබේ. විශ්වීය සේවා බැඳීම් වලට පහසුකම් සැලසීම පිණිස විදුලි සංදේශ සංවර්ධන අරමුදල් යෙදවීම පිළිබඳ නිර්නායකයන් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් සකස් කරනු ලැබේ.

පසුගිය කාලපරිච්ඡේදය (2009/2010) තුළ ග්‍රාමීය ප්‍රදේශවල නව කුලුනු සහ මූලික මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1696 ක් සහ ග්‍රාමීය ප්‍රදේශවල නව ස්ථාවර දුරකථන 7700 ස්ථාපනය කිරීමට රුපියල් මිලියන 389 යෙදවීමට ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.

ඉහත අරමුදල් යෙදවීමේ ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කඩිනමින්, සාධාරණව සහ දැරිය හැකි මිල ගණන් යටතේ විදුලි සංදේශ සේවා ලබාදීම ප්‍රවර්ධනය කිරීම, රට පුරා විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීමේ ප්‍රවේශය ඉහල නැංවීම සහ ග්‍රාමීය, අඩු ආදායම්ලාභී නාගරික සහ නගරාසන්න ප්‍රජාව සඳහා සේවා ව්‍යාප්ත කිරීම සඳහා සේවා සැපයුම්කරුවන් දිරි ගැන්වීම සිදු කරයි. වඩා ඵලදායී ආකාරයෙන් විශ්වීය සේවා බැඳීම් සාක්ෂාත් කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් විදුලි සංදේශ සේවා සංවර්ධන අරමුදල විනිවිද පෙනෙන ආකාරයෙන් භාවිතා කර ඇත.

පරිච්ඡේදය

# 9 අනුකූලතා අංශය

**සමාලෝචනය**

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ සාධාරණ සහ කාර්‍යක්ෂම දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම නිසැක කිරීමය. මෙම කාර්‍යය සඳහා විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන් සාධාරණ, කාර්‍යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවා සැපයීම සඳහා ඔවුන්ගේ නියාමන බැඳීම්වල අනුකූලතාවය නිසැක කිරීම පිණිස නියාමන ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවයන් විදුලි සංදේශ ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ අදාල නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අඛණ්ඩව සිදු කරයි. පාරිභෝගික පැමිණිලි සම්බන්ධ කටයුතු සිදු කිරීම සහ පාරිභෝගිකයන් සෑහීමකට පත් වන ආකාරයෙන් ඔවුන්ගේ ප්‍රශ්නවලට සාධාරණ විසඳුම් ලබාදීම මෙන්ම සමස්ථයක් වශයෙන් විදුලි සංදේශ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ. මෙම වගකීම් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ අනුකූලතා අංශය විසින් සිදු කරනු ලැබේ.

## 9.1. කාර්‍යයන්

- දුරකථන ක්‍රියාකාර සමාගම් අන පනත්වලට සහ බලපත්‍රවලට අනුකූලව කටයුතු කරන්නේදැයි සහ දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා නිකුත් කරන ලද ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ විධිවිධාන, නියෝග සහ තීරණ අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- සේවා තත්ත්ව අධීක්ෂණය කිරීම.
- පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය ගැටළු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අදහසින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 9.2. කාර්‍යයසාධනය

### I) අධීක්ෂණ කටයුතු

මෙම අංශය මගින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පිරික්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම සිදු කරනු ලැබේ.

**i.** අයකුම, නීති විරෝධී ලෙස දුරකථන ඇමතුම් අවසන් කිරීම යනාදිය ඇතුළු බලපත්‍ර කොන්දේසි උල්ලංඝනය කිරීම.

**ii.** බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද සේවා සැපයීම.

**iii.** වෙළෙන්දන් විසින් මාදිලි අනුමැතිය ලබා නොදුන් පාරිභෝගික පරිශ්‍ර විදුලි සංදේශ උපකරණ විකිණීම සඳහා වෙළඳ ප්‍රචාරණ කටයුතුවල නිරතවීම සහ උපකරණ ඉදිරිපත් කිරීම.

**iv.** බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් විදුලි සංදේශ සේවා පිළිබඳව අසත්‍ය තොරතුරු ප්‍රකාශ කිරීම.

2013 වර්ෂයේදී, තරඟකාරීත්ව අංශය විසින් අයකුම උල්ලංඝනය කිරීමේ කරුණු රැසක් පිළිබඳ විමර්ශනයන් සිදු කර ඇත. තරඟකාරීත්ව අංශයේ වැඩසටහන් මෙන්ම මෙම අංශය වෙත ලැබෙන තොරතුරුවලට ප්‍රතිචාරීව විමර්ශනයන් සිදු කර ඇත. අනුමත කරන ලද පාදස්ථ මිලට වඩා අඩුවෙන් බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ලබාදුන් අයකුම පැකේජ තුළින්

අයකුම උල්ලංඝනය කිරීම් රැසක් සිදු විය. බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් එවැනි උල්ලංඝනය කිරීම් අවම කිරීම පිණිස නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### II). සේවා තත්ත්ව කටයුතු

කොමිෂන් සභාව විසින් නියම කරන ලද ප්‍රමිතිවලට අනුකූලව විදුලි සංදේශ සේවා සපයන බවට වග බලා ගැනීම පිණිස විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් සපයන විදුලි සංදේශ සේවාවල තත්ත්වය මෙම අංශය විසින් පිරික්සනු ලැබේ. සමාලෝචන වර්ෂය තුළ පහත සඳහන් කාර්‍යයන් සිදු කරන ලදී.

**i.** බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්/ බලපත්‍රලාභීන් විසින් සේවා තත්ත්ව ප්‍රමිති සහ රීති පිළිනොපැදීම පිළිබඳව කරුණු පිරික්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ මාදිලි අනුමැතිය ලබා දුන් පාරිභෝගික පරිශ්‍ර උපකරණවල පිරිවිතරයන් උල්ලංඝනය කිරීම.

**ii.** විකාශනය වන තාක්ෂණයන්ට අනුකූලව පවත්නා සේවා තත්ත්ව ප්‍රමිති සහ රීති සංශෝධනය කිරීම.

සේවා තත්ත්ව නියාමනය කිරීම සඳහා වර්තමානයේදී බලපවත්වන ව්‍යවස්ථාපිත රාමුව විකාශනය වන තාක්ෂණයන්ට සරිලන පරිදි සංශෝධනය කිරීම අවශ්‍ය වේ. එබැවින් 2013 වර්ෂයේ අවසන් කාර්තුවේදී ස්ථාවර සහ ජංගම හඬ සේවා සඳහා සේවා තත්ත්ව රාමුවක් ස්ථාපනය කිරීම පිණිස මහජන උපදේශන ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. මෙම මහජන උපදේශන ක්‍රියාවලියට සමගාමීව 2014 වර්ෂයේදී දැනට පවත්නා සේවා තත්ත්ව ප්‍රමිති සහ රීති සංශෝධනය කිරීම අවසන් කරනු ලැබේ.

### III). නැතිවූ ජංගම දුරකථන පිළිබඳ කරුණු මෙහෙයවීම

සමාජයීය බැඳීමක් වශයෙන් තරඟකාරීත්ව අංශය නැතිවූ දුරකථන සොයාදීමේ ක්‍රියාවලියේ ක්‍රියාකාරීව නිරත වේ. සාමාන්‍යයෙන්, නැතිවූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි 200 ක් පමණ මෙම අංශය වෙත ලැබෙන අතර මෙතෙක් ආසන්න වශයෙන් අයදුම්පත් 100,000 පමණ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් භාරගෙන ඇති අතර 2013 වර්ෂයේදී පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීමේ අංශය විසින් නැතිවූ දුරකථන රැසක් සොයාදීමට පොලීසියට සහාය වී ඇත.

### IV). මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී දුරකථන භාවිතය මෙන්ම ඒ ආශ්‍රිත වෙනත් කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම වැදගත් බව අනාවරණය විය. එබැවින් අනුකූලතා අංශය විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පවත්වා ඇත. විශේෂයෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිතව සිදුවන අපරාධ ඍජුවම මෙහෙයවන පොලිස් නිලධාරීන් සඳහා එක් දින වැඩමුළු රැසක් පවත්වා ඇත. මෙම වැඩමුළුවල සම්පත්දායකයන් විදුලි සංදේශ සේවා සපයන ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සහ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත විය.

තරඟකාරත්ව අංශය විසින් නුදුරු අනාගතයේදීම විදුලි සංදේශ ග්‍රාහකයන් බවට පත් වන පාසල් දරුවන් සඳහා තවත් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පාසල්වල වැඩසටහන් හයක් පවත්වා ඇත. දරුවන් සම්බන්ධ කරුණු හා ඍජුවම ගනුදෙනු කරන පාසල් ගුරුවරුන්, ගුරු උපදේශකයන්, පාසල් විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා තරඟකාරීත්ව අංශය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කර ඇත. බස්නාහිර පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේදී එවැනි එක් වැඩසටහනක් පවත්වා ඇත. එළැඹෙන වසරේදීත් මෙම වැඩසටහන් අඛණ්ඩව පැවැත්වීමට අපේක්ෂා කෙරේ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනේ එක් කොටසක් වශයෙන් තරඟකාරීත්ව අංශය විසින් පුවත්පත් ලිපි ( ආසන්න වශයෙන් 100 සංඛ්‍යාවක්) පළ කර ඇති අතර ගුවන් විදුලි / රූපවාහිනී වැඩසටහන් කිහිපයකට සහභාගී වී ඇත.

## v). පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම

**පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාවලිය** (9.1. ප්‍රස්ථාරය)



2010 වසරේ සිට සියයට සියය ඉක්මවා යන සංයුක්ත දුරකථන (ස්ථාවර සහ ජංගම) ව්‍යාප්ත අනුපාතය අනුව සඳහන් කර ඇති පරිදි පසුගිය කාලය තුළ ජංගම දුරකථන අංශය ප්‍රමුඛ විදුලි සංදේශ කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය කිරීමට ඉවහල් වන ක්ෂේත්‍රයක් වී ඇත. වැඩිදුරටත් විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් රැසක් සිය ඉහළ තරඟකාරීත්වය පවත්වා ගනිමින් වෙළඳපළට අවතීර්ණ වී ඇත. එමෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ මෙම ප්‍රවර්ධනයන්ට අනුගතව පොදු මහජනතාව විසින් ඉදිරිපත් කළ විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පැමිණිලි සංඛ්‍යාවේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. එබැවින්, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව පනතේ කොන්දේසිවලට අනුව පැමිණිල්ල විභාග කිරීම සඳහා පියවර ගෙන ඇත. ඒ අනුව අනුකූලතා අංශය විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධව පියවර ගෙන ඇත. ලැබෙන පැමිණිලි පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ සේවා සැපයුම්කරු වෙත යොමු කර ඇත. අනුකූලතා අංශය විසින් මේ සම්බන්ධයෙන් සේවා සැපයුම්කරු සමඟ ක්‍රියා කරන අතර පැමිණිලිකරු සඳහා සාධාරණ සහ යුක්තිසහගත විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇත. පැමිණිලිකරු විසින් සේවා සැපයුම්කරු විසින් ලබාදෙන විසඳුම් පිළිබඳව සෑහීමකට පත් නොවන්නේනම් අනුකූලතා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මැදිහත්වීමෙන් කරුණු සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් පාර්ශවයන් දෙකටම සලසා ඇත. ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව එවැනි ගැටළු පිළිබඳව ඒකමතික විසඳුම් වලට එළැඹීම සඳහා පාර්ශවයන් දෙකටම ඉඩ සලසා ඇත. පාරිභෝගික පැමිණිලි මෙහෙයවීමේදී නිරත පියවර 9.1 ප්‍රස්ථාරයේ දක්වා ඇත.

පරිච්ඡේදය

10

# නීති අංශය

## සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ව්‍යවස්ථාව ප්‍රකාරව බලය පැවරුණු නියාමන ආයතනයකි. නීතියේ ස්වාභාවික යුක්තියේ රීති ප්‍රකාරව කොමිෂන් සභාවට අර්ධ විනිශ්චයක කටයුතු සහ කොමිෂන් සභාවේ තීරණ, තීන්දු සහ නියෝග සම්බන්ධයෙන් බලය පැවරේ. කොමිෂන් සභාවේ නීති අංශය විසින් නීති උපදෙස් සපයමින් සහ පටිපාටි ස්ථාපනය කරමින් කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වෙමින් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. 2013 වර්ෂයේදී නීති අංශය විසින් සිදු කරන ලද සේවාවන් සහ කාර්යසාධනය පහත දැක්වේ.

## 10.1.සේවාවන්

- නීති උපදෙස් අවශ්‍ය කරුණු / ලේඛන සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නීතිමය මත/ උපදෙස් ලබාදීම.
- කොමිෂන් සභාව සඳහා නීති, රෙගුලාසි, නියෝග, නිර්නායකයන් සහ බලපත්‍ර කෙටුම්පත් කිරීම.
- නඩු සම්බන්ධයෙන් ගරු නීතිපති හෝ පුද්ගලික නීතිඥයන් වෙත කරුණු යොමු කිරීම.
- අධිකරණය ඉදිරියේ පවත්නා නඩු සහ අදාළ කෙටුම්පත් සැකසීම, ලිපිගොනු ඉදිරිපත් කිරීම යනාදී සියළුම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව සඳහා රාජකාරි ලිපි, වෙනත් ලිපි ලේඛන, කොමිෂන් සභා පත්‍රිකා, කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් කෙටුම්පත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 18 අ වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රමය නැවත විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- කොමිෂන් සභාවේ අනෙක් අංශවලට නීති සහාය ලබා දීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සහ 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ ගත යුතු පියවර බලාත්මක කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව වෙනත් ආයතනවලට නීති සහාය ලබාදීම.

## 10.2. කාර්ය සාධනය

2013 වර්ෂයේදී නීති අංශය විසින් සංඛ්‍යාත සඳහා බලපත්‍ර දීම, වෙළඳ බලපත්‍ර දීම, අයකුම, අනුකූලතා ගැටළු, පාරිභෝගිකයන් පිළිබඳ නියාමන කරුණු මෙන්ම පාලන සහ මානව සම්පත් කාර්යයන් සම්බන්ධ අභ්‍යන්තර නීතිමය කටයුතුවලදී කොමිෂන් සභාවට සහ කොමිෂන් සභාවේ අනෙකුත් අංශ/ ඒකකවලට සහාය ලබා දී ඇත. මෙම අංශයේ නිලධාරීන් විසින් නඩු වලදී ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වෙනුවෙන් අධිකරණයේ පෙනී සිට ඇත. ඇතැම් අධිකරණ නඩු වලදී ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව නීතිපති දෙපාර්තමේන්තුවේ සහ වෙනත් නීතිඥයන්ගේ සහාය ලබා ගෙන ඇත. නීති අංශයේ වියදම සඳහා 2013 වර්ෂයේදී වෙන් කළ අයවැයෙන් 25% කොමිෂන් සභාව විසින් වියදම් කර ඇත. නීති අංශය 2013 වර්ෂයේදී ඉටු කළ කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

**නඩු මගට බැසීම**

### 10.2.1. මහාධිකරණය / අභියාචන මහාධිකරණයේ ගොනු කළ නඩු

2013 වර්ෂයේදී මහාධිකරණයේ නඩු කිසිවක් ගොනු කර නැත.

අභියාචන මහාධිකරණයේ ගොනු කළ නඩු කිහිපයක් විභාග වෙමින් පවතී. මෙම නඩු මූලික වශයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ නියාමන තීරණවලට එරෙහිව විකාශන සමාගම් විසින් ගොනු කර ඇත.

### 10.2.2. අධිකරණය / විනිශ්චය සභාව සහ කොමිෂන් සභාව

2013 වර්ෂයේදී නීති අංශය විසින් නඩු ගණනාවක් ගොනු කර ඇති අතර දිස්ත්‍රික් උසාවිය, වෙළඳ මහාධිකරණයේ මුදල් අය කර ගැනීම පිළිබඳ කරුණු සහ කම්කරු විනිශ්චය සභාව සහ කර්මාන්ත අධිකරණය ඉදිරියේ ගොනු කළ නඩු සහ මානව සම්පත් ආශ්‍රිතව විහිදුනු කරුණු සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවලින් ඉදිරියට ගෙන ආ නඩු රැසක් පැවතිණි.

තවත් පාර්ශවයන් දෙකක් විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ (HRC) අභියාචනා දෙකක් ගොනු කරන ලදී. මෙහි තීරණ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවට පක්ෂව ලැබිණි.

නීති අංශය විසින් බලාත්මක කිරීමේ පරිශ්‍රමයේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත උල්ලංඝනය කරමින් සිදු කරන වැරදි වෙනුවෙන් අදාළ තැනැත්තන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඇත.

### 10.2.3. වෙනත් කරුණු

එමෙන්ම 2013 වර්ෂයේදී අන්තර්ජාලය ආශ්‍රිත පැමිණිලිවල ස්ථාවර වර්ධනයක් දක්නට ලැබී ඇත. උසාවි නියෝග සහ වෙබ් අඩවි පාලනය කිරීමේ බලතල සතු වෙනත් රාජ්‍ය ආයතන බලධාරීන්ගේ උපදෙස් මත ශ්‍රී ලංකාවේ ඇතැම් වෙබ් අඩවිවලට ප්‍රවේශවීමේ සීමාවන් පනවන ලදී. එමෙන්ම මෙම වර්ෂයේදී නීති අංශය විසින් ජංගම/ස්ථාවර දුරකථන සම්බන්ධතා පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීම් සම්බන්ධ උසාවි නියෝග රැසක් අරහයා කටයුතු කර ඇත.

පරිච්ඡේදය 11

# පාලන සහ ආයතනික කටයුතු අංශය

**සමාලෝචනය**

පාලන සහ ආයතනික කටයුතු අංශයේ (Administration and Corporate Affairs Division – ACAD) විෂයය පථය ඉතා පුළුල් වන අතර ආයතනයේ කාර්යයන් ප්‍රශස්ත ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා ඉතා වැදගත් කාර්‍යභාරයන් රැසක් ඉටු කිරීමෙහිලා නිරත වේ. සැලසුම්කරණය, සංවිධානය කිරීම, නිර්දේශ කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම; ආයතනය තුළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මෙන්ම ආයතනයෙන් බැහැර වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම; ආයතනික කටයුතු, ඇගයීම් කටයුතු, පුහුණු කටයුතු, ගෙවීම් නිර්දේශ කිරීම/ අනුමත කිරීම; භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනය කිරීම; ප්‍රවාහන පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලයේ ශුභ සාධන කටයුතු පරීක්ෂා කිරීම; කාර්යය තත්ත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස භෞතිකමය පාරිසරික ක්‍රමෝපායන් ඇති කිරීම සහ ඒවා පවත්වාගෙන යාම; තොරතුරු තාක්‍ෂණ පහසුකම් සහ පුස්තකාල පහසුකම් සැපයීම; කොමිෂන් සභාවේ වැදගත් සිදුවීම් පිළිබඳව මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම යනාදිය වැනි ක්ෂේත්‍රයන් රැසක් මීට ඇතුළත් වේ. මෙම වගකීම් පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් සිදු කරනු ලැබේ. පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් සිදු කරන කාර්‍යයන් සහ කාර්යසාධනය පහත දැක්වේ.

**11.1.කාර්යයන්**

- මානව සම්පත් කළමනාකරණය සහ පොදු පරිපාලනය සම්බන්ධයෙන් නීති, රෙගුලාසි සහ පටිපාටි පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථිර කිරීම, කාර්ය සාධන ඇගයීම, උසස් කිරීම, නිවාඩු වාර්තා, පැමිණීම, ස්ථාන මාරු, කාර්ය සාධන ඇගයීම, සහ විනය පරීක්‍ෂණ, සේවයෙන් නිදහස් කිරීම හා විශ්‍රාම ගැන්වීම සම්බන්ධ සියළුම කටයුතු සිදු කිරීම.
- කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම.
- අදාල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ උපදෙස් සහිතව එක් එක් තනතුරු සඳහා රැකියා පිරිවිතරයන් සැපයීම ඇතුළුව කොමිෂන් සභාව සඳහා කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.
- ජ්‍යෙෂ්ඨ කාර්ය භාර ප්‍රධානීන් සමඟ එක්ව මානව සම්පත් සංවර්ධන අයවැය පිළියෙල කිරීම.
- වාර්ෂික කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම.
- දේශීය සහ විදේශීය කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා සම්බන්ධීකරනය කිරීම සහ පුහුණු ලාභීන් සඳහා ගමන් බිමන්, ලියාපදිංචි කිරීම සහ අවශ්‍ය සෙසු කටයුතු පිළියෙල කිරීම.
- වාර්ෂික වාර්තාව, ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සඳහා අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂක සේවා, පවිත්‍රතා සේවා, ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම මෙන්ම යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදුලිය, ජලය සහ දුරකථන සේවා කාර්යක්ෂමව සැපයීමට වග බලා ගැනීම.

- වාහන සංඛ්‍යාව නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ මගින් සිදු කරන කාර්යයන් සඳහා නිසි සහයෝගය ලබා දීම.
- ගෙවීම අනුමත කිරීම /නිර්දේශ කිරීම.
- කොමිෂන් සභාවේ භාණ්ඩ පිළිබඳව ලේඛනය සහ ලේඛනාගාරය පවත්වාගෙන යාම.
- වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සහ අවශ්‍ය නොවන අයිතමයන් බැහැර කිරීම.
- මාධ්‍ය ඒකකය සහ තොරතුරු සහ ප්‍රලේඛන ඒකකය පාලනය කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම, විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යවසායක කමිටුව (COPE) සඳහා වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වැනි ආයතන සමග සම්බන්ධතා පවත්වා ගැනීම.
- වාර්ෂිකව පවත්වන දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගිවීම සම්බන්ධ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- වෘත්තීමය හිතකරභාවය සහ ආරක්ෂා අවශ්‍යතා සපුරාලීමට වග බලා ගැනීම.
- කාර්ය මණ්ඩලය සඳහා වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සේවා සැපයීම පිණිස සුභසාධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ මූල්‍ය සහ මූල්‍ය නොවන දිරිදීමනා පැකේජ සැපයීමට උපදෙස් ලබාදීම මෙන්ම අඩුපාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.
- ආයතනික සමාජ වගකීම් අරමුදල පවත්වාගෙන යාම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන් ඉටු කිරීම.
- කාර්යක්ෂම පුස්තකාල සේවාවක් සැපයීම.
- මාධ්‍ය ක්‍රියාකාරකම් පරිපාලනය කිරීම.

### 11.2. කාර්ය සාධනය

#### 11.2.1. කාර්ය මණ්ඩලය සහ ආයතනික ව්‍යුහය සංශෝධනය කිරීම

2013 දෙසැම්බර් 31 වන දින විට, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 08 දෙනෙකු, මධ්‍යම කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 26 දෙනෙකු, යටත් නිලධාරීන් 119 දෙනෙකු සහ කණිෂ්ට සේවක ශ්‍රේණිවල නිලධාරීන් 48 දෙනෙකු ඇතුළු මුළු කාර්ය මණ්ඩලය 201 දෙනෙකුගෙන් සමන්විත වේ.

1997 වසරේදී වැටුප් සහ සේවක සංඛ්‍යා කමිටුව විසින් අනුමත සේවක සංඛ්‍යාව සහ සංවිධාන ව්‍යුහය නිර්දේශ කරන ලදී. 1997 සහ 2012 අතර අවස්ථා 6 කදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශ්‍රීඝ්‍ර සංවර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්යයන් සහ වගකීම් පුළුල් කිරීම සැලකිල්ලට ගනිමින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, මධ්‍යම කළමනාකරණය, කණිෂ්ඨ කළමනාකරණය, යටත් නිලධාරීන් සහ ප්‍රාථමික මට්ටම නමින්; ස්ථර 5 කින් සමන්විතව සේවක සංඛ්‍යාව වැඩි කිරීමක් සහිතව නව සංවිධාන ව්‍යුහයක් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් අනුමත කර ඇත. වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් 2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී සංශෝධනය කරන ලද සේවක සංඛ්‍යාව සඳහා සිය අනුමැතිය ලබා දී ඇත.

කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පරිදි, සංශෝධනය කරන ලද සංවිධාන ව්‍යුහය 11.1 ප්‍රස්ථාරයේ දැක්වේ.



කොමිෂන් සභාව
(සාමාජිකයන් 5 - සභාපති, පත් කළ සමාජිකයන් 3 සහ අධ්‍යක්ෂ ජනරාල්)
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන, ජාල සහ තාක්ෂණ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ආර්ථික සහ නීති කටයුතු
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පාලන, ආයතනික කටයුතු සහ මූල්‍ය
අධ්‍යක්ෂ - වර්ණාවලි කළමණාකරන
අධ්‍යක්ෂ - බලපත්‍ර ජාත්‍යන්තර සම්බන්ධතා සහ ප්‍රතිපත්ති
අධ්‍යක්ෂ - ජාල සහ නව සේවා
අධ්‍යක්ෂ - ව්‍යාපෘති සහ පර්යේෂණ
අධ්‍යක්ෂ - තරගකාරීත්ව
අධ්‍යක්ෂ - අනුකූලතා
අධ්‍යක්ෂ - නීති කටයුතු
අධ්‍යක්ෂ - පාලන සහ ආයතනික කටයුතු
අධ්‍යක්ෂ - මූල්‍ය
අධ්‍යක්ෂ - විමර්ශන සහ ව්‍යාපාරික අධීක්ෂණ
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ සංඛ්‍යාත කළමණාකරන 11
අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ බලපත්‍ර, ජා.සම්බන්ධතා සහ ප්‍රතිපත්ති4
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ ජාල සහ නව සේවා 9
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ ව්‍යාපෘති සහ පර්යේෂණ 2
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ තරගකාරීත්ව 4
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ අනුකූලතා 4
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ නීති කටයුතු 4
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ ආයතනික කටයුතු /මාධ්‍ය/ඉංජිනේරු 5
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ මූල්‍ය 3
නි.අධ්‍යක්ෂ / ස.අධ්‍යක්ෂ විමර්ශන සහ අධීක්ෂණ 2
අභ්‍යන්තර විගණක 1
කොමිෂන් සභා ලේකම්
ජ්‍යෙෂ්ඨ වි.සං. නිලධාරි 2
ජ්‍යෙෂ්ඨ වි.සං. නිලධාරි 2
පරිපාලන නිලධාරි 2
පරිපාලන නිලධාරි 1
පරිපාලන නිලධාරි 1
වි.සං. නිලධාරි 13
වි.සං. නිලධාරි 3
වි.සං. නිලධාරි 10
වි.සං. නිලධාරි 2 පාරිභෝගික සම්බන්ධතා නිලධාරි 6
සභාපති/ප්‍ර.වි. නිලධාරි පෞද්. සහකාර 2 / භාෂා පරිවර්තක 2
සංඛ්‍යාන නිලධාරි 1 පරිගණක වැඩසටහන් සම්පාදක
පුස්තකාලයාධිපති 2 සම්බන්ධතා නිලධාරි වැඩසටහන් සම්පාදක
සංවර්ධන නිලධාරි 1
සංවර්ධන නිලධාරි 4
සංවර්ධන නිලධාරි 8
සංවර්ධන නිලධාරි 12
සංවර්ධන නිලධාරි 4
සංවර්ධන නිලධාරි 4
සංවර්ධන නිලධාරි 1
සංවර්ධන නිලධාරි 1
තොරතුරු තාක්ෂණ සහකාර 5
තොරතුරු තාක්ෂණ සහකාර 2
තොරතුරු තාක්ෂණ සහකාර 2
තොරතුරු තාක්ෂණ සහකාර 1
තොරතුරු තාක්ෂණ සහකාර 2
තොරතුරු තාක්ෂණ සහකාර 1
තොරතුරු තාක්ෂණ සහකාර 1
තොරතුරු තාක්ෂණ සහකාර 1
තො.සා.සහකාර 1 වි.සැ.ශි. 1/ ජා.ශි. 1 වි.සංස්. 1
තොරතුරු තාක්ෂණ සහකාර 2
තොරතුරු තාක්ෂණ සහකාර 1
පරිගණක සහකාර 3
කළමණාකාර සහකාර 8
කළමණාකාර සහකාර 3
කළමණාකාර සහකාර 5
කළමණාකාර සහකාර 4
කළමණාකාර සහකාර 5
කළමණාකාර සහකාර 3
කළමණාකාර සහකාර 14
කළමණාකාර සහකාර 2
කළමණාකාර සහකාර 2
කළමණාකාර සහකාර 7
කළමණාකාර සහකාර 3
කළමණාකාර සහකාර 3
කළමණාකාර සහකාර 1
විදුලි කාර්මික 1 රියදුරු 21
ආලෝක ශිල්පී 1 කැමරා ශිල්පී 1 සංස්. ශිල්පී 1
කාර්යාල කාර්ය සහයක 4
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 3
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 4 උද්‍යාන කම්කරු 2
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1
කාර්යාල කාර්ය සහයක 1

### 11.2.2. වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීම

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව 1996 අංක 27 දරන විදුලි සංදේශ සංශෝධන පනත යටතේ ස්ථාපනය කරන ලද නියාමන ආයතනයක් වන අතර, කොමිෂන් සභාවට නිලධාරීන්ට සහ සේවකයන්ට "ගෙවිය යුතු වැටුප් නියම කිරීමේ" බලතල පැවරී ඇත. ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව ලොව සෙසු බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේද සැලකිය යුතු ඉහළ වැටුපක් ලබන විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ඉංජිනේරුවන් සහ තාක්‍ෂණිකවේදීන් ඇතුලු ඉහළ නිපුණතාවයකින් හෙබි සහ දක්ෂ කාර්ය මණ්ඩලයක් අවශ්‍ය කරන ඉතා ක්‍රියාකාරී සහ තාක්‍ෂණිකමය දියුණුවක් සහිත ක්ෂේත්‍රයක කටයුතුවල නිරත වේ.

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් උත්පාදනය කරන කැපී පෙනෙන ආදායම් ප්‍රමාණයෙන් විශාල කොටසක් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා යොදා ගන්නා අතර තවත් විශාල ප්‍රමාණයක් රජයේ ගිණුම් වලට බැර කරයි. එබැවින්, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව රාජ්‍ය ආදායම සඳහා ප්‍රධාන දායකයකු වෙනුවට, මහා භාණ්ඩාගාරය වෙත බරක් පැටවී නැත. මෙම ආදායම කාර්ය මණ්ඩලයේ දක්‍ෂතාවය යොදා ගැනීම සහ වැඩ කිරීමේදී ඔවුන් දැක්වූ කැපකිරීම මගින් උත්පාදනය කර ඇති බැවින්, ඔවුන් සඳහා නිසි සහ සාධාරණ වැටුපක් ගෙවිය යුතුවේ.

චක්‍රලේඛ DMS/30/2006 සහ DMS/30/2006(1) හි සඳහන් පරිදි රාජ්‍ය සහ රාජ්‍ය ව්‍යවසායකයන්ට අදාළ මූලික වැටුප් ව්‍යුහය වසර 7 වැඩි කාලයක් සංශෝධනය කර නොමැති අතර අඩු මිලදී ගැනීමේ හැකියාව මත සේවකයින්ගේ ගැටළුවලට සහන සැලසීම පිණිස ජීවන වියදම ඉහළ යාමට සමගාමීව ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනාව වැනි දීමනා කීපයක් හඳුන්වා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය සහ සුරකුම්පත් කොමිෂන් සභාව වැනි නියාමන ආයතන කීපයක් රාජ්‍ය අංශයේ ඉහත චක්‍රලේඛවලින් බැහැරව, දිගු කාලයක් තිස්සේ ස්වකීය වැටුප් ව්‍යුහයන් යොදා ගෙන ඇත.

ඉහත කරුණු සහ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය සඳහා පොදු වැටුප් ව්‍යුහයක් යොදා ගැනීමේදී මතු වන දුෂ්කරතා සලකා බලා, 2013 අගෝස්තු මස 01 වන දින සිට බලපවත්වන පරිදි නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දී ඇත.

### 11.2.3. කාර්යාල චක්‍රලේඛන නිකුත් කිරීම සහ කාර්යාල පටිපාටි හඳුන්වාදීම

2013 වසරේදී, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අදාළ ක්ෂේත්‍රයන් කාර්යක්‍ෂම කිරීම සහ ආයතනයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම පිණිස පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් කාර්යාල චක්‍රලේඛන නිකුත් කරන ලදී.

- පුහුණු වැඩසටහන් / වැඩමුළු/ සම්මන්ත්‍රණ / අධ්‍යයන කණ්ඩායම් රැස්වීම් සඳහා විදේශගතවීම පිළිබඳ වාර්තා කිරීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වෙත ලැබෙන කාර්යාල ලියකියවිලි සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම.
- මූල්‍ය රෙගුලාසි අංක 135- අංක 139 සහ 142- 144 ප්‍රකාරව 2013 වර්ෂය සඳහා මූල්‍යය බලය පැවරීම.
- කාර්යාල භාණ්ඩ, උපකරණ, දේපළ පිළිබඳ වාර්තා පවත්වාගෙනයාම සහ එම වත්කම් පැවරීම.
- ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලද වවුචර් පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය විසින් කාර්යාල පටිපාටි පිළිපැදීම මගින් වඩා නිවැරදිව සහ කාර්‍යක්‍ෂම ආකාරයෙන් සේවාව සැපයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීම.

- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සේවකයන්ගේ විශ්‍රාම ගැනීමේ වයස.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීමේදී දැනට බලපවත්වන මූල්‍ය - ප්‍රවාහ කළමණාකරන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.
- අතිකාල වැඩවල නිරතවීම.

### 11.2.4. පුහුණු කිරීම

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම, නිපුනතා වර්ධනය කිරීම හා ආකල්ප වෙනස් කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා සේවකයන්ට ලබා දී ඇත. 2013 වසර තුළ පුහුණු වැඩසටහන් / ශිෂ්‍යත්ව / සම්මන්ත්‍රණ වලට අදාල තොරතුරු 11.1 වගුවේ දැක්වේ.

### අ) විදේශීය පුහුණු වැඩසටහන්

**ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය පුහුණු වැඩසටහන්/ශිෂ්‍යත්ව/සම්මන්ත්‍රණ වලට සහභාගිවීම 2013** (11.1. වගුව)

| පුහුණුවේ / ශිෂ්‍යත්වයේ / සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට (අවු/මාස/දින) | දක්වා (අවු/මාස/දින) | |
| සයිබර් ආරක්ෂණය පිළිබඳ වැඩමුළුව | කැමරූන් | 2013.04.20 | 2013.04.29 | 1 |
| ජී එස් එම් ජංගම ලෝක මහ සභාවේ අමාත්‍ය වැඩසටහන | ස්පාඤ්ඤය | 11-පෙබ.-14 | 11-පෙබ.-16 | 3 |
| එළැඹෙන ඩිජිටල් විබෙදුම් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා හා විද්‍යුත් භාවිතයන් | ජපානය | 13-ජන.-13 | 13-පෙබ.-2 | 1 |
| සේවා අංශයේ ඵලදායීතාවය පිළිබඳ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ බලපෑම සම්බන්ධ වැඩමුළුව | ඉරානය | 13-ජන.-18 | 13-ජන.-25 | 1 |
| පුළුල් කළාප ජාල යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට සහායවීම පිණිස ගෘහස්ථ ෆයිබර් සහ රැහැන් රහිත ප්‍රවේශ තාක්ෂණයන් | ජපානය | 13-ජන.-20 | 13-පෙබ.-2 | 1 |
| තොරතුරු සැලසුම් නිගමනය සඳහා චීනයට උපදේශන චාරිකාව | චීනය | 13-ජන.-25 | 13-පෙබ.-13 | 10 |
| පාරිසරික සහ දේශගුණික වෙනස්කම් පිළිබඳ ITU-T අධ්‍යයන කණ්ඩායම 5 රැස්වීම | ස්විට්සර්ලන්තය | 13-ජන.-28 | 13-පෙබ.-9 | 1 |
| තොරතුරු සැලසුම් නිගමන පිළිබඳ චීන උපදේශන චාරිකාව | චීනය | 13-ජන.-28 | 13-පෙබ.-3 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ 6 වන විද්‍යුත් රාජ්‍ය අප්‍රිකානු සමුළුව | බොට්ස්වානා | 13-මාර්තු-3 | 13-මාර්තු-11 | 1 |
| ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ රැස්වීම -12 හා ජාත්‍යන්තර විදුලි සංදේශ ලෝක සමුළුව 12 හා ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රමිතිකරණ වැඩසටහනේ නිගමන පිළිබඳ සමුළුව | තායිලන්තය | 13-මාර්තු-6 | 13-මාර්තු-16 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායමේ 14 වන රැස්වීම | තායිලන්තය | 13-මාර්තු-17 | 13-මාර්තු-22 | 1 |
| ආසියා හා ශාන්තිකර පිරිවැය හා අයකුම පිළිබඳ සම්මන්ත්‍රණය හා SG3RG-AO රැස්වීම | ජපානය | 13-අප්‍රේල්-7 | 13-අප්‍රේල්-11 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමයේ බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සහභාගිවීම | එක්සත් රාජධානිය | 13-අප්‍රේල්-26 | 13-මැයි-2 | 1 |

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට (අවු/මාස/දින) | දක්වා (අවු/මාස/දින) | |
| දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ 14 වන රැස්වීම | මාලදිවයින | 13-මැයි-13 | 13-මැයි-17 | 1 |
| ISDB-T VI රැස්වීමේ ජාත්‍යන්තර සමුළුව | උරුගුවේ | 13-මැයි-24 | 13-ජුනි-1 | 2 |
| චන්ද්‍රිකා දියත් කිරීම සහ සම්බන්ධීකරණය පිළිබඳ කලාපීය වැඩමුළුව | ඉන්දුනීසියාව | 13-මැයි-2 | 13-ජුනි-6 | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 2013 මහා සභා වාරය | ස්විට්සර්ලන්තය | 13-ජුනි-9 | 13-ජුනි-23 | 3 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මානව සම්පත් සංවර්ධන ප්‍රවීනයන්ගේ 2 වන රැස්වීම | තායිලන්තය | 13-ජුනි-11 | 13-ජුනි-13 | 2 |
| WRC 15 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සමුළුවේ ප්‍රාරම්භක කණ්ඩායමේ 2 වන රැස්වීම | තායිලන්තය | 13-ජුනි-29 | 13-ජුලි-7 | 1 |
| විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ 13 වන ගෝලීය සමුළුව | පෝලන්තය | 13-ජුලි-1 | 13-ජුලි-8 | 2 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කාර්ය කණ්ඩායම 5D | ජපානය | 13-ජුලි-8 | 13-ජුලි-19 | 1 |
| ආපදා කළමනාකරණය/සන්නිවේදනය පිළිබඳ වැඩමුළුව | පිලිපීනය | 13-ජුලි-22 | 13-ජුලි-26 | 1 |
| ප්‍රතිපත්තිරීති සහ සේවා පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ වැඩමුළුව | නේපාලය | 13-ජුලි-29 | 13-අගෝ.-3 | 2 |
| ඇමරිකා එක්සත් ජනපද විදුලි සංදේශ පුහුණු ආයතනය | ඇමරිකා එක්සත් ජනපදය | 13-අගෝ.-6 | 13-අගෝ.-17 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධන 10 වන සමුළුව | බංග්ලාදේශය | 13-අගෝ.-19 | 13-අගෝ.-23 | 1 |
| කොරියානු අධ්‍යයන වැඩසටහන | කොරියාව | 13-සැප්.-1 | 13-සැප්.-7 | 1 |
| ITU-D අධ්‍යයන කණ්ඩායම 4 වන රැස්වීම | ජිනීවා | 13-සැප්.-7 | 13-සැප්.-22 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රමිතිකරණ වැඩසටහනේ 22 වන සමුළුව | තායිලන්තය | 13-සැප්.-8 | 13-සැප්.-16 | 1 |
| IPMAN හා එහි භාවිතයන් | චීනය | 13-සැප්.-11 | 13-සැප්.-19 | 1 |
| අධ්‍යයන කණ්ඩායම 2 රැස්වීම | ජිනීවා | 13-සැප්.-16 | 13-සැප්.-20 | 1 |
| කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය | චීනය | 13-සැප්.-21 | 13-සැප්.-30 | 14 |
| වර්ණාවලි කළමනාකරණ පුහුණු පාඨමාලාව | ඉන්දියාව | 13-සැප්.-22 | 13-සැප්.-28 | 1 |
| මහාසභා රැස්වීම | තායිලන්තය | 13-සැප්.-23 | 13-සැප්.-26 | 1 |
| ඩිජිටල් ආර්ථිකය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ 2 වන වැඩමුළුව | චීනය | 13-සැප්.-23 | 13-සැප්.-28 | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය- 53 වන මහා සභා රැස්වීම | නයිජීරියාව | 13-ඔක්.-5 | 13-ඔක්.-15 | 2 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රතිපත්ති සහ රීති පිළිබඳ 13 වන සමුළුව | මැලේසියාව | 13-ඔක්.-7 | 13-ඔක්.-11 | 1 |
| ITU-KCC ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | කොරියාව | 13-ඔක්.-13 | 13-ඔක්.-19 | 1 |

| පුහුණුවේ/ශිෂ්‍යත්වයේ/සම්මන්ත්‍රණයේ විෂය පථය | රට | කාලසීමාව | | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | සිට (අවු/මාස/දින) | දක්වා (අවු/මාස/දින) | |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 2 හා 3 වන මහා සභා රැස්වීම | ඕස්ට්‍රේලියාව | 13-ඔක්.-21 | 13-නොවැ.-1 | 1 |
| Cloud Computing | ඉන්දියාව | 13-ඔක්.-27 | 13-ඔක්.-2 | 1 |
| තොරතුරු තාක්ෂණ රීති පිළිබඳ සම්මන්ත්‍රණය | තුර්කිය | 13-නොවැ.-2 | 13-නොවැ.-6 | 1 |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 37 වන කමිටු රැස්වීම් වාරය | වියට්නාමය | 13-නොවැ.-4 | 13-නොවැ.-9 | 1 |
| ඵලදායී වැටුප් ප්‍රතිපත්ති පිළියෙල කිරීම | ඉතාලිය | 13-නොවැ.-24 | 13-නොවැ.-30 | 1 |
| රැහැන් රහිත අධිවේගී අන්තර්ජාල සේවා සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිරික්සීම | ජපානය | 13-නොවැ.-25 | 13-දෙසැ.-5 | 1 |
| ජාල ආරක්ෂණය පිළිබඳ 17 වන රැස්වීම | පිනීවා | 13-අගෝ.-25 | 13-සැප්.-6 | 1 |
| අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රවේශ ජාල තාක්ෂණය | ජපානය | 13-දෙසැ.-1 | 13-දෙසැ.-14 | 1 |
| ඊළඟ පරම්පරාවේ ජංගම සන්නිවේදන පද්ධතිය පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම | ජපානය | 13-දෙසැ.-10 | 13-දෙසැ.-20 | 1 |

## ආ) දේශීය පුහුණු වැඩසටහන්

| වැඩසටහන | කාලපරිච්ඡේදය සහ ස්ථානය | කාලපරිච්ඡේදය සහ ස්ථානය |
|---|---|---|
| රාජ්‍ය අංශයේ පරිපාලන නිලධාරීන් සඳහා ඵලදායීතා කළමනාකරණය | දින 2- සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 1 |
| අයවැය සම්මන්ත්‍රණය - 2014 | දින 1- ගලදාරී හෝටලය | 1 |
| "අයවැය විශේෂ කරුණු 2014 " පිළිබඳ සම්මන්ත්‍රණය | දින 1- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | 1 |
| දිගු කාලීන පරිණාමය (LTE) පිළිබඳ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම | දින 10 - ටෙලිකොම් විද්‍යායතනය | 12 |
| වරලත් ගණකාධිකාරවරුන්ගේ ජාතික සම්මන්ත්‍රණය | දින 2- වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය | 2 |
| කාර්යක්ෂම ආලෝකකරණයට සංක්‍රමණයවීම | ගලදාරී හෝටල- කොළඹ | 3 |
| අග්නිදිග ආසියානු කලාපීය පරිගණක සංසදය 2013 ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | දින 2- ගලදාරී හෝටලය කොළඹ | 1 |
| CMA ජාත්‍යන්තර කළමනාකරණ ගණකාධිකරණ සම්මන්ත්‍රණය 2013- "පිරිවැය කාර්යක්ෂමතාවය මගින් තිරසාර අගය සැකසීම" | දින 2- සිනමන් ලේක් සයිඩ්,කොළඹ | 3 |

### 11.2.5. ප්‍රසම්පාදන කටයුතු

මෙම අංශය මගින් කොමිෂන් සභාව වෙත විවිධ භාණ්ඩ සහ සේවා වර්ග සැපයීමේ සියළුම කටයුතු සම්බන්ධීකරණය කරයි. මෙම කටයුතුවලට ලංසු ලේඛන පිළියෙල කිරීම, දැන්වීම් පළ කිරීම, ප්‍රසම්පාදන කමිටු (PCs) හා තාක්ෂණික ඇගයීම් කමිටු (TECs) පත් කිරීම, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම, තෝරාගත් පාර්ශවයන්ට තීරණ දැනුම්දීම, සේවා සැපයුම්කරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථා වලදී නීති අංශයේ සහයෝගීත්වය ඇතිව සේවා ගිවිසුම් සකස් කිරීම මෙන්ම සේවා ගිවිසුම් උල්ලංඝනය වූ අවස්ථා දක්නට ලැබුන විට ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම ඇතුළත් වේ.

සමාලෝචන කාලපරිච්ඡේදය තුළදී පවත්වන ලද කනිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර් මණ්ඩල සංඛ්‍යාව පිළිවෙළින් 04 සහ 05 ක් වේ. කනිෂ්ඨ ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද මුළු ප්‍රසම්පාදන අගය රුපියල් මිලියන 1.66 ක් වූ අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සිවිල් නඩත්තු වැඩ සඳහා උපරිම ස්ථාවර මිල ගණන් වෙනුවෙන් අනුමැතිය ලබා දෙන ලදී. ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද මුළු ප්‍රසම්පාදන අගය රුපියල් බිලියන 1.93 ක් විය. ඒ අනුව මෙම ටෙන්ඩර් මණ්ඩල දෙක විසින් අනුමත කරන ලද මුළු ප්‍රසම්පාදන අගය රුපියල් බිලියන 1.932 ක් විය.

පාලන අංශය විසින් විදුලිය, ජලය හා දුරකථන සේවා කාර්යක්ෂමව සැපයීමට මෙන්ම ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සියළුම අංශ වලට ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, යන්ත්‍ර වැනි දෑ කලට වේලාවට සැපයීමට වග බලා ගෙන ඇත.

ඉහත ක්‍රියාකාරකම්වල ප්‍රධාන පරමාර්ථය වූයේ ආයතනයේ කාර්යයන් මැනවින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සේවා සහ ද්‍රව්‍ය නිසි කලට පාරදෘශ්‍ය, පිරිවැය ඵලදායී හා සාධාරණ ලෙස සැපයීමය.

### 11.2.6. වාහන පද්ධතිය නඩත්තු කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන පද්ධතිය කාර් දාහතරකින්, ඩබල් කැබ් රථ තුනකින්, ජීප් තුනකින්, වෑන් හතරකින්, බස් රථයකින්, ලොරි හතරකින් හා එක් ත්‍රී වීල් රථයකින් සමන්විත වේ. බස් රථය නිරීක්ෂණ චාරිකා, ප්‍රදර්ශන වැඩ කටයුතු සඳහා නිලධාරීන් ප්‍රවාහනය කිරීම සහ කාර්ය මණ්ඩලයේ සුභසාධන කටයුතු වැනි කාර්යයන්ට යොදවන ලදී. වාහන කිහිපයක් වාහන පහසුකම් ලබා ගැනීමට හිමිකම් තිබෙන නිලධාරීන්ට වෙන් කරනු ලැබූ අතර ඉතිරි වාහන නිරීක්ෂණ චාරිකා, රැස්වීම / වැඩමුළු / සම්මන්ත්‍රණ ආදියට සහභාගි වීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම. තැපැල රැගෙන ඒම, කාර්යාල ලිපි අතින් බෙදීම වැනි කටයුතු සඳහා භාවිතා කරන ලදී. වාහන පද්ධතිය අළුත්වැඩියා කිරීම හා ටයර් සහ බැටරි ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2013 වසර තුළදී රුපියල් මිලියන 7.07 මුදලක් වැය කරන ලදී.

### 11.2.7. සමීක්ෂණ මණ්ඩලය

2012 වර්ෂය සඳහා වන වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය 2013 ජනවාරි මාසයේදී සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ඒ සඳහා පත් කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් සිදු කරන ලදී. මණ්ඩලයේ වාර්තාව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

### 11.2.8. දැයට කිරුළ ප්‍රදර්ශනයේ වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබාදීමේ මහින්ද චින්තන අරමුණුවලට සමගාමීව අම්පාර දිස්ත්‍රික්කයේ හාඩි උසස් තාක්ෂණ ආයතන පරිශ්‍රයේ 2013 වර්ෂය සඳහා දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය පවත්වන ලදී. පාලන හා ආයතනික කටයුතු අංශය විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සෙසු අංශවල සහයෝගීත්වය ඇතිව ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ප්‍රදර්ශන කුටිය සංවිධානය කරන අතර ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් සපයන සේවාවන් සම්බන්ධයෙන් මහජනතාවට වැදගත් තොරතුරු සපයන අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව සංවර්ධන ප්‍රවනතාවයන් ප්‍රදර්ශනය කරයි. පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් සංවිධායක

කමිටු පත් කිරීම, සුදුසු ප්‍රදර්ශන භූමියක් ලබා ගැනීම, ප්‍රදර්ශන භාණ්ඩ සහ කාර්ය මණ්ඩලය ප්‍රවාහනය සහ නවාතැන් පහසුකම් සැලසීම සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 11.2.9. සුභ සාධක සංගමය

කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සුභ සාධක සංගමය වාර්ෂික නිලවරණ රැස්වීමේදී පත්කළ විධායක කමිටුවක කළමනාකාරිත්වය යටතේ වන ස්වාධීන ආයතනයක් වශයෙන් සලකනු ලැබේ. සුභ සාධක සංගමයේ අරමුදල වාර්ෂික නිලවරණයේදී පත් කර ගන්නා ලද විගණකවරයකු විසින් සිදු කරන විගණනයට යටත්ව පාලනය කරනු ලැබේ.

### 11.2.9.1. සුභ සාධන කටයුතු

සමාලෝචන කාලපරිච්ඡේදය තුළදී පහත සඳහන් සුභ සාධන කටයුතු සිදු කරන ලදී.

#### i. ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

කාර්ය මණ්ඩලයේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ මූල්‍ය ස්ථාවරභාවය සහ සුභ සාධන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් නව ව්‍යවස්ථාවක් සම්මත කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවට අනුයුක්ත සියළුම සේවකයන් සඳහා සාමාජිකත්වය විවෘත වන අතර සාමාජිකයන් සඳහා තවදුරටත් සුභ සාධන පහසුකම් සැලසිය හැකිය.

#### ii. ආපන ශාලාව සහ සුභ සාධන අලෙවිසැල

- සහනාධාර මිල ගනන් යටතේ මනා ගුණාත්මකභාවයකින් යුතුව උදේ ආහාරය, දිවා ආහාරය සහ හවස අමතර ආහාරපාන, හවස නිවසට රැගෙන යාමට සාදන ආහාර මෙන්ම අභ්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය ආහාර වැනි දෛනික අවශ්‍යතාවයන් සැපයීම පිණිස සිය සුභ සාධන සේවාවල කොටසක් වශයෙන් සුභ සාධක සංගමය විසින් ආපන ශාලාව කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ.
- ආපන ශාලාවේ සේවා උසස් කරලීම සහ වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කළමනාකාරිත්වයේ සහයෝගීත්වය ඇතිව මුළුතැන්ගෙයි උපකරණ මිලදී ගන්නා ලදී.
- අමුත්තන් සඳහා අමතර ආහාර පාන සහ තේ සැපයීම පිණිස ආපන ශාලාව මගින් සිය සේවා ව්‍යාප්ත කරන ලදී.
- සුභ සාධක සංගමය විසින් එහි සුභ සාධන කටයුතුවල කොටසක් වශයෙන් කාර්ය මණ්ඩලයට දිනකට දෙවරක් උසස් ගුණාත්මකභාවයෙන් යුතු තේ රස අත්විඳීමට සහාය වෙමින් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලයට දෛනික තේ සැපයීමේ සේවා සිදු කර ඇත.
- සුභ සාධක අලෙවිසැල මගින් එහි සේවාවන් වැඩිදියුණු කිරීම පිණිස එහි තත්ත්වය උසස් කිරීම හා වෙනස් කිරීම සිදු කර ඇති අතර විවිධ වර්ග වලින් යුතු ආහාර හා පාන අයිතමයන් අඩු මිල ගනන් තුළ පහසු ගෙවීම් ක්‍රමය යටතේ විකුණා ඇත.



*සුභ සාධක සංගමය විසින් සිය කළමනාකාරිත්වය භාර ගැනීමෙන් අනතුරුව ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ ආපන ශාලාව විවෘත කිරීම*

### iii. ආගමික කටයුතු

- 2013 මැයි මස 15 වන දින සුභ සාධක සංගමය මගින් ආපන ශාලාව විවෘත කිරීම සහ වෙසක් පෝය දින නිමිති කරගෙන දානමය පිංකමක් සංවිධානය කළ අතර ඒ සඳහා තෝරා ගන්නා ලද්දේ නුගේගොඩ ගංගොඩවිල බාලිකා නිවාසයයි. සුභ සාධක සංගමයේ සහ ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ අනුග්‍රාහකත්වය, උපදෙස් සහ මඟපෙන්වීම ඇතිව අභ්‍යාස පොත්, ලිපිද්‍රව්‍ය, චමිලා රූපසිංහ මහත්මිය විසින් ලියන ලද කතන්දර පොත, පලතුරු හා වෙනත් ආහාර ද්‍රව්‍ය එදින දිවා ආහාරය සැපයීමට අමතරව පරිත්‍යාග කරන ලදී. දානමය පිංකමින් අනතුරුව බාලිකා ළමා නිවාසයේ දැරිවියන් විසින් ඔවුන්ගේ දක්ෂතා ඉදිරිපත් කරන ලදී.

- වෙසක් හා පොසොන් ආගමික කටයුතුවල කොටසක් වශයෙන්,සුභ සාධක සංගමය විසින් දහම් වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. ධර්ම දේශනය පැවත්වීම



*නුගේගොඩ බාලිකා නිවාසය සඳහා අධාර ලබාදීම*

සඳහා සංගමය විසින් කොරතොට වෙස්සභූ ස්වාමීන් වහන්සේට ආරාධනා කරන ලද අතර එය බෞද්ධයා නාලිකාව ඔස්සේ විසුරුවා හරින ලදී. මෙම අවස්ථාවේදී සංගමය විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය අතර ගරුතර කුකුලුපානේ සුදස්සි හිමිපාණන් විසින් ලියන ලද පොතක් බෙදා හරින ලදී.



*ශ්‍රී.ල.වි.ස.නී.කො.සභා පරිශ්‍රයේ වෙසක් ධර්ම දේශනය පැවැත්වීම*

එමෙන්ම සුභ සාධක සංගමය විසින් සුවිශාල වෙසක් පහන් කූඩු සකස් කරමින් ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව වෙසක් පහන් කූඩුවලින් ආලෝකමත් කරන ලදී. ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු වන සුමින්ද සිල්වා සහ ඩබ්.එම්. තරිඳු දර්ශන පත්ම කුමාර යන මහත්වරුන් විසින් මෙම කටයුතු වලදී පෙරමුණ ගෙන ක්‍රියා කළ අතර සෙසු කාර්ය මණ්ඩලය විසින් මෙම කාර්යය සිදු කිරීම සඳහා සිය සහයෝගය ලබා දෙන ලදී.

## IV විනෝදාස්වාදී වැඩසටහන්

- රාජ්‍ය නිලධාරීන් අතර ප්‍රචලිත "ලිපිගොනුවේ සොඳුරු මිනිසා" නැමති ගුවන් විදුලි වැඩසටහන 2013 ජූලි 15 දින ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්යාල පරිශ්‍රයේදී පටිගත කරන ලදී. මෙම වැඩසටහනට ගායක, ගායිකාවන් දහතුන් දෙනෙකු (13) සහභාගී වෙමින් සිය දක්ෂතාවයන් ප්‍රදර්ශනය කරන ලදී. මෙම වැඩසටහන 2013 අගෝස්තු 14 වන දින ස්වදේශීය සේවයෙන් ප්‍රචාරය කරන ලදී.



*ගුවන් විදුලි වැඩසටහන පටිගත කරමින්*

- කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව කාර්ය මණ්ඩලය විසින් කාර්යාල වේලාවෙන් පසුව සංගීතය ඉගෙන ගැනීම හා පුහුණුවීම සිදු කළ අතර ආර්.එන්.පී.කේ. රත්නපාල මහතා විසින් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත සංගීත කණ්ඩායමක් සකස් කරන ලදී.

- සුහසාධක සංගමය සඳහා තේමා ගීතයක් ලිවීම පිණිස තරඟයක් පවත්වන ලදී. එහිදී හොඳම ගීත රචනාව ස්වාධීන කමිටුවක් විසින් තෝරන ලද අතර එය සුහසාධක සංගමයේ තේමා ගීතය වශයෙන් පිළිගැනීමට තීරණය කෙරිනි.

## V.සෞඛ්‍යය සේවා සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

- ජාතික රුධිරය එකතු කිරීමේ මධ්‍යස්ථානය විසින් කරන ලද ඉල්ලීමෙන් අනතුරුව සුහසාධක සංගමය විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො.සභා කාර්යාලයේදී ලේ දන්දීමේ ව්‍යාපාරයක් සංවිධානය කරන ලද අතර මෙම වැදගත් අවස්ථාව සඳහා සාමාජිකයන් 35 දෙනෙකුට වැඩි පිරිසක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය.



*ශ්‍රී.ල.වි.ස.නි.කො.සභා පරිශ්‍රයේදී පැවති ලේ දන්දීමේ ව්‍යාපාරය*

- සුභසාධක සංගමය විසින් සීමාසහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් පහසු ගෙවීමේ පදනම මත (Pure It) ජල පෙරන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන්ට පහසුකම් හා අවස්ථාව සලසන ලදී.
- අක්ෂි ආරක්ෂණ ආයතනය මගින් අක්ෂි සායනයක් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර පහසු ගෙවීමේ පදනම මත කාර්යාල පරිශ්‍රයේදී ජේ.ඒ. ජයසිංහ අක්ෂි විශේෂඥයන් වෙතින් ඇස් කණ්ණාඩි මිලදී ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.
- "අප පිළිකාව වැළදීම අවම කර ගන්නේ කෙසේද" යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් හා පිළිකාව කළින් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයේ සහයෝගීත්වය ඇතිව ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාන්තා කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය සායනයක් සංවිධානය කරන ලදී.
- මධ්‍යම පරිසර අධිකාරියේ සහයෝගීත්වය ඇතිව ප්ලාස්ටික් ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීම, ඝන කසල අපද්‍රව්‍ය හා ඉලෙක්ට්‍රොනික- අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දේශනයක් සංවිධානය කරන ලදී.
- ණය සඳහා රක්ෂණ ආවරණ ප්‍රතිපත්ති යන මැයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් දේශනයක් පවත්වන ලදී.

### vi. පාරිභෝගික සේවා

ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව සුභ සාධක සංගමය විසින් කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් වර්ග වලට අයත් භාණ්ඩ අලෙවි කිරීමේ කටයුතු සංවිධානය කරන ලදී.

- ආනයනය කරන ලද සාරි- කපු හා කෘතිම රෙදි නිශ්පාදන
- සම් භාණ්ඩ නිශ්පාදන -සපත්තු හා රෙදි අලෙවි කිරීමේ සංවිධායකයන්
- කාන්තා සපත්තු
- පාරිභෝගික හා සුවඳවිලවුන් නිශ්පාදන
- රන් ආභරණ
- විදුලි උපකරණ

### Vii. ප්‍රවාහන පහසුකම්

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභා කාර්යාලයේ සිට දුම්රිය ස්ථානයට යාමේදී ඇතිවන ප්‍රවාහන අපහසුතා මැඩ පැවැත්වීම පිණිස සුභ සාධක සංගමය විසින් දෛනිකව ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සිට ආරම්භ කරන බස් රථයක් යොදවන ලදී.

## 11.2.10. වාර්ෂික සේවක පවුල් සුහද හමුව

මෙය 2013 අගෝස්තු 31 සිට සැප්තැම්බර් 01 දින දක්වා හබරණේදී පවත්වන ලද දෙදින වැඩසටහනකි. වැඩසටහනේ අරමුණ වූයේ විනෝදවීම හා කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර පමණක් නොව ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සමගද සුහදතාවය ඇති කිරීමයි.




*හබරණ "ජායා විලේජ් හෝටලයේ " පවත්වන ලද සේවක පවුල් සුහද හමුවට එක්රැස්වූ පවුල් සාමාජිකයන්*

### 11.2.11. වාර්ෂික ක්‍රීඩා තරඟය

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ අනුග්‍රාහකත්වය ඇතිව ක්‍රීඩා තරඟය 2013 දෙසැම්බර් 21 දින රාජකීය විද්‍යාල ක්‍රීඩා පිටියේදී පවත්වන ලදී. සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තන් විය. කාර්ය මණ්ඩලයේ ඉහළ සිට පහළ දක්වා වූ සියළුම දෙනා නිවාස තුනකට එනම් පරාක්‍රම, විජය, ගැමුණු යන නිවාස තුනට බෙදන ලද අතර ඒ යටතේ ක්‍රීඩා තරඟ සඳහා සහභාගි විය. කාර්ය මණ්ඩල සාමාජිකයන් රැසක් මෙම ගෘහස්ථ ක්‍රීඩා, එළිමහන් ක්‍රීඩා ඇතුළු ධාවන හා පිටියේ ඉසව් සඳහා උද්‍යෝගිශීලීව සහභාගි වූහ. මෙම තරඟය මගින් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සිය මලල ක්‍රීඩා හැකියාවන් ප්‍රදර්ශනය කිරීමටත් එමෙන්ම නිල ධූරාවලිය අභිබවා කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමටත් අවස්ථාව සැලසිණි.



*ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ ක්‍රීඩා උත්සවය රාජකීය විද්‍යාල ක්‍රීඩාංගනයේදී විවෘත කළ අවස්ථාව*



*ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ක්‍රීඩා උත්සවය - ත්‍යාග ප්‍රදානෝත්සවය*

## 11.2.12. තොරතුරු තාක්‍ෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීම

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සියළුම අංශ සිය කාර්යයන් ඉටු කිරීමේදී තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය භාවිතා කරන අතර පාලන සහ ආයතනික කටයුතු අංශයේ වගකීම වන්නේ කාර්යක්ෂමව තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ යටිතල පහසුකම් සහිතව සිය කාර්යයන් ඉටු කිරීමට සෙසු අංශවලට පහසුකම් සැපයීම පිණිස තොරතුරු තාක්‍ෂණ අවශ්‍යතාවයන් කාර්යක්‍ෂමව සහ ඵලදායීව සපුරාලීමයි. සමාලෝචන වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර ඇත.

- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ මේල් සර්වරය, ඩොමේන් සර්වරය (Active Directory-AD)" දත්ත ආරක්‍ෂණ කළමනාකරු (DPM) පද්ධති මධ්‍ය ආකෘති කළමනාකරු (SCCM) පරිගණක යන්ත්‍ර (PCs)" මුද්‍රණ යන්ත්‍ර, හා රවුටර්ස් යනාදිය පාලනය කිරීම හා නඩත්තු කිරීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ සියළුම අංශ සඳහා තොරතුරු තාක්‍ෂණ භාවිතයන් වැඩිදියුණු කිරීම හා සැලසුම් කිරීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්‍ෂණය භාවිතා කරන්නන්ගේ පදනම පිළිබඳව පුහුණුව ලබා දීම.
- ප්‍රදර්ශන මගින් තොරතුරු එක්රැස් කිරීම හා බෙදා හැරීම.
- තෝරාගත් අංශ වලට රැහැන් රහිත ජාල විසඳුම් ලබා දීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ නව වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම සඳහා ටෙන්ඩරය කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසලට (UCSC) ප්‍රදානය කිරීම.
- කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල (UCSC) විසින් වැඩිදියුණු කරන ලද මූලාකෘති (Developed Prototypes) ඇගයීම.
- ජුම්ලා 1.5 සිට ජුම්ලා 2.5 දක්වා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ වෙබ් අඩවියේ සංයුක්ත කළමනාකරණ පද්ධතිය (CMS) සංක්‍රමණය වීම. (ජුම්ලා යනු ප්‍රසිද්ධ කරන වෙබ් අඩවි අන්තර්ගතයේ සංයුක්ත කළමනාකරණ පද්ධතියකි.)
- සංයුක්ත කළමනාකරණ කණ්ඩායම (CMT) පත් කිරීම.
- සංයුක්ත කළමනාකරණ කණ්ඩායමේ උපදෙස් යටතේ ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ වෙබ් අඩවිය පවත්වාගෙන යාම.

## 11.213. පුස්තකාලය

විදුලි සංදේශනය ශීඝ්‍රයෙන් විකාශනය වන විෂයය ක්ෂේත්‍රයක් වන අතර එබැවින් පුද්ගලයන් විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ කටයුතුවල නියැලෙන අතර මේ පිළිබඳව කැමැත්තක් දක්වන සෙසු පාර්ශවයන් විසින් මෙම විෂයය පිළිබඳව සිය දැනුම අඛණ්ඩව යාවත් කාලීන කර ගැනීම අවශ්‍ය කෙරේ. ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ පුස්තකාලය මෙම කාර්යය සඳහා ස්ථාපනය කර ඇත. ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ පුස්තකාලය විදුලි සංදේශ පිළිබඳ පාඨ ග්‍රන්ථ සහ සඟරා විශාල එකතුවකින් සමන්විත වන අතර පරිහරණය කරන්නන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස අඛණ්ඩව ශක්තිමත් කෙරේ. පුස්තකාලය මගින් පුස්තකාල පාඨකයන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, විශ්ව විද්‍යාල ශිෂයයන්, ගුරුවරුන්, පාසල් ශිෂයයන්, පර්යේෂකයන් හා පුස්තකාලයාධිපතිවරුන්ගෙන් සමන්විත වේ. පුස්තකාලය මගින් අන්තර්ජාලය හා වෙනත් පුස්තකාල දත්ත සමුදායක් භාවිතා කරමින් තොරතුරු සපයයි. පුස්තකාල පාඨකයන්ට සිය ඉල්ලීම මත ඡායා පිටපත් පහසුකම් සපයනු ලැබේ. පුස්තකාලයේ විද්‍යුත් තැපැල් හා අන්තර්ජාල පහසුකම්, ෆැක්ස් පහසුකම් හා දුරකතන පහසුකම් පුස්තකාලය හා පාඨකයන්ට කඩිනමින් අවශ්‍ය තොරතුරු සැපයීමට භාවිතා කරනු ලැබේ.

පුස්තකාලය පවත්වාගෙනයාම හා පුස්තකාලය ශක්තිමත් කිරීම පිණිස 2013 වර්ෂයේදී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රකාශන ඇතුළු දේශීය හා විදේශීය පොත් රාශියක් මිලදී ගෙන ඇති අතර මෙම කාර්යය සඳහා වැය වූ මුළු මුදල රු.659,704 ක් වූ අතර එනම්, විදේශීය පොත් සඳහා රු.566,948 ක් සහ දේශීය ප්‍රකාශන සඳහා රු.92,756 ක් වැය විය.

ඉහත පොත් මිලදී ගැනීමට අමතරව පුස්තකාලය එක් එක් වර්ගවලට අයත් දායකත්වය සඳහා වැයකරන ලද මුළු මුදල් ප්‍රමාණය ඇතුළු අදාළ තොරතුරු හා විවිධ සඟරා සඳහා දායක/ යාවත්කාලීන දායක මුදල් 11.2 වගුවේ දැක්වේ.

**සඟරා සඳහා දායක මුදල - 2013** (11.2 වගුව)

| නව සඟරා | යාවත් කාලීන කිරීම | |
|---|---|---|
| | විදේශීය සඟරා | දේශීය සඟරා |
| වෛද්‍ය සඟරා | හාවඩ් ව්‍යාපාරික සමාලෝචනය | ආර්ථික විමසුම |
| අරෝග්‍යා | ජාතික භූගෝලීය සඟරා | ආර්ථික විමසුම |
| නව යුගය | නව විද්‍යාඥයන් | බිස්නස් ටුඩේ |
| සටහන | ආර්ථික විද්‍යාඥයන් | රීඩර්ස් ඩයජස්ට් |
| දෙසතිය | ටයිම් | සඟරා |
| | | පරිගණක |
| **Rs. 2310** | **Rs. 101990.00** | **Rs. 9530.00** |

වෙනත් පුස්තකාලවල සාමාජිකත්වය ලබා ගැනීම පිණිස සාමාජිකත්වය යාවත්කාලීන කිරීම පහත සඳහන් සංවිධානවල ආයතනික සාමාජිකත්වය යාවත්කාලීන කර ඇත.

මහජන පුස්තකාලය
ජාතික පුස්තකාලය
බ්‍රිතාන්‍ය පුස්තකාලය
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා අරමුදල් සපයා ඇත. කෙසේ වෙතත් මහජන පුස්තකාලයේ පුද්ගලික සාමාජිකත්වය ලබාගැනීමට කාර්ය මණ්ඩල සාමාජිකයන් පුද්ගලිකව මුදල් ගෙවිය යුතුවේ. ආයතනික සාමාජිකත්වය තිබීම නිසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ඉහත පුස්තකාලවලින් පහසුවෙන් සේවාවන් ලබාගැනීමට හැකිවිය. ආයතනික සාමාජිකත්වය තිබිම නිසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මහජන පුස්තකාලයේ ජංගම පුස්තාකල සේවාවෙන් පොත්/ සඟරා යනාදිය ලබාගැනීමට හැකිවූ අතර 2013 වර්ෂය තුල ජංගම පුස්තකාල සේවාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පරිශ්‍රයට සෑම සති 02කට වරක් පැමිණ ඇත.

## අන්තර් පුස්තකාල ණය පහසුකම් ලබාගැනීම සඳහා වෙනත් ආයතන සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය මගින් කාර්ය මණ්ඩලය සඳහා අන්තර් පුස්තකාල ණය පහසුකම් සැපයීම පිණිස ජාතික පුස්තකාලය මෙන්ම ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික විද්‍යා පදනම(NSF) විශ්ව විද්‍යාල පුස්තකාල වැනි ආයතන සම්බන්ධීකරණය කලේය.

### වැදගත් තොරතුරු එක් රැස් කිරීම හා සුචිය පිළියෙල කිරීම

වැදගත් නිර්දිෂ්ඨ තොරතුරු එක්රැස් කිරීම හ සුචිය පිළියෙල කිරීම 2013 වර්ෂයේදී අඛණ්ඩව සිදුකර ඇත. විදුලි සංදේශනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, පරිසරය ආශ්‍රිත පුවත්පත් හා සඟරාමය ලිපි එක්රැස් කරන අතර ඒවා කාලණුක්‍රමිකව පිළියෙල කරනු ලැබේ. එමෙන්ම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ පුස්තකාලය විසින් පුස්තකාල නිවේදන සහ කොමිෂන් සභා ප්‍රකාශන පිළිබඳ සුචියක් පිළියෙල කර ඇත. පුස්තකාලය විසින් කර්ය මණ්ඩලයේ විදේශ පුහුණු, අති විශේෂ ගැසට් නිවේදන සහ කොමිෂන් සභාව මෙන්ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපර්තමේන්තුව විසින් කලින් කල නිකුත් කරන චක්‍රලේඛන වැනි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අදාළ වැදගත් වන කරුණු පිළිබඳ සුචියක් පිළියෙල කර ඇත. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ආධුනික ගුවන් විදුලි විභාගය සදහා අයදුම්කරන අයදුම්කරුවන්ගේ ප්‍රයෝජනය සදහා විභාග දෙපාර්තමේන්තුවේ සහයෝගීත්වය ඇතිව පසුගිය ප්‍රශ්නපත්‍ර එකතුවක් පවත්වාගෙන යනු ලැබේ.

(PURNA) පද්ධතිය වැඩිදියුණු කිරීම පුස්තකාලය මගින් පරිහරණය කරන්නන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත තොරතුරු පහසුවෙන් සැපයීම පිණිස (PURNA) දත්ත සමුදාය වැඩිදියුණු කරන ලදී.

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සදහා සම්මන්ත්‍රණ/වැඩමුළු සංවිධානය කිරීම

2013 වර්ෂයේදී පුස්තකාලය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ/වැඩමුළු පිළිබඳ තොරතුරු 11.3 වගුවේ දක්වා ඇත.

**පුස්තකාලය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ/වැඩමුළු 2013 සහභාගී වන සංඛ්‍යාව** (11.3 වගුව)

| විෂය ක්ෂේත්‍රය | සහභාගී වන සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂිතව රියපැදවීම | 50 |
| ගිනි ආරක්‍ෂණ | 50 |
| අකුණු සහ ස්භාවික ආපදා | 55 |

### මාධ්‍ය ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වැදගත් සිදුවීම් පවත්වන විට, එම අදාළ ස්ථානයේ මාධ්‍ය ආවරණ කටයුතු සිදුකිරීම, ඡායාරූප හා වීඩියෝ ගැනීම එම පුවත් ආවරණ සංස්කරණය කිරීම, නවීන තාක්‍ෂණය භාවිතා කරමින් ලේඛනමය ආකාරයෙන් ගබඩා කිරීමේ වගකීම මාධ්‍ය අංශයේ කාර්ය මණ්ඩලයට පැවරේ. කළමනාකාරිත්වයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදුකරන වැදගත් සිදුවීම් පිළිබදව මහජනතාව දැනුවත් කිරීම පිණිස ඡායාරූප සහ වීඩියෝ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරනු ලැබේ. බාහිර ප්‍රභවයන් සඳහා තොරතුරු ලබාදෙන විටදී මාධ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාළ අංශය මගින් විෂය ක්ෂේත්‍රය පිළිබඳ තොරතුරු ලබාගනියි.

### 11.2.14.1. කාර්යසාධනය

- DVD තැටි 1000 සකස් කිරීමට අමතරව 2013 වර්ෂයේදී පහත සඳහන් සිදුවීම් ආවරණය කරන ලදී.
- නෙළුම් කුලුන ව්‍යාපෘතිය
- රියදුරන් සදහා මාර්ග රීති දැනුවත් කිරීමේ වැඩසටහන

- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පවත්වන ලද ලියකියවිලි සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩමුළුව
- යාපනේ ශිෂයයන් සඳහා පරිගණක පරිත්‍යාග කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා පරිගණක පරිත්‍යාග කිරීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විනය සංග්‍රහය එළිදැක්වීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ උසස් කිරීම් පටිපාටිය එළිදැක්වීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාය වර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම
- සුබ සාධක සංගමය මගින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ ව්‍යාපාරය
- ආපනශාලාව විවෘත කිරීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙසක් සැමැරුම් උත්සවය
- අකුණු සහ ස්වාභාවික ආපදා පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන
- පාරිසරික තිරසාරභාවය පිළිබඳ ප්‍රමිතිකරණ පරතරය අවම කිරීම= හරිතමය අනාගතය පිළිබඳව වැඩමුළුව
- පාසල මගින් ප්‍රජාව සම්බන්ධීකරණය කිරීම වැඩසටහන යටතේ වටරුක කණිෂ්ඨ විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය විවෘත කිරීම
- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත අපරාධ මෙහෙයවන පොලිස් නිලධාරීන් සඳහා වැඩමුළුව
- නව විදුලි සංදේශ පනත සකස් කිරීම පිළිබඳ වැඩමුළුව
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිත්‍යාගයක් ලෙස වටරුක රණවිරු නිවාස ව්‍යාපෘතිය
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රීඩා උත්සවය

# අභ්‍යන්තර විගණන අංශය

පරිච්ඡේදය

12

**සමාලෝචනය**

අභ්‍යන්තර විගණන අංශය ආයතනයේ මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීමේ සහ වටිනාකම එකතුකිරීමේ අරමුණින් ක්‍රියාකරන ස්වාධීන අංශයකි. දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම සහ ඇගයීම පදනම් කරගෙන දර්ශනය සහ නිර්දේශය සැපයීම මගින් ආයතනයේ ඵලදායීත්වය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීමේ උත්ප්‍රේරකයක් වේ. විගණන අංශය ස්වාධීනව උපදෙස් ලබාදෙන විෂයානු බද්ධ ප්‍රභවයක් වශයෙන් පරිපූර්ණ සහ වගකිව යුතු විධිවිධාන යෙදීමේදී රාජ්‍ය ආයතනවලට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ප්‍රයෝජනවත් වේ. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ විෂයය පථය පුළුල් අතර මෙහෙයුම් කටයුතුවල ඵලදායිතාව මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය, වංචාවලට දඬුවම් ලබාදීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම, නීති සහ රීතිවලට අනුකූලතාවය දැක්වීම වැනි විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා (ප්‍රධාන අභ්‍යන්තර විගණන) සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කරන අතර විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කළ යුතු වේ.

## 12.1. කාර්යයන්

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම හා ඇගයීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැනනැගී තිබේනම් ඒවාට අදාළ හේතු නිසා බලපෑම් විමර්ශනය කිරීම
| | | **(805,872,889.77)** | **332,648,144.78** |
| 8B | **අතැති මුදල්** | | |
| | සුළු මුදල් - ප්‍රධාන කාර්යාල | 10,000.00 | 10,000.00 |
| | සුළු මුදල් - කදිරාන | 0.00 | 5,000.00 |
| | සුළු මුදල් - පාලන හා මානව සම්පත් | 5,000.00 | 5,000.00 |
| | සුළු මුදල් - කොකාවිල් | 10,000.00 | 10,000.00 |
| | සුළු මුදල් - නෙළුම් කුලුන | 25,000.00 | 0.00 |
| | අධ්‍යක්ෂ ජනරාල් සඳහා රජයේ විද්‍යුත් කාඩ්පත | 0.00 | 0.00 |
| | කොටස් වෙළඳවල ගිණුම | 49,695,841.90 | 0.00 |
| | අතැති මුදල් (එකතුකිරීමේ ගිණුම) | 49,773.00 | 17,630.00 |
| | හිමිකම් නොකී සේවක ප්‍රතිලාභ | 0.00 | 8,567.00 |
| | | **49,795,614.90** | **56,197.00** |
| 9A | **ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල** | | |
| | ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අරමුදල | 1,994,624,072.52 | 9,094,658,010 |
| | අඩුකලා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් | (611,455,256.24) | (5,000,000,000) |
| | | **1,383,168,816.28** | **4,094,658,010.00** |
| 9B | **ගෙවිය යුතු** | | |
| | **උපචිත වියදම්** | | |
| | දුරකතන<br>-කාර්යාල<br>නිවාස | 279,804.36<br>222,000.00 | 318,418.00<br>38,549.00 |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| | වැටුප් පාලන ගිණුම් (කොන්ත්‍රාත් පදනමේ සේවකයන්) | 147,782.95 | 1,305,669.00 |
| | ගෙවිය යුතු වැටුප් | 112,884.00 | 112,884.00 |
| | ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු මුදල් | 0.00 | 57,195.00 |
| | විදුලිය | 3,214,596.58 | 3,354,008.00 |
| | ජලය | 1,126.30 | 107,024.00 |
| | සනීපාරක්ෂක සේවා | 460,639.99 | 822,814.00 |
| | ආරක්ෂක සේවා | 475,347.80 | 923,396.00 |
| | අතිකාල | 629,190.00 | 474,016.00 |
| | සේවක අර්ථසාධක අරමුදල | 19,545.05 | 257,701.00 |
| | සේවක භාරකාර අරමුදල | 2,344.59 | 30,923.00 |
| | අන්තර්ජාලය | 265,259.49 | 308,418.00 |
| | වෛද්‍ය රක්ෂණ ඉල්ලීම් | 269,251.45 | 243,575.00 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | 183,514.00 | 259,500.00 |
| | පුවත්පත් සහ දැන්වීම් | 3,349,352.12 | 142,895.00 |
| | විගණන ගාස්තු | 1,193,240.00 | 1,193,240.00 |
| | කල්බදු කුලී | 0.00 | 992,244.00 |
| | ප්‍රසාද දීමනා | 15,841,167.00 | 4,103,990.00 |
| | රඳවාගැනීම් | 617,349.96 | 224,789.00 |
| | 2/3 පොලිය ප්‍රතිපූර්ණය | 97,556.92 | 228,595.00 |
| | දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් (ආර්ථික සේවා ගාස්තු,ජාතිය ගොඩනැගිමේ බදු සහ මුද්දර ගාස්තු) | 38,510,973.70 | 28,199,533.00 |
| | වැටුප්වලින් අඩුකිරීම් | 74,514.90 | 69,261.00 |
| | ගෙවිය යුතු ගමන් සහ යැපීම් දීමනා සහ නඩත්තු වියදම් | 0.00 | 50,000.00 |
| | ගෙවිය යුතු අළුත්වැඩියා සහ නඩත්තු වියදම් | 7,943,258.58 | 9,145,019.00 |
| | ඉන්ධන ගාස්තු | 10,000.00 | 180,157.00 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 196,175.00 | 9,600.00 |
| | ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු | 0.00 | 0.00 |
| | ගෙවිය යුතු රක්ෂණ දීමනා | 0.00 | 150,000.00 |
| | විවිධ මිලදී ගැනීම් හා සැපයීම් (උපලේඛන - 1) | 806.90 | 0.00 |
| | ගෙවිය යුතු ගුවන් ටිකට්පත් | 0.00 | 43,306.00 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | 684,864.16 | 0.00 |
| | ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු ( කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා) | 0.00 | 0.00 |
| | විවිධ | 136,701,624.89 | 592,378.00 |
| | | **211,504,170.69** | **53,939,097.00** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| 10 | **ආදායම** | | |
| | පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 2,060,743,487.50 | 1,418,317,869.00 |
| | සෙස් ගාස්තු | 3,500,555,848.71 | 3,514,975,583.00 |
| | ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 8,226,962,705.36 | 6,532,360,699.00 |
| | සංඛ්‍යාත සදහා ගෙවූ අත්තිකාරම් ගාස්තු | 5,661,038,940.37 | 367,346,939.00 |
| | වෙළඳ බලපත්‍ර ගාස්තු | 12,464,222.30 | 8,799,690.00 |
| | ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 91,164.27 | 94,082.00 |
| | නාවික මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 695,778.93 | 260,851.00 |
| | ගුවන්යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 170,067.34 | 405,204.00 |
| | රැහැන් රහිත දුරකතන බෙදා හැරීමේ ගාස්තු | 24,910,892.84 | 20,054,795.00 |
| | විභාග ගාස්තු | 393.85 | 12,237.00 |
| | අයදුම්පත් සැකසීමේ ගාස්තු | 1,632,572.52 | 7,142,858.00 |
| | කෙටි සංකේත අංක ගාස්තු | 8,163,241.00 | 6,122,450.00 |
| | අනෙකුත් ආදායම (10 ඒ) | 1,991,028,937.24 | 823,949,687.00 |
| | | 21,488,458,252.23 | 12,699,842,944 |
| | අඩුකළා ජාතිය ගොඩනැගීමේ බද්ද | (421,995,689.00) | (227,945,588.00) |
| | | **21,066,462,563.23** | **12,471,897,356** |
| 10A | **අනෙකුත් ආදායම** | | |
| | කාර්ය මණ්ඩල ණයවලින් ලද පොලි ආදායම | 2,809,521.14 | 3,392,142.00 |
| | තැන්පතු මත පොලි ආදායම | 1,797,259,029.87 | 820,302,868.00 |
| | REPO වලින් පොලි ආදායම | 125,915,601.81 | 0.00 |
| | කොටස් වෙළඳපළ මත පොලී ආදායම | 55,206,490.97 | 0.00 |
| | වෙනත් ආදායම (ප්‍රදාන) | 1,430,608.32 | 55,541.00 |
| | ස්ථාවර වත්කම් ඉවත්කිරීම මත ලාභය/ පාඩුව | 447,950.00 | 2,367,160 |
| | උසාවි නඩුවලින් අයකර ගැනීම් | 2,370,000.00 | 630,000 |
| | විවිධ | 5,589,735.13 | 199,136.00 |
| | | 1,991,028,937.24 | 826,946,847.00 |
| 10B | **විදුලි සංදේශ සංවර්ධන ගාස්තු** | | |
| | විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම | 7,239,709,188.20 | 7,265,875,990.00 |
| | අඩුකළා | | |
| | විදුලි සංදේශ සංවර්ධන ගාස්තු වලින් භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% | | (652,745,143.00) |
| | | **7,239,709,188.20** | **6,613,130,847.00** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| 11 | **නියාමන වියදම** | | |
| | වාර්ෂික සාමාජික මුදල් | 21,578,591.10 | 23,108,189.00 |
| | ඒ.පී.ටී. වාර්ෂික සාමාජික මුදල් | 1,751,459.00 | 1,765,131.00 |
| | එස්.ඒ.එන්.අයි.ආර්. වාර්ෂික සාමාජික මුදල් | 400,743.00 | 1,004,149.00 |
| | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ රැස්වීම සදහා දායකත්වය | 1,984,743.00 | 0.00 |
| | පුස්තකාල සාමාජික මුදල් | 112,673.44 | 434,428.00 |
| | සී.ටී.ඕ. වාර්ෂික සාමාජික මුදල් | 4,029,980.68 | 9,586,728.00 |
| | ජාතික අංකන දත්ත සැලැස්ම | 0.00 | 0.00 |
| | මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 33,722.00 | 3,462,377.00 |
| | නියාමන කටයුතු සදහා සහභාගීවීම් | 31,374,546.83 | 35,632,386.00 |
| | නීති උපදේශන | 4,563,820.00 | 3,720,025.00 |
| | විදුලි සංදේශ සංවර්ධනය පිළිබද මහජනතාව දැනුවත් කිරීම | 52,759.54 | 0.00 |
| | ජාල සංවර්ධන අධීක්ෂණය කිරීම | 231,297.00 | 0.00 |
| | පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම | 160,000.00 | 491,166.00 |
| | ජංගම හා කේබල් රූපවාහිනි අධීක්ෂණය | 0.00 | 22,202.00 |
| | පාසල හා ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ වැඩසටහන | 25,383.00 | 6,109,692.00 |
| | දකුණු ආසියානු විදුලි සංදේශ රැස්වීම | 0.00 | 0.00 |
| | දකුණු ආසියානු විදුලි සංදේශ ක්‍රියාකාරී සැලැස්ම සඳහා දායකවීම | 0.00 | 0.00 |
| | විවිධ නියාමන වියදම් | 15,049,217.00 | 0.00 |
| | විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සදහා සන්නි-වේදන පහසුකම් සැපයීම | 5,917,046.40 | 4,500,000.00 |
| | විදුලි සංදේශ ආශ්‍රිත සමීක්ෂණ | 0.00 | 1,124.00 |
| | ආර්ථිකමය සමාජ වගකීම | 136,066,814.68 | 6,674,000.00 |
| | සේවා තත්ව පිළිබඳ සමීක්ෂණ | 140,000.00 | |
| | විදේශ නියෝජිතයන් පැමිණිම | 1,034,081.49 | 648,772.00 |
| | අධිවේගී අන්තර්ජාල වේගය පරීක්ෂා කිරීම | 0.00 | 283,496.00 |
| | පාසල් සංවර්ධන ව්‍යාපෘති | 0.00 | 0.00 |
| | පොදු රාජ්‍ය මණ්ඩලීය ප්‍රජා සමුළුව | 658,360,210.00 | |
| | අප්‍රිකානු ආසියානු නියාමකයන්ගේ සමුළුව | 0.00 | 13,232,673.00 |
| | විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සමුළුව | 0.00 | 141,890,000.00 |
| | සම්මන්ත්‍රණ සංවිධානය කිරීම | 61,629.96 | 5,180.00 |
| | ගෝලීය සයිබර් ඔලිම්පික් | 0.00 | 158,419.00 |
| | පොදු දුරකතන කුටි කර්මාන්තය පිළිබඳ සමීක්ෂණ | 0.00 | 17,914.00 |
| | අන්තර්ජාලය මගින් දරුවන් ආරක්ෂා කිරීම | 0.00 | 1,840.00 |
| | සඟරා සහ ප්‍රකාශන | 0.00 | 341,608.00 |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| | සයිබර් ආරක්ෂණ අනුග්‍රහය | 0.00 | 350,000.00 |
| | නෙළුම් කුලුන ව්‍යාපෘතිය | 4,604,482.93 | 19,547,067.00 |
| | | **887,533,201.05** | **272,988,566.00** |
| | අඩු කළා: කොකාවිල් කුලුන | (16,953,905.88) | 0.00 |
| | | **870,579,295.17** | **272,988,566.00** |
| **12** | **ආයතන සහ පරිපාලන වියදම්** | | |
| | වැටුප් | 91,732,074.53 | 68,322,937.00 |
| | සේවක අර්ථසාධක අරමුදල (15% දායක මුදල්) | 13,471,892.11 | 9,325,219.00 |
| | සේවක භාරකාර අරමුදල (3% දායක මුදල්) | 2,681,009.55 | 1,865,044.00 |
| | ජීවන වියදම් දීමනා | 9,262,399.88 | 12,976,599.00 |
| | ප්‍රවාහන දීමනා | 16,845,116.04 | 15,966,751.00 |
| | ගෙවල් කුලී දීමනා | 7,555,959.98 | 5,294,251.00 |
| | වෙනත් දීමනා | 2,030,751.05 | 1,085,486.00 |
| | කාර්ය සාධන දිරි දීමනා | 17,859,975.05 | 13,589,631.00 |
| | විශේෂ දීමනා | 5,190,047.00 | 6,902,750.00 |
| | ප්‍රසාද දීමනා | 8,543,949.00 | 4,088,990.00 |
| | අතිකාල | 6,573,392.33 | 7,223,995.00 |
| | සභාපතිගේ වේතනය | 450,000.00 | 450,000.00 |
| | පාවිච්චි නොකළ විවේක නිවාඩු දීමනා | 10,695,478.00 | 3,477,670.00 |
| | විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 654,855.01 | 973,726.00 |
| | දුම්රිය ගාස්තු සහනාධාරය | 5,000.00 | 0.00 |
| | නිවෙස් දුරකතනය | 1,973,805.99 | 664,049.00 |
| | නිල ඇඳුම් | 473,916.75 | 259,732.00 |
| | කාර්ය මණ්ඩල සුබසාධනය | 8,854,315.73 | 8,319,488.00 |
| | ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම | 1,469,983.75 | 1,430,480.00 |
| | කාර්ය මණ්ඩල වෘත්තීය සාමාජික මුදල් දායකත්වය | 319,236.09 | 281,156.00 |
| | දේශීය පුහුණු | 1,289,840.00 | 1,165,950.00 |
| | කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනාව | 60,000.00 | 91,264.00 |
| | විගණන කමිටු දීමනා | 37,500.00 | |
| | 2/3 නිවාස ණය පොලිය ප්‍රතිපූර්ණය කිරීම | 3,486,312.66 | 3,812,284.00 |
| | ප්‍රවාහන හා යැපීම් දීමනා | 25,480.00 | 97,001.00 |
| | පාරිතෝෂික | 1,711,791.24 | 918,592.00 |
| | විදුලිය | 42,150,759.25 | 47,433,944.00 |
| | ජලය | 1,128,512.06 | 1,213,845.00 |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| | සනීපාරක්ෂක සේවා | 2,883,284.82 | 3,124,272.00 |
| | ආරක්ෂක සේවා ගාස්තු | 5,411,527.00 | 5,807,661.00 |
| | වරිපනම් හා බදු | 37,500.00 | 78,893.00 |
| | ආර්ථික සේවා ගාස්තු | 0.00 | 0.00 |
| | පුස්තකාල පොත් | 2,008,519.93 | 274,050.00 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 8,709,625.65 | 7,588,437.00 |
| | ඉන්ධන | 4,881,748.71 | 5,377,359.00 |
| | විදුලි භාණ්ඩ | 296,160.00 | 161,112.00 |
| | තැපැල් ගාස්තු | 994,580.92 | 906,520.00 |
| | දුරකතන, ෆැක්ස් සහ පී.ඒ.බී.එක්ස් | 4,280,078.48 | 4,420,538.00 |
| | රක්ෂණ (වත්කම් සහ වෛද්‍ය) | 39,627,778.86 | 38,906,001.00 |
| | අන්තර්ජාල ගාස්තු | 668,845.15 | 887,883.00 |
| | වාහන කුලී ගාස්තු | 2,400.00 | |
| | පුවත්පත් හා දැන්වීම් | 9,625,387.56 | 6,743,223.00 |
| | උපදේශන ගාස්තු | 0.00 | 15,830.00 |
| | සම්මේලන සහ සම්මන්ත්‍රණ | 735,340.30 | 0.00 |
| | විගණන ගාස්තු | 0.00 | 1,280,000.00 |
| | නීති වියදම් | 263,908.80 | 33,394.00 |
| | කල්බදු දේපළ සඳහා කුලී | 2,385,893.16 | 931,634.00 |
| | වාහන කුලී ගාස්තු | 0.00 | 0.00 |
| | කල්බදු අන්තර්ජාල කුලී | 3,082,665.30 | 3,579,149.00 |
| | ක්ෂය වීම | 80,667,821.99 | 67,981,271.00 |
| | විවිධ පරිපාලන වියදම් | 915,297.45 | 1,484,085.00 |
| | විවිධ මිලදී ගැනීම් සහ සැපයීම් | 742,321.23 | 1,439,210.00 |
| | විවිධ මෙහෙයුම් පිරිවැය | 31,438.00 | 222,412.00 |
| | | **424,785,476.36** | **368,473,770.00** |
| **13** | **අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම්** | | |
| | කාර්යාල උපකරණ නඩත්තු වියදම් | 3,552,070.75 | 1,653,444.00 |
| | විදුලි සෝපාන නඩත්තු වියදම් | 0.00 | 744,520.00 |
| | විදුලි උත්පාදන යන්ත්‍ර නඩත්තු වියදම් | 0.00 | 15,861.00 |
| | වාහන නඩත්තු වියදම් | 7,071,567.55 | 8,249,241.00 |
| | ගොඩනැගිලි නඩත්තු වියදම් | 2,962,029.56 | 2,630,442.00 |
| | තාක්ෂණික උපකරණ නඩත්තු වියදම් | 705,833.60 | 1,310,139.00 |
| | මෘදුකාංග නඩත්තු සහ සංවර්ධන වියදම් | 18,385,497.44 | 25,393,945.00 |
| | වැඩිදියුණු කල Lotus Domain සර්වරය | 0.00 | 0.00 |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| | වැඩිදියුණු කල පිරික්සුම් පද්ධතිය | 780,300.00 | 0.00 |
| | වැඩිදියුණු කල පිරික්සුම් පද්ධතිය | 290,059.68 | 0.00 |
| | විවිධ අළුත්වැඩියා හා නඩත්තු වියදම් | 19,250.00 | 81,013.00 |
| | | **33,766,608.58** | **40,078,606.00** |
| **14** | **මුල්‍ය හා අනෙකුත් වියදම්** | | |
| | බැංකු ගාස්තු | 249,544.16 | 207,325.00 |
| | බැංකු හර ගාස්තු | 0.00 | 0.00 |
| | මුද්දර බද්ද | 34,825.00 | 1,545,687.00 |
| | පාරිතෝෂික මුදල් වෙන් කිරීම මත පොලිය | 0.00 | 2,780,848.00 |
| | | 284,369.16 | 4,533,860.00 |
| **15** | **වෙන් කිරීම් අඩු/ වැඩි** | | |
| | භාණ්ඩාගාරය සදහා ගෙවිය යුතු සෘජු දුරකතන ඇමතුම් බදු | 350,446.86 | 0.00 |
| | ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන අරමුදල | 1,498,312.99 | 0.00 |
| | භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු විදුලි සංදේශ බදු | (11,704,354.47) | 0.00 |
| | ජලය | (4,436.80) | 0.00 |
| | අළුත්වැඩියා හා නඩත්තු කිරීම් | (1,788,601.56) | 0.00 |
| | ගෙවිය යුතු සනීපාරක්‍ෂක සේවා | (137,346.98) | 0.00 |
| | ගෙවිය යුතු ප්‍රසාද දීමනා | (320.00) | 0.00 |
| | ගෙවිය යුතු ගුවන් ටිකට්පත් | (915.83) | 0.00 |
| | විදුලිය | (255.00) | 0.00 |
| | නිවාස දුරකතන | 2.47 | 0.00 |
| | ගෙවිය යුතු පුවත්පත් හා නිවේදන | (1,000.00) | 0.00 |
| | විවිධ ගෙවීම් | (474,547.67) | 0.00 |
| | ගෙවිය යුතු කාර්ය මණ්ඩල සුභසාධනය | (45,599.14) | 0.00 |
| | ගෙවිය යුතු 2/3 නිවාස ණය පොලිය | 30.00 | 0.00 |
| | යැපීම් හා ප්‍රවාහන ගෙවීම් | (46,200.00) | 0.00 |
| | SAFIR (ලැබිය යුතු ගුවන් ටිකට්පත්) | 1,930.28 | 0.00 |
| | ආර්ථික සේවා ගාස්තු හිමිකම් | (15,170,394.21) | 0.00 |
| | | **(27,523,249.06)** | **0.00** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**ගිණුම් සටහන් 2013 දෙසැම්බර් 31**
*(ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රකාශිතය) (ඉතිරි...)*

| | | 31.12.2013 | 31.12.2012 |
|---|---|---|---|
| **16** | **ඒකාබද්ධ අරමුදලට දායකවීම** | | |
| | විදුලි සංදේශ පනත යටතේ දායකවීම | 10,100,000,000.00 | 10,200,000,000.00 |
| | මුදල් පනත යටතේ දායකවීම | | |
| | ගෙවන ලද විදුලි සංදේශ බද්ද | 18,449,721,207.86 | 17,275,006,382.00 |
| | විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන් 50% | 3,964,677,717.34 | 2,980,192,851.97 |
| | ගෙවන ලද ජාත්‍යන්තර ලැබෙන ඇමතුම් ගාස්තු | 1,994,854,967.50 | 2,016,548,919.00 |
| | | **34,509,253,892.70** | **32,471,748,152** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්(2)/එච්/ටීආර්සී/1/13/20

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 ජූලි 28 දින

සභාපති
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ , ලාභ හා පාඩු සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2014 මැයි 02 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ගිණුම් ප්‍රමිත අංක 16 | (i) | දේපළ පිරියත උපකරණ වෙනුවෙන් ක්ෂය කිරීමේදී වත්කම් භාවිතය සඳහා යෝග්‍ය තත්ත්වයට පත්කල දිනසිට ක්ෂය කළ යුතු වුවද, කොමිෂන් සභාව විසින් වත්කම් මිලදී ගැනීමේදී සම්පූර්ණ වර්ෂය වෙනුවෙන්ද, ඉවත්කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමේද ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි. |
| | (ii) | කොමිෂන් සභාවට අයත්ව තිබූ අක්කර 112 රූඩ 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් - කටාන විසින් අත්පත් කරගෙන තිබුණු අතර සම්පූර්ණ ඉඩමේ වටිනාකම රු. 45,000,000 ක් වශයෙන් දේපළ පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි. වත්කම ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගත යුතු වුවත් පසුගිය වර්ෂ 11 තුළ මෙය ගිණුම් සටහනක් මගින් පමණක් පෙන්වා තිබුණි. |
| | (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් මෙහෙයුම් කටයුතු සඳහා යොදවා ගනු ලබන පිරිවැය රු. 399,451,975 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව ශුන්‍ය අගය මත ගිණුම් ගතකර තිබුණි. |

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී රු. 130,544,231 ක් වටිනා ඉන්වොයිස් පෙර වර්ෂය වෙනුවෙන් නිකුත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සංඛ්‍යාත බලපත්‍ර ආදායම රු. 130,544,231 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය රු. 2,367,160 ක් හා උසාවි නඩුවලින් ආපසු අයකර ගැනීම් රු. 630,000 ක් වෙනත් ආදායම් සඳහා වූ සටහනේ දක්වා තිබුණද එය ආදායම් ප්‍රකාශයේ ආදායමට එකතු නොකර වර්ෂය සඳහා විස්තීරණ ආදායමට එකතුකර පෙන්වා තිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවෙහි වෙළඳ ණයගැතියන් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුදලින් රු. 365,254,867 ක මුදලක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂයන් වශයෙන් වර්ගීකරණය කර තිබුණද, වර්ෂ 20 කට වැඩි කාල වකවානුවක සිට පැවතෙන ණය ශේෂයන්ද ඒ අතර විය.

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් 2011 දෙසැම්බර් 31 දිනට රු. 105,727,789 ක් අයවිය යුතුව තිබූ අතර සැපයූ සේවා සඳහා 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් ඉන්වොයිස් නිකුත්කර නොතිබුණි. තවද රු. මිලියන 01 ට වැඩි ණයගැතියන් 11 දෙනෙකුගෙන් වර්ෂ 2 ත් වර්ෂ 14 ත් කාලයක සිට රු.224,805,159 ක් අයවිය යුතුව තිබූ නමුත් එම ණයගැතියන් වෙත වර්ෂ ගණනාවක් සඳහා ඉන්වොයිස් නිකුත්කර නොතිබුණි.

(ඇ) සංඛ්‍යාත පරිහරණය කරනු ලබන ආයතන 34 විසින් වර්ෂ 02 කට වැඩි කාලයකට පෙර ගෙවිය යුතු මුදල් ඉක්මවා රු.1,640,929 ක් ගෙවීම් සිදුකර ඇතත් එම ගෙවීම් නිරවුල් කිරීමට මෙතෙක් කොමිෂන් සභාව විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

(ඈ) වර්ෂ 01 ට වැඩි අයනොවී පවතින සේවක ණය ශේෂය රු. 2,461,764 ක් විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් විගණනයේදී අනාවරණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2000 ජූනි 27 දිනැති පීඑෆ්/පීඊ/09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2011 ජනවාරි 27 දිනැති පීඊ අංක 56 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | මුදල් ආයෝජනය කිරීම හා මුදල් රඳවා ගැනීම සම්බන්ධයෙන් ලබාගත යුතු අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් රු. 18,524,500,000 ක මුදලක් බැංකුවක ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | |
| i. | xxiv පරිච්ඡේදයේ උපවගන්තිය 7.9.2 | නිලධාරියාගේ දීමනා රහිත වැටුපෙන් මුළු අඩුකිරීම් වල සියයට 40 ක සීමාව තුල ණය මුදල නිර්දේශ කළ යුතු වුවත් අධ්‍යක්ෂ (ජාල) වෙත වැටුපෙන් මුළු අඩුකිරීම්වල එකතුව සියයට 40 සීමාව ඉක්මවා තිබියදී වාහන ණය මුදලක් අනුමත කර ගෙවීම් කර තිබුණි. |
| ii. | xxiv පරිච්ඡේදයේ උපවගන්තිය 7.2.5 | අධ්‍යක්ෂ (ජාල) විසින් වාහනයක් මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී රු. 1,500,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණද එම මුදලින් වාහනයක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. එම මුදල 2011 මාර්තු මාසය දක්වාම පෞද්ගලිකව පරිහරණය කොට ඒ දක්වා ගෙවීමට තිබූ මුළු ණය හා පොලිය රු. 865,358 ක් කොමිෂන් සභාව වෙත පියවා රු. 2,100,000 ක වාහන ණය මුදලක් නැවත ලබාගෙන තිබුණි.<br><br>වාහන ණය මුදලක් ලබාගත හැක්කේ වසර 05 කට වරක් පමණක් වන නමුත් මෙම නිලධාරියා 2011 වර්ෂයේදී ලබාගත් ණය මුදල 2013 වර්ෂයේදී පියවා, 2013 ජුලි මාසයේදී රු. 2,260,000 ක ණය මුදලක් නැවත ලබාගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------------------------<br>මුදල් රෙගුලාසි 757(2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයේ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වත්කම් සමීක්ෂණයක් සිදුකර එම වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1990 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය | රාජ්‍ය සංස්ථා, රජයේ ආයතන, වෙළඳ ව්‍යාපාර සහ මහජන සමාගම්වල සියළු නෛතික වැඩ කටයුතු සම්බන්ධයෙන් සේවාවන් නීතිපතිවරයා විසින් ඉටුකළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණද එක් අවස්ථාවකදී කොමිෂන් සභාව එසේ කටයුතු නොකොට පෞද්ගලික ආයතනයක් නීති ආයතනය ලෙස තෝරාගෙන ඒ වෙනුවෙන් 2013 සැප්තැම්බර් 13 දින වනවිට රු. 242,130 ක් ගෙවීම්කර තිබුණි. |
| (ඉ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2007 ජූනි 12 දිනැති හා අංක 15/2007 දරන චක්‍රලේඛය | වාහන ණය ගෙවීම වානිජ බැංකු හරහා සිදුකළ යුතු බව දන්වා ඇතත් කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 14 දිනැති අංක TRC/04/12 දරන චක්‍රලේඛය පාදක කරගෙන කොමිෂන් සභාවේ මුදල්වලින් වාහන ණය ගෙවීම කර තිබුණි. |
| (ඊ) (i) 2007 ජූනි 12 දිනැති හා අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.2 (ආ) අනුව හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 7.4.1 උප වගන්තිය | වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය පිළිබඳව මහා භාණ්ඩාගාරයෙන් විමසීම නොකොට සියයට 4.2 ක වාර්ෂික පොලියක් පමණක් කොමිෂන් සභාව විසින් අයකරගෙන තිබුණි. |

(ii) 1998 මාර්තු 18 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

වෙළඳපොලේ පවතින පොලී අනුපාතය අනුව ණය සඳහා පොලී අයකර ගත යුතු අතර අඩුවෙන් අයකර ගෙන ඇති පොලී මුදල් ගණනය කර කොමිෂන් සභා ගිණුම්වලට ගත යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඇ) 1999 ජනවාරි 06 දිනැති අංක 81 දරන ජාතික අයවැය චක්‍රලේඛය

සමාලෝචිත වර්ෂයේදී කොමිෂන් සභාව විසින් රු. 39,800,000 ක් වැය කොට ජීප් රථ 02 ක් මිලදී ගැනීමේදී භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

i. 4.1.1 වගන්තිය

මිලදී ගැනීම් සිදුකිරීම සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පැවතිය යුතුයි යන්න දක්වා ඇතත් දත්ත ගබඩා කිරීමේ යන්ත්‍ර 05 ක්, ආරක්ෂිත මෘදුකාංගයක්, දත්ත ගබඩා කිරීමේ රාක්කයක් හා LCD මොනිටර් 02 ක් මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. මෙම ගනුදෙනුවේ ප්‍රසම්පාදන කටයුතු 2012 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණද එසේ කිරීමට නොහැකිවීම නිසා 2013 වර්ෂයේදී මිලදී ගැනීම සිදුකර අළුත්වැඩියාකිරීම හා නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

ii. 8.9.1 (අ) වගන්තිය

භාණ්ඩ සැපයීමේදී රු. 500,000 ට වැඩි මිලදී ගැනීම් සඳහා අදාල සැපයුම් සමාගම සමග ගිවිසුමකට එළඹිය යුතු වුවද , දත්ත ගබඩා කිරීමේ යන්ත්‍ර 05 රු. 3,478,013 කටද ආරක්ෂිත මෘදුකාංගය රු. 841,574 කට මිලදී ගැනීමේදී එසේ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. මේ නිසා කාල ප්‍රමාදයක් සහිතව උපකරණ සපයා තිබුණද සැපයීම ප්‍රමාදයන් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

| | |
|---|---|
| iii. 3.5 වගන්තිය | ජීප් රථ 02 ක් මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබුණි. |
| iv. 2.8 හා 3.3 වගන්ති | ශාරීරික සුවතා මධ්‍යස්ථානය සඳහා රු. 5,115,465 කට උපකරණ මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණ අතර මිලදී ගැනීම සඳහා ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවීම් කර නොතිබුණි. |
| (එ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2011 දෙසැම්බර් 30 දිනැති අංක බීඩී/සීපීබී/1/1/2012 හි 04 ඡේදය | සේවකයකු සඳහා ගෙවිය හැකි සමස්ථ ආපදා ණය ප්‍රමාණය රුපියල් දෙලක්ෂ පනස් දහසක උපරිමයකට සීමා කළ යුතු වුවත් අවස්ථා 13 ක දී එම සීමාව ඉක්මවා රු.1,890,040 ක් ගෙවා තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2007 ජුනි 13 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියෙන් පැහැදිලිව දක්වා තිබුණු පරිදි අදාල ආයතනය විසින් තම සේවකයන් වෙනුවෙන් නිවාස කුලී දීමනා ලෙස වැටුපෙන් සියයට 10 ක් ගෙවීම සඳහා නිර්දේශය ලබාදී නොතිබියදීත්, එම විධිවිධානවලට පටහැනිව කොමිෂන් සභාව විසින් එහි සේවකයින් වෙනුවෙන් නිවාස කුලී දීමනා වශයෙන් රු. 7,555,959 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ සේවකයින් බැංකුවෙන් ලබාගත් නිවාස ණය සඳහා වූ පොලියෙන් 2/3 ක් වූ රු. 3,486,312 ක් 2013 වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39, 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE/05 හා 1994 ජුනි 04 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 ට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා නිවාස ණය හා

8

අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුව කාර්යය මණ්ඩලය වෙත කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) 2012 වර්ෂයේ පැමිණීමේ දීමනාව ලෙස රු. 3,341,995 ක්

(ii) සමාලෝචිත වර්ෂයේ දුරකථන දීමනාව ලෙස රු. 1,763,533 ක්

(iii) ජීඑස්ආර් ව්‍යාපෘතියෙහි රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් නිලධාරීන් 32 දෙනෙකු සඳහා රු. 547,500 ක්

(iv) 2012 වර්ෂයේ ප්‍රසාද දීමනාව ලෙස රු. 4,103,890 ක්

(ඇ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2007 ජූනි 01 දිනැති හා අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ලිපියේ සඳහන් කරුණුවලට පටහැනිව කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) ඉහත ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය සඳහා රු. 2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද මාසිකව රු. 6,000 බැගින් ප්‍රවාහන දීමනාවක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා අනුමැතියෙන් තොරව රු.5,328,000 ක් ගෙවීම.

(ii) තවද ඉහත ලිපියෙන් කොමිෂන් සභා නිලධාරීන්ගේ මාසික ඉන්ධන වියදම් දීමනාව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකුට රු.5,000 ක් හා සහකාර අධ්‍යක්ෂවරයෙකුට රු. 3,500 කට සීමාකර තිබුණද එම සීමා නොසලකා නියෝජ්‍ය අධ්‍යක්ෂක හා සහකාර අධ්‍යක්ෂකවරුන් සඳහා මාසික ඉන්ධන දීමනා ලෙස පිළිවෙලින් රු. 17,000 හා රු. 15,500 ක් බැගින් ඉන්ධන දීමනා ගෙවීම් කර තිබුණි. ඒ අනුව අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.2,268,000 ක් ගෙවීම.

(ඈ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි සඳහන් පරිදි 2009 මාර්තු 18 දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව 2013 අගෝස්තු 15 දිනැති කොමිෂන් සභා තීරණය අනුව සේවක කාණ්ඩවලට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වැටුප්තල සංශෝධනය කර ඉහළ වැටුප් ක්‍රමයක් සකස්කර වැටුප් ගෙවීම කර තිබුණි. මෙය ජාතික වැටුප් ප්‍රතිපත්තියට පටහැනි වන අතර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් ඒ ඒ වැටුප් කාණ්ඩවලට අනුමත කර ඇති වැටුප්තල පරිමාණයන් අභිබවා යාමකි. සමාලෝචිත වර්ෂයට අදාළව වැඩිපුර ගෙවා ඇති වැටුප් ප්‍රමාණය රු. 18,284,450 ක් විය.

(ඊ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකුගේ වැටුප් තීරණය කිරීමේදී 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 හි විධිවිධාන සැලකිල්ලට ගෙන නොතිබුණි.

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු. 47,367,276,561 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 37,684,009,841 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු. 9,683,266,720 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවෙහි ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැළකිය යුතු විචලනයන් පහත පරිදි නිරීක්ෂණය විය.

| විස්තරය | 2013.12.31 | 2012.12.31 | වෙනස | වෙනසයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| **ආදායම්** | | | | |
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 2,060,743,487 | 1,418,317,869 | 642,425,618 | 45.3 |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | 8,226,962,705 | 6,532,360,699 | 1,694,602,006 | 26 |
| සංඛ්‍යාත ගාස්තු ඉදිරි ගෙවීම | 5,661,038,940 | 367,346,939 | 5,293,692,001 | 1441.1 |
| රැහැන් රහිත දුරකථන ගාස්තු | 24,910,893 | 20,054,795 | 4,856,098 | 24.2 |
| විවිධ ආදායම් | 1,991,028,937 | 826,946,847 | 1,164,082,090 | 140.77 |
| මුළු ආදායම | 49,202,055,538 | 38,603,814,047 | 10,598,241,491 | 27.45 |

10

| | | | | |
|---|---|---|---|---|
| වියදම් | | | | |
| ------- | | | | |
| නියාමන වියදම් | 870,579,295 | 272,988,566 | 597,590,729 | 219 |
| බොල් ණය | 83,367,539 | 5,783,816 | 77,583,723 | 1341.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 421,995,689 | 227,945,588 | 194,050,101 | 85.1 |
| මුළු වියදම | 1,834,778,977 | 919,804,206 | 914,974,771 | 99.3 |
| වර්ෂයේ බදු පෙර මෙහෙයුම් ලාභය | 47,367,276,561 | 37,684,009,841 | 9,683,266,720 | 25.7 |

04. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

4.1 කාර්ය සාධනය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් සංඛ්‍යාත භාවිතය විධිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී සංඛ්‍යාත දෝෂ සම්බන්ධ මහජන පැමිණිලි 45 ක් ලැබී තිබුණි.

(ආ) සංඛ්‍යාත භාවිතා කිරීම සඳහා යොදාගන්නා උපකරණ වැඩසටහන්ගත කිරීමට (Programe) පෞද්ගලික ආයතන වෙත අවස්ථාව සලසා තිබුණි. මෙම හේතුවෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබා දී ඇති බලය (Power) ඉක්මවා වඩා වැඩිපුර භාවිතා කිරීමට හැකියාව ඇතිවනවා මෙන්ම ඉඩදී ඇති අවස්ථාවන්ට වැඩියෙන් තමන්ට අවශ්‍ය පරිදි වැඩිපුර උපකරණ සංඛ්‍යාවක් වැඩසටහන් ගතකර ගත හැකි බව නිරීක්ෂණය විය. එම අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කොමිෂන් සභාව මැදිහත් වී නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇතැම් ආයතන සිය විගණිත අවසාන ගිණුම් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් කොමිෂන් සභාව වෙත ලැබිය යුතු මුදල් කොපමණද යන්න නිශ්චිතව තහවුරු කරගැනීමට ප්‍රමාද වී තිබුණි.

(ආ) 2010 දෙසැම්බර් 27 දිනැති 1986/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව 2011 ජනවාරි 01 දින සිට විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් සෙස් බදු ගෙවිය යුතු වුවද, ආයතන 5 ක 2014 අප්‍රේල් 25 දින වනවිට හිඟව පැවති මුළු සෙස් බදු මුදල රු. 50,876,397 ක් විය. සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයක් කොමිෂන් සභාව විසින් සකස් කර නොතිබීම හේතුවෙන් විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් අයකරන ලද සෙස් බදු මුදල් කොමිෂන් සභාව වෙත ගෙවීම පැහැර හැර තිබුණි. සෑම බලපත්‍රලාභියෙකුටම අදාල වන පරිදි නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයක් විදුලි සංදේශ පනතට ඇතුළත් කිරීමට කටයුතු කරන බව 2011 ජුනි 28 දින හා 2012 ජුනි 16 දිනයන්හි මා වෙත දන්වා ඇතත් මෙතෙක් එපරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් සංඛ්‍යාත ගාස්තු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවන්හිදී දඩ මුදල් අයකර ගැනීම හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිසි ක්‍රියා පිළිවෙතක් හඳුන්වා දී නොතිබුණි. 2013 වර්ෂයේ නිකුත් කරන ලද ඉන්වොයිස් අතරින් රු.4,133,666 වටිනා ඉන්වොයිස් සඳහා 2014 වර්ෂයේ අප්‍රේල් 29 දින වන විටත් ගෙවීම් කර නොතිබුණි. තවද අදාල ආයතන වෙත ඉන්වොයිස් නිකුත් කිරීමේ කාල ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් පසුගිය වර්ෂවලට අදාලව අයවිය යුතුව පැවති රු. 130,544,231 ක ආදායම් සඳහා ප්‍රවර්තන වර්ෂයේදී ඉන්වොයිස් නිකුත් කර තිබුණි.

(ඈ) රේඩියෝ සංඛ්‍යාත ගාස්තු පැහැර හැරීම සම්බන්ධයෙන් අතිරේක දඩ මුදලක් අයකර ගැනීමට විදුලි සංදේශ පනත මගින් කොමිෂන් සභාවට බලයක් ලැබී නොමැති හෙයින් ඒ පිළිබඳව නීතිමය බලය ලබාගැනීම සඳහා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 1991 අංක 25 දරන හා 1996 අංක 27 දරන සංශෝධිත ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(1) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කරන ලද බලපත්‍රයක් යටතේ හැර කිසියම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් පාවිච්චි නොකළ යුතුය. කෙසේ වුවද එක් සමාගමක් බලපත්‍රයක් රහිතව සංඛ්‍යාත පාවිච්චි කර තිබුණද එයට එරෙහිව කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත අනුව විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් සියයට 20 ක් වූ විදුලි සංදේශ බදු එකතුකර පසු මාසයේ 15 දිනට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වුවද ආයතන 02 විසින් එපරිදි ගෙවීමට කටයුතු කර නොතිබුණි.

12

(ඇ) 2012 වර්ෂය සඳහා විදුලි සංදේශ බදු ගෙවන ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද ගිණුම් වාර්තා විගණකවරුන් විසින් සහතික කර නොතිබුණ අතර ආයතන 02ක් විසින් 2012 වර්ෂය සඳහා අවසාන ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. කොමිෂන් සභාව විසින් එම අවසන් ගිණුම ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම වර්ෂයට අදාල බදු මුදලේ නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ඈ) මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අළුත්කිරීම කළයුතු දිනය පසුවී වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණද සන්නිවේදන ක්‍රියාකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. මිලියන 101 ක් වූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධනවලට අනුව උපයනවිට ගෙවීම මත බදු අදාල නිලධාරීන්ගෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළයුතු වුවද, නිලධාරීන්ගෙන් අඩුකර ගැනීමකින් තොරව එකතුව රු. 3,512,759 ක උපයන විට බදු කොමිෂන් සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි.

4.3 මත භේදයට තුඩුදෙන ගනුදෙනු
----------------------------------

සමාලෝචිත වර්ෂයේ කාර්යය මණ්ඩල නිලධාරීන්ගේ පවුල්වල සුහද හමුව හා චාරිකාවක් සඳහා නවාතැන් හා ආහාරපාන වෙනුවෙන් රු. 5,091,903 ක වියදමක් කොමිෂන් සභාව විසින් දරා තිබුණි.

4.4 අරමුදල් ඌන උපයෝජනය
---------------------------------

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2003 වර්ෂයේ ඉතිරි කිරීමේ බැංකු ගිණුමක තැන්පත් කරන ලද ඇමරිකන් ඩොලර් 420,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇමරිකන් ඩොලර් 532,111.45 ක් හෙවත් රු. 69,605,498.77 දක්වා වර්ධනය වී ඇතත් එම මුදල් පසුගිය වසර 10 ½ ඇතුළත කිසිදු උපයෝජනයකින් තොරව පවත්වා තිබුණි.

4.5 හඳුනාගන්නා ලද පාඩු
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාර අරමුදලෙහි තැන්පත් කර තිබුණු මුදලින් රු. 8,000,000,000 ක මුදලක් කල්පිරීමට පෙර මහා භාණ්ඩාගාරය විසින් පවරාගැනීම නිසා ඉතිරි ආයෝජන මුදල වූ රු. 285,642,376 ක් හා රු. 325,812,879 ක් ලැබිය යුතු ලාභාංශ ආදායම අහිමි වී තිබුණි.

(ආ) 2012 පෙබරවාරි 29 දිනය දක්වා කොමිෂන් සභාව සතු වාහනයක් අමාත්‍යවරයකු විසින් පාවිච්චි කර තිබූ අතර එම කාලය තුලදී සිදුවූ රිය අනතුරකින් අලාභානි සිදුවී තිබුණි. වාහනය අළුත්වැඩියාව සඳහා රු. 625,409 ක මුදලක් කොමිෂන් සභාව විසින් දරා තිබුණද රු. 452,377 ක් පමණක් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූරණය කිරීම හේතුවෙන් කොමිෂන් සභාවට රු. 173,031 ක අලාභයක් සිදුවී තිබුණි. මෙම අලාභය ඊට වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි

4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-------------------------------------

නෙළුම් කුළුණ - බහු සම්ප්‍රේෂණ රූපවාහිනී සහ විදුලි සංදේශ කුළුණ ඉදිකිරීම

-------------------------------------------------------------------------------------

(අ) මෙම ඉදිකිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වීන සමාගමක් වෙත ලබාදී තිබුණද එම සමාගමේ ව්‍යාපාර බලපත්‍රයට අනුව සමාගමේ ව්‍යාපාරික විෂය පථයට බහු සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම හෝ විශාල පරිමාණයේ කොන්ත්‍රාත්තු ඉදිකිරීම් ඇතුළත් වී නොතිබුණි.

(ආ) ඉදිකිරීම් සිදුකරන කාල වකවානු හා ඊට අදාල නිමකළ යුතු වැඩ කොටස් දැක්වෙන Criticle Path ඉදිරිපත් කර තිබුණද ගතවී තිබූ මාස 17 ට අදාලව ඉදිකිරීම් ප්‍රගතිය භෞතික හා මූල්‍ය වශයෙන් ඉදිරිපත් කිරීමට කළමනාකරණය අපොහොසත් විය. ගිවිසුමට අනුව කොන්ත්‍රාත්තුව දින 912 කින් නිම කළ යුතු බැවින් අපේක්ෂිත පරිදි නිමකළ යුතු දිනට කාර්යය නිමකිරීමට ඇති හැකියාව පරීක්ෂා කර බැලීමට නොහැකි විය.

(ඇ) වැඩ නිම කළ යුතු කාලය සියයට 55 කට වඩා ගතවී තිබුණද මෙකී කාලය තුල කොන්ත්‍රාත් පිරිවැයට වන වෙනස්වීම පිළිබඳව වාර්තාවක් උපදේශක සමාගම සකසා නොතිබුණි.

(ඈ) ගිවිසුම ප්‍රකාරව යටහත් 'සී' හි සඳහන් පරිදි ගිවිසුම අත්සන් කොට මාස 05 ක් ඇතුළත විස්තරාත්මක ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර තිබිය යුතු වුවත් මාස 17 ක් ගතවී තිබුණද එවැනි විස්තරාත්මක ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර නොතිබුණි.

4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

--------------------------------------------------------------------------

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් ලෙස සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාල ඉඩම සඳහා දැනට වැයකර ඇති පිරිවැය පමණක් අයකර ගැනීමේ පදනම මත, එම ඉඩම එකී අධිකාරිය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා දිය යුතු බවට 2011 දෙසැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එයට පටහැනිව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩමට වැයකර ඇති පිරිවැය ගණනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයේදී නාගරික සංවර්ධන අධිකාරියට රු. මිලියන 1,800 ක් ගෙවා තිබුණු අතර තවත් රු. මිලියන 9,900 ක් ගෙවීමට එකඟ වී තිබුණි.

14

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 290 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 207 ක් පමණක් විය. කොන්ත්‍රාත් පදනම මත හා ද්වීතියන පදනම මත සේවකයන් 29 ක් කාර්යය මණ්ඩල සඳහා බඳවාගෙන තිබුණද, ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. විස්තර පහතින් දැක්වේ.

| සේවක වර්ගය | 2013.12.31 දිනට සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | අතිරික්ත තනතුරු |
|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | | |
| විධායක/ මාණ්ඩලික ශ්‍රේණි | 62 | 28 | 34 | - |
| සහයක | 182 | 109 | 73 | - |
| සුළු සේවක | 46 | 41 | 05 | - |
| ද්වීතියන පදනම මත | - | 02 | - | 02 |
| කොන්ත්‍රාත් පදනම මත | - | 27 | - | 27 |
| | 290 | 207 | 112 | 29 |

4.9 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නෙළුම් කුළුණ ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් අධීක්ෂණ නිලධාරී වෙනුවෙන් මසකට රු. 80,000 ක මුදලකට කුලී පදනම මත ලබාගෙන තිබූ වාහන සඳහා 2004 අගෝස්තු 31 දිනැති අංක 353/(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව දෛනික ධාවන සටහන් ලියා නොතිබුණි.

(ආ) ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාල වාහනය සේවයට යොදවා ගැනීම පිළිබඳව හා ධාවනය කල කි.මී. ප්‍රමාණය, ධාවනය කළ දින ගණන යනාදිය තහවුරු කිරීමට නොහැකි වීමෙන් මෙම වාහනය කුලියට ගැනීමේ යෝග්‍යතාවය තහවුරු කිරීමට නොහැකි විය.

05. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009- 2013 වර්ෂ සඳහා සකස් කර තිබූ සංයුක්ත සැලැස්ම සංශෝධනය කර නොමැති අතර දැනට පවතින සංයුක්ත සැලැස්මෙහි මානව සම්පත් පරිපාලනය, මූල්‍ය හා සැපයුම් යන අංශයන්හි ප්‍රතිපත්ති ක්‍රමවේදයන් කවරේද යන්න හා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු කවරේද, එම කටයුතු කවුරුන් වෙනුවෙන් කුමන කාලයක කෙසේ එය සිදු කෙරේද යන්න ඇතුළත්ව නොතිබුණි. පසුගිය වසර 03 ක මෙහෙයුම් කටයුතු සමාලෝචනය කර එහි අන්තර්ගත කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මක් හා අයවැය ලේඛනය අතර සම්බන්ධයන් ගොඩනැගෙන අයුරින් කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීමට හැකිවන අයුරින් යථෝක්ත සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) 2000-2001 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සැකසීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත රු. 22,231,205 ක මුදලක් ගෙවා තිබුණද පිළිගත හැකි ආකාරයකට සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. මෙ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනයක් පවත්වන බව දක්වා තිබුණත් එහි ප්‍රගතියක් නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

වර්ෂය ආරම්භවීමට ප්‍රථම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සකසන ලද ඉලක්කයන් ලඟාකර ගැනීමට කටයුතු කිරීම හා නිශ්චිත කාල වකවානුවක් තුළ කොතෙක් දුරට සැලසුම් ගත ඉලක්කයන් ලඟාකර ගත්තාද යන්න සලකා බැලිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් සකසා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ප්‍රසම්පාදනය සැලසුම් සහගත අයුරින් සිදු නොකිරීම හේතුවෙන් එය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

16

5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද අයවැය පුරෝකථනයන් තත්‍ය අගයන් සමග සැසඳීමේදී බොහෝ විචලනයන්ගෙන් යුක්ත බව නිරීක්ෂණය විය. එම විචලනය සියයට 4 සිට සියයට 124 දක්වා පරාසයක් තුළ විහිදී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් නිවැරදි අයුරින් පුරෝකථනය සිදුවී නොතිබූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය කරනු ලැබේ.

5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ මෙතෙක් සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණයන් මුදල් පනතේ 13(7)ඒ වගන්තිය ප්‍රකාරව මාගේ විස්තරාත්මක වාර්තාව මගින් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය

(ආ) සංයුක්ත සැලැස්ම

(ඇ) ණයගැතියෝ

(ඈ) ආයෝජන

(ඉ) ප්‍රසම්පාදන

(ඊ) දීමනා ගෙවීම

(උ) කොන්ත්‍රාත් පාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

# සටහන්

www.trc.gov.lk | dgtsl@trc.gov.lk

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

276 ඇල්විටිගල මාවත කොළඹ 8 ශ්‍රී ලංකාව
**දු:** +9411 2689345/ 2689351/ 2689352 **ෆැ:** +9411 2689341